# වාර්ෂික වාර්තාව - 2016
# வருடாந்திர அறிக்கை - 2016
# ANNUAL REPORT - 2016

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சு
MINISTRY OF IRRIGATION & WATER RESOURCES MANAGEMENT

## ජල සම්පත් මණ්ඩලය
## நீர் வளச் சபை
## WATER RESOURCES BOARD

# වාර්ෂික වාර්තාව
# 2016

ජල සම්පත් මණ්ඩලය
නො . 2 ඒ හෙක්ටර් කොබ්බෑකඩුව මාවත
කොළඹ - 07
www.wrb.gov.lk

පාලන වාර්ථාව - 2016
ජල සම්පත් මණ්ඩලය

## 1. හැඳින්වීම

1964 අංක 29 දරණ ජල සම්පත් පනත යටතේ 1966 දී ස්ථාපිත කරන ලද ජල සම්පත් මණ්ඩලය ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමණාකෙරණය හා ඵලදායී අයුරින් උපයෝගී කරගැනීම ආදී සියළු කරුනු පිළිබඳව විශය භාර අමාත්‍යවරයාට උපදෙස් දෙන ආයතනයක් වශයෙන් පැවතිණි.

1978 දී වාරිමාර්ග දෙපාර්ථමේන්තුවේ භූජල අංශය ජල සම්පත් මණ්ඩලයට අනුයුක්ත කරන ලද බැවින් මණ්ඩලයේ කාර්යයන් ප්‍රසාරණය වී ක්‍රියාත්මක විය. උපදේශක සේවාවක්ව පැවති ජල සම්පත් මණ්ඩලය වාණිජමය කාර්යයන් හි නියැලීමට හැකිවන පරිදි හා ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පතට අදාල කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමට ජල සම්පත් මණ්ඩලයට බලය පවරාදීම සඳහා ජල සම්පත් මණ්ඩල පනත 1999 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර සංශෝධනය කරන ලදි.

## 2. දැක්ම

පිරිසිදු හා ආරක්ෂිත ජලය සැමට ප්‍රමාණවත් පරිදි ලබාදීම ජල සම්පත් මණ්ඩලයේ දැක්ම වේ.

## 3. මෙහෙවර

පොදු මහජනතාව, අදාල රාජ්‍ය දෙපාර්ථමේන්තු / අධිකාරී / ආයතන / ජාතික හා ජාත්‍යන්තර සංවිධාන හා දේශිය මෙන්ම විදේශිය විශේෂඥ සහ වෘතීයවේදී කණ්ඩායම් සමග සමීප සම්බන්ධතාවයක් ඇතිකර ගනිමින් ශ්‍රී ලංකාවේ භූ ගත ජල සම්පත තක්සේරු කිරීම, ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්දයෙන් රජයට හා ජනතාවට උපදෙස් ලබා දීම ජල සම්පත් මණ්ඩලයේ මෙහෙවර වේ.

## 4. අරමුණු

i. භූගත ජල සම්පත් තක්සේරු කිරීම හා සංවර්ධනය සඳහා වූ පර්යේෂණ සිදු කිරීම.
ii. භූගත ජල සම්පත් පිළිබඳ වූ විද්‍යාත්මක දත්තයන් එක්රැස් කිරීම.
iii. භූගත ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කිරීම.
iv. භූගත ජල සම්පත් පරිහරණය පිළිබඳ වූ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
v. භූගත ජල සම්පත් ව්‍යාපෘති ඇගයීම.
vi. වෙනත් ආයතන හා සම්බන්ද වී මණ්ඩලයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

## 5. කාර්යයන්

i. ශ්‍රී ලංකාවේ ජල සම්පත් පිළිබඳව පර්යේෂණ කිරීම.
ii. භූගත ජල සම්පත් සංවර්ධනය සඳහා පවත්න දත්තයන් හි භූ විද්‍යාත්මක අදහස් දැක්වීම
iii. භූගත ජල සම්පත් ගවේශණය පිනිස භූජල විද්‍යාත්මක සමීක්ෂණ සිදුකිරීම.
iv. භූ ගත ජල විභවයන් පවතින ස්ථාන හදුනා ගැනීම.

v. භූ ගත ජල මුලාශ්‍ර පවතින ස්ථාන එවායේ විභවයන් හා ගුණාත්මක බව විද්‍යාත්මක ලෙස නීර්ණය කිරීම
vi. භූගත ජල සම්පත් සංවර්ධනය කිරීම සදහා ශාක්‍යතා අධ්‍යනයන් සිදු කිරීම.
vii. රසායනික හා භෞතික ලක්ෂණ හදුනාගැනීම සදහා මෙන්ම ක්ෂුද්‍ර ජීවී සහ බැර ලෝහ සදහා ද ජල නියැදියන් විශ්ලේෂණය කිරීම.
viii. භූ ජල දත්ත එක්රැස් කිරීම භූ ගත ජල දත්ත රැස්කර පවත්වාගෙන යාම සහ භූජල සිතියම් පිලියෙල කිරීම.

## 6. අධ්‍යක්ෂක මණ්ඩලය

| | | | | |
|---|---|---|---|---|
| i | අශෝක පෙරේරා මහතා | - | සභාපති | (2015.02.10 සිට 2015.04.09) |
| iv | එම්.ජී. සුනිල් මහතා | - | අධ්‍යක්ෂක | (2015.02.10 සිට 2015.04.09) |
| v | එන්.ආර්. සූරියආරච්චි මහතා | - | අධ්‍යක්ෂක | (2015.02.10 සිට 2015.04.09) |
| vi | ඩී.ඩී. ආරියරත්න මහතා | - | අධ්‍යක්ෂක | (2015.02.10 සිට 2015.04.09) |

| | | | | |
|---|---|---|---|---|
| i | ඒ.සී.එම් සුල්ෆිකාර් මහතා | - | සභාපති | (2015.04.09) |
| ii | එස්.පී වික්‍රමආරච්චි මහතා | - | ක්‍රියාකාරී අධ්‍යක්ෂක | (2015.04.09) |
| iii | එම්.එස්. සතිශ් කුමාර මහතා | - | අධ්‍යක්ෂක | (2015.04.09) |
| iv | ජේ.කේ.එන්. සමන්මලී මහත්මිය | - | මහා භාණ්ඩාගාර නියෝජිත | (2015.03.20) |
| v | ආර්.එම්.සී. රත්නායක මහතා | - | අධ්‍යක්ෂක | (2015.04.09) |
| vi | ටී.එච්. අශෝක ද මෙල් මහතා | - | අධ්‍යක්ෂක | (2015.12.01) |

අධ්‍යක්ෂක මණ්ඩලය

සමාලොචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් 5ක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

### 6.1. විගනන හා කළමණාකරන කමිටුව

| | | | |
|---|---|---|---|
| i | ජේ.කේ.එන්. සමන්මලී මහත්මිය | - සභාපති | - භාණ්ඩාගාර නියෝජිත |
| ii | එස්.පී. වික්‍රමාරච්චි මහතා | - සාමාජික | - ක්‍රියාකාරී අධ්‍යක්ෂක |
| iii | ටී.ඩබ්.එම්.පී.අයි. ඉංදික බන්ඩාර මහතා | - සාමාජික | - අධ්‍යක්ෂක |
| iv | ආර්.එම්.සී රත්නායක මහතා | - සාමාජික | - අධ්‍යක්ෂක |
| **v** | ටී.එච්. අෂෝක ද මෙල් මහතා | - සාමාජික | - අධ්‍යක්ෂක |
| vi | ආර්.එස්. විජේසෙකර මහතා | - ලේකම් | - සාමාන්‍යාධිකාරී |

### 6.1.1. විගනන හා කළමණාකරන කමිටු රැස්වීම්

2016 වර්ෂය තුලදී විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් හතරක් (4) පවත්වන ලදි.

### 6.2. ජ්‍යේෂ්ඨ විධායක නිලධාරීන් – 2016 වර්ෂය

i. ආර්.එස්. විජේසේකර මහතා - සාමාන්‍යාධිකාරී
**ii.** ජී.ආර්.ආර්. කරුනාරත්න මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(පර්. හා සං) (2014.01.01 සිට)
iii. පී.පී.එස්.ආර්.කේ. පතිරණ මහතා- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (2015.12.01 සිට)
iv. ඒ.බී.එම් චන්ද්‍රසිරි මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
v. එම්.ජේ දේශප්‍රිය මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (ඉන්ජිනේරු)
vi එම්.ඒ. පුෂ්පකුමාර මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)
vii ආර්.එම්.එස්. රත්නායක මහතා - සහකාර සාමාන්‍යාධිකාරී (භූ ජල)

**7. 2016 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාවලිය**

**මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ ඵලදායීතා වාර්තාව - 2016**

මහවැලි සැලැස්මේ ප්‍රධාන අංගය වන මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය මගින් උතුර, උතුරු මැද, නැගෙනහිර, බටහිර, පළාත්වල පවතින ජලය හිග වගා භූමි (හෙක්ටයාර් 82000) කෘෂිකර්ම සංවර්ධනය සඳහා වාරිමාර්ග පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය මගින් මෙ.වො. 25ක ජල විදුලි බලයක් ජාතික ජල විදුලි සැපයුමට ලබා දීමට නියමිතය. එමෙන්ම මිරිදිය මත්ස්‍ය වගාව දියුණු කිරීම, පානීය ජලය හා කාර්මික ජල අවශ්‍යතා සපුරා දීම, පාරිසරික සංචාරක ව්‍යාපෘතිය හා ප්‍රබල ජල ගැලීම් පාලනය කිරීම මෙම ව්‍යපෘතියේ අනෙකුත් අරමුණු වේ.




3D Model of the Moragahakanda Kaluganga Development Area

මොරගහකන්ද කළුගග ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකතුමාගේ ඉල්ලීම පරිදි ගැඹුරු නල ළිං හඳුනා ගැනීම හා ඉදිකිරීම හා සඳහා වගා ළිං වැඩසටහන්, අත්පොම්ප නල ළිං වැඩසටහන්, තෝර පිටිය, මා ඔය, ලේල් ඔය, යන 1,2,3 කුඩාගම ආශ්‍රිතව ආරම්භ කරන ලදි. මෙම ප්‍රදේශයේ ජීවත්වන පවුල් වලට වගා කටයුතු සඳහා මොරගහකන්ද කළුගග ව්‍යාපෘතියෙන් ජලය බෙදා හරින තෙක් භූගත ජලය සැපයීම මෙම ළිං ඉදිකිරීමට මූලික අරමුණු විය.

මහවැලි අධිකාරිය මගින් ලබා දුන් ඉඩම් වල නල ළිං ඉදිකිරීමට සැලසුම් කල අතර එම ඉඩම් වාසස්ථාන සඳහා නුසුදුසු ඉඩම් විය.

මේ සඳහා භූගත ජලය වැඩි වශයෙන් ඇතැයි හඳුනාගත හැකි, පවතින ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක සමීක්ෂණයක් සිදු කරන ලදි.

නල ළිං ඉදිකිරීමෙන් පසු මෙම ස්ථානවලින් ලබාගත හැකි ජල ප්‍රමාණය ආරක්ෂිත ජල ධාරිතා නිර්නය කිරීමේ පරීක්ෂණයක් මගින් තක්සේරු කල යුතුය.

## 7.1 ප්‍රතිරොධකතා පරීක්ෂණ ක්‍රමවේදය

භූ භෞතික විද්‍යාත්මක පරීක්ෂණය සිදු කිරීමේදී භූගත ජල ගවේෂණය සඳහා ක්‍රමයක් වන ප්‍රතිරොධකතා පරීක්ෂණ ක්‍රමය යොදාගන්නා ලදි. එහි ප්‍රදාන අරමුණ වන්නේ පෘෂ්ඨයේ පවතින විද්‍යාත්මක තත්ව වන දුර්වල කලාප, මතුපිට පාංශු ස්ථරය, ජීර්ණය වූ පාෂාණ නිරීක්ෂණය හා භූගත ජලයේ ගුණාත්මක භාවය ගැඹුර අනුව වෙනස් වීම නිර්නය කිරීම වේ. මෙහිදී උප පෘෂ්ඨයේ පවතින දෘෂ්‍ය ප්‍රතිරොධකතා අගයන් ලබා ගැනීම සඳහා "Schlumberger" විද්‍යුත් රූපණයට අනුව "ABEM-1000" උපකරණය භාවිතා කරන ලදී.





භූ සමීක්ෂන





නල ළිං ඉදිකිරීම ජල ධාරිතා පරීක්ෂන (24 පැය)

## 7.2 භෞතික ඵලදායිතාවය

භූ භෞතික විද්‍යාත්මක සමීක්ෂන හා නල ළිං ඉදිකිරීම් ගනනාවක් මෙම වගා ළිං හා අත් පොම්ප ළිං ඉදිකිරීමේ වැඩසටහන යටතේ සිදු කෙරිණි. තවද මීට සමගාමීව අත් පොම්ප යෙදීමේ හා යකඩ ඉවත් කිරීමේ උපකරණයක් නල ළිං වලට සවි කිරීමේදී සිදු කෙරිණි. සම්පුර්ණ භෞතික ඵලදායීතාව පහත ආකාර වේ.

වගා ළිං වැඩසටහන

I. භූ භෞතික සමීක්ෂන : 20

II. නල ළිං ඉදිකිරීම : 13

අත් පොම්ප ළං වැඩසටහන්

I. භූ භෞතික සමීක්ෂණ : 26
II. නල ළිං ඉදිකිරීම් : 26
III. අත් පොම්ප ඉදිකිරීම් : 30
IV. යකඩ ඉවත් කිරීමේ යන්ත්‍ර සවි කිරීම : 11

## 7.3 මූල්‍ය ඵලදායීතාවය

මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගණනය කරන ලද ගිණුම් වාර්ථා පහත ආකාර වේ.

| ලි. ගො. අංකය | ඉන්වොයිස් අංකය: | මුදල (රු. ශත) |
|---|---|---|
| AGMO/MASL/MKDP/HPTW – 01 | 14963 | 300,000.00 |
| AGMO/MASL/MKDP/HPTW – 02 | 14964 | 100,000.00 |
| AGMO/MASL/MKDP/HPTW – 04 | 14965 | 801,500.00 |
| | 15089 | 600,000.00 |
| AGMO/MASL/MKDP/HPTW – 05 | 14966 | 2,063,089.85 |
| | 15083, 15086, 15087 | 1,163,596.85 |
| AGMO/MASL/MKDP/HPTW – 06 | 14967, 14968 | 3,180,704.44 |
| | 15085, 15088 | 930,000.00 |
| AGMO/MASL/MKDP/AGTW | 15060 | 862,397.96 |
| | 15030 | 2,258,744.27 |
| | 15084, 15091 | 1,475,043.82 |
| එකතුව | | **13,735,077.19** |

2016 වසරේ දී මොරගහකන්ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු. 13,735,077.19 ක් විය.

## 8. බස්නාහිර පලාත

2016 වර්ෂයේ බස්නාහිර පළාත තුල වානිජ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ | 72 |
| නල ළිං ඉදිකිරීම | 8 |
| ජල ධාරිතා පරීක්ෂන | 23 |
| නල ළිං සුද්ද කිරීම | 18 |
| ජල රසායණික විශ්ලේෂණය | 77 |
| ජල සාම්පලයේ ක්ෂුද්‍ර ජීවී පරීක්ෂාව | 19 |

## 9. උතුරු පළාත

භාන්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘත්.

**9.1** යාපනය ළිං නිමානය කිරීමේ ව්‍යාපෘතිය

9.2 ජල සම්පත් මණ්ඩලයේ උතුරු පලාත් කාර්යාලය මාරු කිරීම

2005 අප්‍රේල් මස සිට පෞද්ගලික ගොඩනැගිල්ලක කුලී පදනම මත 699, පේදුරුතුඩුව පාර, නල්ලූර්, යාපනය ලිපිනයේ පවත්වාගෙන ගිය උතුරු පළාත් කාර්යාලය හා පළාත් විද්‍යාගාරය යාපනය මහ වීදියේ පැරණි දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලේල් 2016 මැයි 19 වන දින ස්ථාපිත කරන ලදි. මෙම ගොඩනැගිල්ල වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍ය ගාමිණී විජිත් විජිතමුණි සොයිසා මැතිතුමා අතින් විවෘත කරන ලදි.




*රූපය 1: යාපනය කාර්යාලය විවෘත කිරීම*

## 9.3 ව්‍යාපෘති ප්‍රගතිය

### a.) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය. (DSWRPP-AF)

පසුගිය දශක තුන තුල සිදු වු කාර්මික සංවර්ධනය, අධික කෘෂි රසායනික භාවිතය, භූ ජලය අධික ලෙස භාවිතය හේතුකොට ගෙන ජල මට්ටම පහත බැසීම සහ ලවණතාවය අධික වීම ආදිය හෙතුකොට ජල දූෂනය අධික වී ශ්‍රී ලංකාවෙ භූගත ජල සම්පත තර්ජනයට ලකි වී ඇත. මෙවැනි භූගත ජල අපවිත්‍ර වීම සහ පාරිසරික හානි නැවත ප්‍රතිසංස්කරනණය කිරීම ඉතා අපහසු බැවින් පෙර හදුනාගැනීම් තුලින් ඒවාට ප්‍රතිකර්ම සිදු කිරීමට ක්‍රියාත්මක වීම වැදගත් වේ.

ඉහත තර්ජනයන් අවම කරලීම පිණිස අදාල විසදුම් සැලසුම් කිරීමට ශ්‍රී ලංකාවේ පවතින භූගත ජල සම්පත් වල ගුණාත්මක හා සමාණාත්මක බව පිළිබඳ කාලීන දත්ත ක්‍රමානුකූලව එක්රැස් කිරීමට අත්‍යාවශ්‍යවේ. ක්‍රමානුකූල සහ දිගුකාලීන භූගත ජල නියාමන ජාලයක් ස්ථාපිත කිරීමට පෙර භූගත ජල ධරයෙන් ප්‍රාදේශීයව පැතිරීම හා කාලානුරූප විචලනය වීම පිළිබදව මනා දැනුමක් ඇතිකර ගැනීම අතිශයින්ම වැදගත් වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ හදුනාගත් නියමු කලාප 7 සදහා බලපා ඇති තර්ජනයන් හා භූගත ජල සම්පත් වලට වී ඇති බලපෑම් හදුනා ගැනීමට සවිස්තරාත්මක අධ්‍යනයක් වෙලි ආරක්ෂන හා ජල සම්පත් සැලසුම්කරන ව්‍යාපෘතියේ අදියර 2ක යටතේ භූගත ජල නියාමන ජාලය (Ground water monitoring network) ස්ථාපිත කිරීම මගින් සිදු කෙරිණි. මෙහි හදුනාගත් නියමු කලාප 7 වන්නේ යාපනය දිස්ත්‍රික්කයේ තෝරාගත් කලාප කිහිපයක්, අනුරාධපුර, මාතලේ, පුත්තලම, ගම්පහ, අම්පාර හා බදුල්ල දිස්ත්‍රික්ක වේ.




*රූපය2: භූගත ජල නිමාන පද්ධතියේ අධ්‍යන ප්‍රදේශ*

දැනට සිදුකරන ලද අධ්‍යනයන් මගින් යාපනය ප්‍රදේශයේ කෝපායි, තිරුනාවේලි, නල්ලුර්, කයිතඩි කලාපවල ඉහල No3 මට්ටමක් හදුනාගත හැකි විය. මෙය ඉතාමත් තර්ජනාත්මක තත්වයක් වන අතර මෙම ව්‍යසන සහිත කලාප යාපනය පුරාම පැතිරීම මැඩපැවැත්වීම සදහා ඒකාකාර නියාමනයක් හා තත්වය පාලනය කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ.

ලවණජලයේ කාන්දු වීමක් පෙන්නුම් කරමින් මෙම ප්‍රදේශයේ කලපු මායිම් ආශ්‍රිතව විශේෂයෙන් කරවෙච්චි - චාවකච්චෙරි දිස්ත්‍රික්ක මායිම් ආශ්‍රිතව අධික ඛනිජ අන්තර්ගතයක් දක්නට ලැබුණි.




2013 වර්ෂයේ සිට භූගත ජලයේ ගුණාත්මකභාවය විචලනය අනාගත සැලසුම් හා ජල සම්පත් කළමණාකරනය සඳහා නිරීක්ෂණය කරන ලදි. 2016 වර්ෂයේ කරන ලද ක්‍රියාකාරකම් වල සාරාංශය පහත ආකාර වන අතර ක්‍රියාත්මක කිරීමට නියමිත අනෙකුත් ක්‍රියාකාරකම් සැලසුම් කළ ආකාරයට DSWRPP-AF ව්‍යාපෘතියේ ආකාරයට සිදු කිරීමට නියමිතය.

| අංකය | ක්‍රියාකරකම් | ප්‍රගතිය | විශේෂ කරුනු |
|---|---|---|---|
| 1 | යාපනය අර්ධද්වීපයේ පිහිටුවන ලද භූගත ජල පරීක්ෂණ ස් | 102 | වියලි කාලය - කාලය සමග ජලයේ ගුනාත්මක විචලනය වන ආකාරය හඳුනා ගැනීම සඳහා සිතියම් පිලියෙල කාරීම. |
| 2 | | 102 | තෙත් කාලය - කාලය සමග ජලයේ ගුනාත්මක විචලනය වන ආකාරය හඳුනා ගැනීම සඳහා සිතියම් පිලියෙල කාරීම. |
| 3 | ජල ධාරිතා පරීක්ෂණ | 05 | ජලධර ලක්ෂණ හඳුනා ගැනීමේ පරීක්ෂණ. |
| 4 | මුහුදු මට්ටමේ සිට උස නිර්ණය කිරීම | 32 | භූගත ජල ගැලීම් රටාව නිරීක්ෂනය කිරීම. |




*රූපය4: දිගු කාලීන ගුණාත්මක වෙනස් වීම් අධ්‍යනය සඳහා පිහිටුවන ලද නිමාන ප්‍රදේශ*




*රූපය5: 2016 වර්ෂයේ මෝසම් කාලයට පෙර සහ පසු මෝසම් කාලය අතහැර භූගත ජලයේ නයිට්‍රේට් අයන වෙනස් වීම.*

**b.) භාණ්ඩාගාර හා අමාත්‍යංශ ප්‍රතිපාදන ව්‍යාපෘති.**

2016 වර්ෂය තුල ප්‍රධාන ව්‍යාපෘති 2ක් උතුරු පලාතේ භූජල විද්‍යාත්මක හා ජල රසායනික සංයුතිය නිර්ණය කිරීම කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක වූ අතර 2017 වර්ෂයේ දී භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

1. යාපනය ළිං නියාමනය කිරීමේ ව්‍යාපෘතිය.
2. වව්නියාව හා කිලිනොච්චි දිසිත්‍රික්කයන් හි සිදු කරන ලද භූ ජල විද්‍යාත්මක අධ්‍යනය.

මීට අමතරව චුන්නාකම් ප්‍රදේශයේ භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම නිරීක්ෂණය සඳහා භූ ජල විද්‍යාත්මක අධ්‍යනයක් වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යංශයේ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

### 9.4.1 යාපනය ළිං නියාමන ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතියේ පුධාන අරමුණ වන්නේ යාපනය අර්ධද්වීපයේ ප්‍රධානතම ජල ප්‍රභවය වන භූගත ජලයෙහි කෙටි කාලීන හා දිගු කාලීන පැවැත්ම තිරසාරව කළමණාකරනය කර ගැනීමට අත්‍යවශ්‍ය භූ ජල විද්‍යාත්මක දත්තයන් ක්‍රමානුකූලව සකස් කරන ලද දත්ත එක් රැස් කිරීමේ ජාලයක් මගින් ක්‍රමානුකූලව එක් රැස් කොට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණය සිදු කිරීම හා භූ ගත ජල කළමණාකරනයට අවශ්‍ය තාක්ෂණික ප්‍රතිපාදන සලස්වා දීමයි. මෙහිදී ප්‍රදේශයේ දැනට පවතින පිරිසිදු ජල ධාරිතාවන් ජලයේ ගුණාත්මක භාවය හා එහි විචලනයන් භූගත ජලයට බලපෑ හැකි කෘෂිකාර්මික හා වෙනත් ක්‍රියාකාරකම් ස්වාභාවික හුණුගල් ආශ්‍රිත භූ විද්‍යාත්මක තත්වයන් ආදියේ ද දැනට සිදුවන වේගවත් සංවර්ධන කටයුතු සමග ජල පරිභෝජනය අධික වීමත් ඒ සමග භූගත ජලයේ ඇතිවිය හැකි ගැටළු කළමණාකරණයට අවශ්‍ය දත්තයන් එක් රැස් කෙරේ.

ස්ථාපිත කරන ලද ජලයේ ගුණාත්මකභාවය නිමාන කිරීම 2016 හා 2017 වර්ෂවලදී මෝසම් කාලයට පෙර හා පසු ක්‍රියාත්මක කෙරිණි

| SN | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | විශේෂ කරුනු |
|---|---|---|---|
| 1 | ජලයේ ගුණාත්මකභාවය නිමානය සදහා යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත කරන ලද ස්ථාන | 162 | පෙර මෝසම් |
| 2 | | 162 | පසු මෝසම් |
| 3 | | 162 | ජුනි |
| 4 | | 162 | මාර්තු |
| 5 | භූ භෞතික සමීක්ෂණ | 20 | ජලධර සදහා භූජල විද්‍යාත්මක නිර්නය |
| 6 | පරීක්ෂන නල ළිං විදීම | 16 | ජලධර සදහා භූජල විද්‍යාත්මක නිර්නය |
| 7 | ජල ධාරිතා පරීක්ෂන | 15 | ජලධරවල තත්වය පරීක්ෂාව |
| 8 | ළිං වල මුහුදු මට්ටමේ සිට ජල මට්ටම පරික්ෂාව. | 12 | ජල ගැලීම් රටාව නිරීක්ෂණය. |




2017 ප්‍රගති අධ්‍යන වර්ශය තුල සිදු කරන ලද ඉතිරි ක්‍රියාකාරකම්

### 9.4.2 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ භූජල විද්‍යාත්මක අධ්‍යනය. (වව්නියා - කිලිනොච්චි ව්‍යාපෘතිය)

මෙම ව්‍යාපෘතිය 2016 වර්ෂයේ ක්‍රියාත්මක වු වව්නියා කිලිනොච්චි ව්‍යාපෘතියේ කොටසක් වන අතර ජල සාම්පල් එකතුකිරීම හා රසායනික විස්ලේශණයක් සදහා 2016 වියලි හා තෙත් කාලයේදී සාම්පල් 25 බැගින් එකතු කරන ලදි.

## 10 චුන්නාකම් ප්‍රදේශයේ භූ ගත ජල දූෂණය නිර්ණය.

මෙම භූ ජල විද්‍යාත්මක අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ චුන්නාකම් ප්‍රදේශයේ ජලධර අපවිත්‍ර වීමෙන් ආරක්ෂා කර ගැනීම හා පවතින තත්ව නිර්ණය කර ගැනීම වේ. මෙහි විශේෂිත අරමුණු වූයේ චුන්ණාකම් ජලධරය වෙත විදුලි ජනක මධ්‍යස්ථාන මගින් ඇති තෙල් කාන්දු වීම හෙතු කොට මුසු වු ජල අපවිත්‍රකාරක මුලාශ්‍ර හා අපවිත්‍රකාරක වර්ග හදුනා ගැනීම, චුන්නාකම් ජල ධරයට ජල දුශක එකතු වීමේ වර්තමාන තත්වය නිර්නය කිරීම, ජල දුශනය අවම කිරීමට හෝ වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග හදුනා ගැනීම වේ.

2016 වර්ෂයේ අවසාන කාර්තුව වන විට චුන්නාකම් අධ්‍යනය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය.

*රූපය7: භූගත ජලයේ ස්ථාන රසායන පරීක්ෂාව හා භූ ගත ජලයේ ගලායාම අධ්‍යනය කිරීම සඳහා ළිං වල උස් මට්ටම් නිර්ණය කිරීම.*




| අංකය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | වෙනත් කරුනු |
|---|---|---|---|
| 1 | භූගත ජල නිමානය | 235 | රසායනික පරාමිතින් විශ්ලේෂණය |
| 2 | භූ භෞතික විද්‍යා සමීක්ෂනය | 35 හා 10 | ජල ධර පරීක්ෂනය |
| 3 | පොම්ප පරීක්ෂනය | 15 | ජලධර තත්ව පරීක්ෂණය |
| 4 | ළිං වල ජල මට්ටම් පරීක්ෂාව | 60 | භූ ගත ජල ගැලීම් පරීක්ෂනය |
| 5 | තෙල් සහ ග්‍රීස් විශ්ලේෂණය | 100 | ජල අපවිත්‍රකාරක එකතුවන මාර්ග හදුනා ගැනීම |
| 6 | බැර ලෝහ විශ්ලේෂණය | 100 | |
| 7 | වාර්තා සැකසීම | | |

අවසන් වාර්ථාව සකස් කරමින් පවතින අතර චුන්නාකම් ජලධරයේ දූෂණය වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත සියළුම දත්ත, සොයාගැනීම්, ප්‍රතිපල හා නිර්දේශ එහි අඩංගු වේ.




*රූපය8: ජලයේ ගුණාත්මක භාවය අධ්‍යනය කිරීම සඳහා ඉදිකරන ලද නල ලිං හා වල ලිං ස්ථාන*

**a.)** වානිජමය ක්‍රියාකාරකම්

**1.) යාපනය නගරයේ පොකුනු පුනරුත්තාපනය සදහා උපදේශනය සේවාව.**

යාපනය අර්ධද්වීපය සාපේක්ෂව තැනිතලා භූමියක් වන අතර ස්වාභාවික හා ඉදිකරන ලද පොකුණු පවතී. මෙම පොකුණු හා භූගත ජල මට්ටම අතර සෘජු සම්බන්දයක් පවතින අතර ඒවා භූගත ජල පොෂක ස්ථාන ලෙස ක්‍රියා කරයි. මෙම පොකුනු මොසම් වර්ශා කාලයේදී ජලය රදවා ගන්නා බැවින් වර්ෂාව නිසා ජල ගැලීම් පාලනය කිරීමට සෘජුවම බලපායි. පොකුණු ඇතුළත රොන්මඩ තැන්පත් වීමට මෙම ක්‍රියාවලිය හෙතු වේ.

මෙම අධ්‍යනය යාපනය නගර සභා සීමාව තුළ ඇති පොකුණු 43 ක් සදහා සිදු කළ අතර එහි ප්‍රධානම අරමුණ වුයේ තැන්පත් වු රොන් මඩ ස්ථරයේ ඝනකම කර්ක්ෂා කිරීම හා අභ්‍යන්තර පාංශු ස්ථර පරික්ෂා කර තැන්පත් වු ස්ථරය ඉවත් කිරීම හා ඉවත්කල යුතු ආරක්ෂිත ගැබුර නිර්නය කිරීම වේ.

ක්‍රියාකාරකමේ අභිප්‍රායමෙහිදී රොන්මඩ ස්ථරයේ ගැඹුර නීර්නය කිරීම සදහා භූ තාක්ෂනික සමීක්ෂණ සිදු කිරීම හා සෑම පොකුණක් සදහාම රොන් මඩ ස්ථර ඉවත් කිරීම සදහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ක්‍රම වෙදයක් ක්‍රියාත්මක කෙරිණි. සෑම පොකුනකටම යාබදව නල ළිං ඉදිකර ජලයේ ගුණාත්මකභාවය නීර්නය කිරීම, රොන්මඩ ස්ථරය ඉවත් කිරීමෙන් පසුව ජලයේ ගුණාත්මකභාවයේ සිදු වී ඇති වෙනස්කම් හදුනාගැනීම සිදු කරනු ලැබේ. තවද DGPS උපකරණය මගින් මුහුදු මට්ටමේ සිට උස හා ස්ථානය නීර්ණය කරන ලදි.

මෙම ව්‍යාපෘතිය යටතේ යාපනය කලාප කාර්යාලයේ පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය.

| | **ක්‍රියාකාරකම** | **ප්‍රගතිය** | **විශේෂ කරුණු** |
|---|---|---|---|
| 1 | ඉදිකරන ලද නළ ළිං සඳහා ජලයේ ගුණාත්මකභාවය නිර්ණය කිරීම. | 35 | රසායනික පරාමිතීන් විශ්ලේෂණය |
| 2 | භූ භෞතික සමීක්ෂණය (1D & 2D) | 35 | නියාමන මිහිවිදුම් ඉදිකිරීමට ස්ථාන හදුනා ගැනීම සඳහා ජලධර පරික්ෂාව |
| 3 | පොම්ප පරීක්ෂණය | 10 | ජලධරවල ලක්ෂණ පරීක්ෂාව |
| 4 | ළිංවල මුහුදු මට්ටමේ සිට ඇති ජල මට්ටම මැනීම | 26 | මුහුදුමට්ටමේ සිට ඇති උස හා භූගත ජල රටාව පරීක්ෂාව |
| 5 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනාවැකි අනුව භූ තාක්ෂනික සමීක්ෂනය | 40 | රොන් මඩ ස්ථරයේ ගැඹුර නිර්ණය කිරීම හා රොන්මඩ ඉවත් කිරීමෙ මට්ටම නිර්දේශ කිරීම |
| 6 | වාර්තා සකස් කිරීම. | | පලමු පොකුණු 22 හි ක්‍රියාකාරකම් සිදුවන විට රොන් මඩෙහි ගැඹුර සඳහන් කෙටි වාර්තාව |








රූපය 10: රොන් මඩ ඉවත් කිරීමේ ක්‍රියාවලිය සඳහා යාපනය නාගරික කලාපය තුල ඇති පොකුණු ව්‍යාප්තිය දැක්වීම.

12.4 හි සඳහන් වැඩකටයුතු හා පොකුණු 43 සඳහා භූ තාක්ෂණික සමීක්ෂණ කටයුතු සඳහා උපදේශන සේවාව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදු කෙරිණි.

<u>**b.** වානිජමය ක්‍රියාකාරකම්</u>

නව කලාප කාර්යාලය ස්ථාපිත කිරීමෙන් ව්‍යාපෘති හා වානිජමය ක්‍රියාකාරකම් උතුරු කලාප කායීාලයේ කාර්යය මණ්ඩලය විසින් පාලනය කල අතර මීට පෙර අනෙකුත් කාර්යාලවල නිළධාරීන් කාර්යයන් නිම කිරීම සඳහා යෙදවිය. කීරමලෛ හා කරතිවු ප්‍රදේශවල ප්‍රධාන වාණිජමය ක්‍රියාකාරකම් දෙකක් ක්‍රියාත්මක වූ අතර එය 2009 යුධ ගැටුම් අවසන් වීමෙන් පසු නව සංවර්ධන ක්‍රියාවලියක් ලෙස සැලකිය හැක. මධ්‍යම පරිසර අධිකාරිය විසින් කරතිවු හි ලුණු ලේවාය ස්ථාපිත කිරීම හා කීරමලෛ අපද්‍රව්‍ය බැහැර කිරීමේ භූමිය ස්ථාපිත කිරීම සඳහා වැඩ කටයුතු ක්‍රියාත්මක විය.

එක් එක් වානිජ ක්‍රියාකාරකම් වල ආදායමේ සාරාංශය පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | වැඩ විස්තරය | අනුග්‍රාහකයා | මුදල් ප්‍රමාණය | විශේෂ කරුණු |
|---|---|---|---|---|
| 1 | බැක්ටීරියා විද්‍යාත්මක සහ රසායනික විශ්ලේෂණය | අනුග්‍රාහකයන් 150 | 326,197.98 | ක්‍රියාකාරකම සම්පූර්නයි |
| 2 | තිරුනාවෙලි පොම්ප පරීක්ෂනය | තිරුනාවෙලි දේපල වෙළඳාම් (පුද්) සමාගම | 437,850.00 | ක්‍රියාකාරකම සම්පූර්නයි |
| 3 | ජින්නා පාර යාපනය පොම්ප පරීක්ෂණය | A. තේවරාජා | 74,865.00 | ක්‍රියාකාරකම සම්පූර්නයි |
| 4 | කීරමලෙයි සමීක්ෂණය | මධ්‍යම පරිසර අධිකාරිය | 609,787.50 | ක්‍රියාකාරකම සම්පූර්නයි |
| 5 | කරතිවු ලේවාය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය | P. A .රොෂාන් පීරිස් | 463,286.25 | ක්‍රියාකාරකම සම්පූර්නයි |
| 6 | යාපනය නගර සීමාවේ පොකුණු පුනරුත්තාපනය | බස්නාහිර පලාත් සංවර්ධන අමාත්‍යාංශය | 12,400,000.00 | ක්‍රියාකාරකම සිදුකරගෙ යමින් පවතී |
| **එකතුව** | | | **14,311,986.73** | |

**උතුරු පලාත් කාර්යාලයේ මානව සම්පත් හා යටිතල පහසුකම් වැඩිදියුනු කිරීම.**

පසුගිය දශක කීපය තුළ ඉතා දුර්වලව පැවති පළාත් කාර්යාලවල කටයුතු ක්‍රමවත්ව ඉහල නැංවීම සඳහා මෙම වර්ෂය තුළ කටයුතු යොදන ලදි. මෙහි ප්‍රධානම දුෂ්කරතාවය වන්නේ අවශ්‍ය ධාරිතාවයකින් යුක්ත කාර්යය මණ්ඩල ප්‍රමාණය අඩු වීම වේ. නව ව්‍යාපෘති මා වානිජමය ක්‍රියාකාරකම් ආරම්භයේදී නියමිත කාලය දීර්ග වීම නිසා ඇතිවිය හැකි වියදම් අඩු කිරීමට හා කාර්යක්ෂමතාවය වැඩි කිරීමට නවක භූ විද්‍යාඥයින් දෙදෙනකු උතුරු කාර්යාලයේ සේවයට නියුක්ත කරන ලදි. අනෙකුත් නිලධාරීන් විසින් පරිපාලන කටයුතු හා භූ භෞතික සමීක්ෂණයක් මුහුදු මට්ටමේ සිට උස න්ර්ණය කිරීම, පොම්ප පරීක්ෂණය, ළිං වල ජල මට්ටම් නිමානය කිරීම වැනි ක්ෂේත්‍ර කටයුතු වලට සහය දැක්වීම ඇතුළු අනෙකුත් මෙහෙයුම් ක්‍රියාත්මක කරන ලදි.

උතුරු කලාපයේ ඇති කළ සංවර්ධනයත් සමග ජල සම්පත් මණ්ඩලයේ මානව සම්පත් හා උපකරණ ප්‍රමාණය දියුණු කරගත හැකි විය. 2013 වර්ෂයේ ස්ථාපිත කරන ලද නව විද්‍යාගාරයේ විද්‍යාගාරයේ රසායනික විශ්ලේෂණයට හා බැක්ටීරියා විද්‍යාත්මක විශ්ලේෂණ සඳහා අවශ්‍ය උපකරණ පවතින අතර බැර ලෝහ විශ්ලේෂණය සඳහා තව දුරටත් විද්‍යාගාර පහසුකම් දියුණු කිරීමට අවශ්‍යය.

**උතුරු පළාතේ නව උප කාර්යාලයක් ස්ථාපිත කිරීම**

වානිජමය හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වැඩිවීමත් සමග ජල සම්පත් මණ්ඩලයේ පරිපාලන හා ප්‍රවර්ධන කටයුතු වඩා ශක්තිමත් වී ඇත. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනේකුත් කලාපීය නිළධාරීන් සමග ඇතිකරගත් ගිවිසුම් වලින් අනතුරුව ඔමන්තය, පලේයි හා යාපනය නගරවල කලාප කාර්යාල ස්ථාපිත කිරීම සාර්ථක කර ගත හැකි විය.



රූපය 11: පලෙයි කාර්යාලය ඉදිකිරීම ආරම්භ කිරීම

## 11. උතුරු මැද පළාත

### 11.1 භාන්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති

ජල සම්පත් මණ්ඩලය මගින් අනුරාධපුර, වව්නියාව, කිලිනොච්චි, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, දිස්ත්‍රික්ක වල ජලධර වල ජලයේ ගුණාත්මකභාවය හා ප්‍රමාණය නිර්නය කිරීමේ පර්යේෂණ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක විය. 2016 ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල විස්ථර පහත ආකාර වේ.

#### 11.1.2. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දීර්ග කාලීන භූගත ජල නිමානය කිරීම හා ජලය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටළු පිලිබද ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජල සායන පැවැත්වීම. (RS ව්‍යාපෘතිය)

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැතිරී යන වකුගඩු රෝග හා අනෙකුත් ජලය නිසා ඇතිවන රෝග අවම කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් ජල සායන ජල සම්පත් පර්යේෂන හා පුහුණු මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ අතර ස්ථාපිත කරන ලද ජාලය නිමානය කිරීම 2015 වර්ෂයේ සිට සිදු කරගෙන යමින් පවතී. මෙම අධ්‍යනය 2011 භාන්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු වූ අතර මතුපිට ජලයේ ගුණාත්මකභාවය අන්රාධපුර විවිධ ජල ද්‍රෝණිවල ගැඹුරු හා නොගැඹුරු ජලධර හඳුනාගැනීම හා තවදුරටත් අධ්‍යනය කිරීමට නිර්දේශ ලබා ගැනීම සඳහා සිදු කරනු ලැබේ.

ජනවාරි සිට දෙසැම්බර් දක්වා පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය.
වගුව 02: RSව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ සිදුකළ ක්‍රියාකාරකම්.

| අංකය | ක්‍රියාකාරකම්/විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ගත ජල නිමානය හා ජල සාම්පල් එකතු කිරීම | 200 |
| 02 | ජල රසායනික විශ්ලේෂණය | 200 |
| 03 | ජල සායන හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 7 |
| 04 | දත්ත විශ්ලේෂණය හා සටහන් කිරීම | |

අත් පත්‍රිකා බෙදා දීම, දේශන පැවැත්වීම, පරිඝණක ආශ්‍රිත ඉදිරිපත් කිරීම්, ජල විශ්ලේෂණය කර ගුණාත්මක බව පහදා දීම, ෆ්ලෝරයිඩ් ජල පෙරණ යන්ත්‍ර බෙදා දීම ජල සායන 07 ක් තුලදී සිදු කෙරිණි .

වගුව 03: 2015 පැවැත් වූ ජල සායන පිළිබඳ විස්තර

| අංකය | ප්‍රාදේශිය ලෙකම් කොට්ඨාශය | ස්ථානය | සහබාගි වූ ගණන | විශ්ලේෂණය කල ජල සාම්පල් ගණන | බෙදාදුන් ජල පෙරන ගණන |
|---|---|---|---|---|---|
| 01 | රාජාංගනය | පොදු ගොඩනැගිල්ල, යාය 15, රාජාන්ගනය. | 106 | 89 | - |
| 02 | කැකිරාව | හිනුක්කිරියාව පන්සල, ගනේවල්පොල | 137 | 174 | - |
| 03 | පලාගල | පලාගල ප්‍රාදේශිය සභාව | 27 | 56 | 03 |
| 04 | කැබතිගොල්ලෑව | පොදුගොඩනැගිල්ල, කහටගොලලෑව, කැබතිගොල්ලෑව | 87 | 101 | 05 |
| 05 | මහවිලච්චිය | ශ්‍රී සුදර්ශනාරාම විහාරය, බෝගහ හන්දිය, මහවිලච්චිය | 36 | 38 | |
| 06 | කහටගස්දිගිලිය | අඹගස්වැව පන්සල කහටගස්දිගිලිය. | 60 | 105 | |
| 07 | තවලම | පොලිස් හන්දිය, ඉහල සියබලෑව, ඒප්පාවල | 111 | 161 | |
| **Total** | | | **564** | **724** | **08** |

**11.1.3.** වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල භූ ජල විද්‍යාත්මක අධ්‍යනය

මෙම පර්යේෂණය 2013 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ආරම්භ කෙරිණි. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ භූ ගත ජල විභවය හඳුනා ගැනීම සහ පානීය ජල අවශ්‍යතා සහ කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා භූගත ජල මූලාශ්‍ර හඳුනා ගැනීම වේ.

මෙම අධ්‍යනයේ විශේෂිතම අරමුණ වන්නේ ජලධරයේ පරාමිතීන් හඳුනාගැනීම හා වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල භූගත ජල විභවයක් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම වේ. එමෙන්ම කුඩා පරිමාණ කෘෂිකර්මාන්ත වලට ජලය සැපයීම පානීය ජලය ලබා ගැනීම හා ජීවන තත්ව තත්ව නගා සිටුවීම යටතේ භූගත ජල මූලාශ්‍ර හඳුනා ගැනීමට බලාපොරොත්තු වේ.

**2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකිරකම්.**

වගුව 04: 2015 වර්ෂයේ වව්නියාව - කිලිනොච්චි ව්‍යාපෘතිය යටතේ සිදුකළ ක්‍රියාකාරකම්.

| අංකය | ක්‍රියාකාරකම/විස්ථරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ජල විද්‍යාත්මක සමීක්ෂණය | 20 |
| 02 | පරීක්ෂණ මිහිවිදුම් | 20 |
| 03 | පොම්ප පරීක්ෂණ සිදු කිරීම | 10 |
| 04 | ළිං වල මුහුදු මට්ටමේ සිට ජල මට්ටම පරීක්ෂාව | 16 |
| 05 | ජල සාම්පල එකතු කිරීම හා ළිං නියාමනය | 122 |
| 06 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 122 |
| 07 | දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම | |

වගුව *05:* වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්කවල පරීක්ෂන ළිං විදීම හා පොම්ප පරීක්ෂණ සිදු කිරීම.

| **පරීක්ෂණ මිහිවිදුම් අංකය** | **ප්‍රාදේශිය ලෙකම් කෙට්ඨාශය** | **ස්ථානය** | **පොම්ප පරීක්ශනය සිදු කිරීම** |
|---|---|---|---|
| R13/15/TW 13 | වව්නියාව උතුර | ඉල්ලමාරඩම්කුලම් පල්ලිය, ඔමන්තෙයි | ඔව් |
| R13/15/TW 14 | වව්නියාව දකුණ | පුරානගලෙන් රජමහ විහාරය, මහකච්චකොඩිය | - |
| R21/15/TW08 | වව්නියාව උතුර | පුත්තකෝවිල්, පුත්තෝර් | - |
| R21/15/TW09 | වව්නියාව දකුණ | ප්‍රාදේෂිය රොහල, පවක්කුලම් | - |
| R17/15/TW30 | වව්නියාව උතුර | ව/කුච්චුකුලම් බන්ඩාරවන්නියවිද්‍යාලය මාන්කුලම් | - |
| R17/15/TW41 | වව්නියාව උතුර | ජ.ස.ම ඉඩම, ඔමන්තේ | - |
| R17/15/TW38 | පූනාකෙරි | කාන්තපුරම් ඉඩම, වෙරාවිල්, කිලිනොච්චි | - |
| R17/15/TW26 | කරච්චි | ලුම්බිනි විහාරය, කිලිනොච්චි | ඔව් |
| R17/15/TW28 | කරච්චි | තරුම්පුරම් G.T.M. විද්‍යාලය, තරුම්පුරම්,කිලිනොච්චි | - |
| R17/15/TW27 | කරච්චි | තිරුවයිආරු මහ විද්‍යාලය, ඉරනමඩු, කිලිනොච්චි | ඔව් |
| R17/15/TW33 | කරච්චි | 7SLNS යුධ හමුදා කඳවුර, අක්කරයන්කුලම්, කිලිනොච්චි | - |
| R17/15/TW34 | කරච්චි | වන්නිරික්කුලම් මහ විද්‍යාලය, කිලිනොච්චි | - |
| R17/15/TW37 | කරච්චි | කොනාවිල් G.T.M. විද්‍යාලය, කිලිනොච්චි | - |
| R17/15/TW29 | තුනුක්කායි | කොකාවිල් කණුව ඉඩම, කොකාවිල් | ඔව් |
| R17/15/TW31 | කරච්චි | 573 කඳවුර, 3 කනුව, පරන්තන් | - |

| | | | |
|---|---|---|---|
| R17/15/TW39 | කරච්චි | රාමනාතපුරම් බටහිර G.T.M. පාසල, වට්ටකච්චි | ඔව් |
| R17/15/TW35 | පූනාකරි | මුක්කොම්බන් G.T.M.පාසල, නල්ලූර්, පූනරීන් | - |
| R17/15/TW32 | කරච්චි | ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානය, කන්දවලි, කිලිනොච්චි | - |
| R17/15/TW36 | පූනාකරි | ජයපුරම් මහ විද්‍යාලය, ජයපුරම් | ඔව් |
| R17/15/TW40 | කරච්චි | කිලිනොච්චි පල්ලිය , කිලිනොච්චි | ඔව් |



A) පරීක්ෂණ ළිඳේ උස මට්ටම නිර්ණය



B) භූ විද්‍යාත්මක සමීක්ෂණ වච්නියාව



C) නල ළිං විදුම් කටයුතු කිලිනොච්චිය

**11.1.4 භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති**

2016 වර්ෂයේ අනුරාධපුර,පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල ජලධරවල ගුණාත්මකභාවය හා ප්‍රමාණාත්මකතාවය නිර්ණය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘති භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ආරම්භ කළ අතර ඒවායේ විස්තර පහත ආකාර වේ.

**11.1.5 අනුරාධපුර දිස්ත්‍රික්කයේ දීර්ඝකාලීන භූගත ජල නිමානය කිරීම හා ජලය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටළු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජල සායන පැවැත්වීම. (RS ව්‍යාපෘතිය)**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැතිර යන වකුගඩු රොග හා ජලය නිසා ඇතිවන අනෙකුත් රෝග අවම කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමේ අරමුණෙන් ජල සායන ජල සම්පත් පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් සංවිධානය කළ අතර ස්ථාපිත කරන ලද ජාලය නිමානය කිරීම 2015 වර්ෂයේ සිට සිදු කරගෙන යමින් පවතී.

මෙම අධ්‍යනය 2011 භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු වූ අතර මතුපිට ජලයේ ගුණාත්මකභාවය අන්රාධපුර විවිධ ජල ද්‍රෝණිවල ගැඹුරු හා නොගැඹුරු ජලධර හදුනා ගැනීම හා තව දුරටත් අධ්‍යනය කිරීමට නිර්දේශ ලබා ගැනීම සඳහා සිදුකරනු ලැබේ. ජනවාරි සිට දෙසැම්බර් දක්වා පහත් සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය.

වගුව **02:** ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ කල ක්‍රියාකාරකම්

| අංකය | ක්‍රියාකාරකම/විස්ථරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූගත ජල නිමානය හා ජලසාම්පල් එකතු කිරීම | 200 |
| 02 | ජල රසායනික විශ්ලේෂණය | 200 |
| 03 | ජල සායන හා ජනතාව දැනුවත් කිරිීම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම | 5 |
| 04 | දත්ත විශ්ලේෂණය හා වාර්තා තැබීම | |

අත්පත්‍රිකා බෙදා දීම, දේශන පැවැත්වීම, ජල විශ්ලේෂණය කර ගුණාත්මක බව පහදා දීම හා ෆ්ලෝරයිඩ් ජල පෙරන යන්ත්‍ර ලබා දීම ජල සායන 5 ක් තුළදී සිදු කෙරිණි.

වගුව **03:** 2016 වර්ෂයේ පැවැත් වූ ජල සායන පිළිබඳ විස්තර

| අංකය | ප්‍රා.ලේ. කොට්ටාශය | ස්ථානය/ගම | සහභාගී වූ ගණන | විශ්ලේෂණ කල ජල සාම්පල් ගණන. |
|---|---|---|---|---|
| 01 | කහටගස්දිගිලිය | මහහල්මිල්ලෑව පන්සල | 47 | 84 |
| 02 | රම්බෑව | පිහිම්බියාගොල්ලෑව ප්‍රජාශාලාව | 80 | 132 |
| 03 | පදවිය | කෝන්කැටියාව ප්‍රජාශාලාව | 43 | 43 |
| 04 | හොරොව්පතාන | ඉන්ද්‍රරත්නාරාමය,ඇලපත්වැව හන්දිය,හොරොව්පතාන. | 90 | 101 |
| 05 | මැදවච්චිය | ප්‍රජාශාලාව,ලිංදවැව,මැදවච්චිය. | 41 | 57 |
| **Total** | | | **301** | **417** |

**11.1.6. පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල වකුගඩු රෝග සුලභ ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අධ්‍යනය.**

මෙම අධ්‍යනය 2014 වර්ෂයේදී ත්‍රිකුණාමලය පොළෝන්නරුව දිස්ත්‍රික්කවල භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදු කෙරිණි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ පොළෝන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල වකුගඩු රෝග සුලභ ප්‍රදේශවල ජලයේ ගුණාත්මක භාවයේ පැතිරීම හදුනාගැනීම වේ.

2016 වර්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර, ලංකාපුර, වැලිකන්ද, දිඹුලාගල, හා හිගුරක්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල භූ ජල විද්‍යාත්මක සමීක්ෂණයන්ද ඇලහැර, ලංකාපුර, වැලිකන්ද, දිඹුලාගල සහ

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පරීක්ෂණ නළ ළිං 5ක් ද ඉදිකළ අතර ඒවායෙන් 3 කට අත්පොම්ප සවි කරන ලදි.

**වගුව 04: 2016 වර්ෂයේ පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල වකුගඩු ව්‍යාපෘතිය යටතේ සිදු කළ ක්‍රියාකාරකම්.**

| අංකය | ක්‍රියාකාරකම/විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ජල සමීක්ෂණ | 06 |
| 02 | පරීක්ෂන නල ළිං ඉදි කිරීම | 05 |
| 03 | අත් පොම්ප සවි කිරීම | 03 |
| 04 | ජල සායන හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 04 |
| 05 | දත්ත විශ්ලේෂණය හා වාර්ථා තැබීම | |

## 12. වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය (අනුරාධපුර හා මාතලේ නියමු ප්‍රදේශ)

මෙම ව්‍යාපෘතිය අනුරාධපුර කොරකහවැව ජල සම්පත් හා පුහුණු මධ්‍යස්ථානය විසින් සිදු කරගෙන යනු ලබන අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍යම නුවරගම් පළාත, රඹෑව, මැදවච්චිය, හොරොව්පතාන, කහටගස්දිගිලිය, කැබතිගොල්ලෑව, පදවිය හා ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ටාශය හා මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, ගලේවෙල, පල්ලෙපොළ, නාඋල හා ලග්ගල පල්ලෙගම ප්‍රාදේශිය ලෙකම් කොට්ඨාශ ආවරණය වන පරිදි 2011 වර්ෂයේ ආරම්භ කරන ලදි. 2014 වර්ෂයේදී සිදුකරනු ලැබූ දීර්ග කාලීන නියාමනය අනුව (Monitoring) ආරම්භක අධ්‍යනයන්ට අනුව නියාමන ජාලයක් (monitoring network) ස්ථාපිත කරන ලදි. 2015 සාම්පල් එකතු කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද ප්‍රදේශවන අනුරාධපුර දිස්ත්‍රික්කයේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ, විල්ගමුව, යටවත්ත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සඳහා ද මෙම ව්‍යාපෘතිය දීර්ඝ කරන ලදි.

2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කරන ලද ක්‍රියාකාරකම් පහත ආකාර වේ.

**වගුව 05: 2016 වර්ෂයේ අනුරාධපුර නියමු කලාපයේ වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය යටතේ සිදුකල ක්‍රියාකාරකම්**

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ස්ථාපිත නියාමන ජාලයේ (Monitoring network) මාසිකව ජල මට්ටම් මැනීම | 40 |
| 02 | භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ | 07 |
| 03 | පරීක්ෂණ ළිං ඉදිකිරීම | 02 |
| 04 | | |

**වගුව 06: 2016 වර්ෂයේ මාතලේ නියමු කලාපයේ වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම්.**

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ස්ථාපිත කරන ලද නියාමන ජාලයේ ජල සාම්පල් එකතු කිරීම | 68 |
| 02 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 68 |
| 03 | භූ විද්‍යා සමීක්ෂණ | 04 |
| 04 | පරීක්ෂණ ළිං ඉදිකිරීම | 02 |
| 05 | දත්ත විශ්ලේෂණය හා වාර්තා තැබීම | |

### 12.1 අමතර ක්‍රියාකාරකම්

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය යටතේ උතුරු මැද පළාත් කාර්යාලයේ නව විද්‍යාගාරයක් ඉදි කිරීම, අනුරාධපුර සංචාරක බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම, වව්නියාව වැඩබිම් පරිශ්‍රය ඉදිකිරීම ඇතුළු වානිජමය ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් තව දුරටත් සිදු කරගෙන යමින් පවතී.



*පින්තූරය 04: අන්රාධපුර පළාත් කාර්යාලයේ නව රසායනාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කිරීම*



***පින්තූරය 05: අනුරාධපුර සංචාරක නිවාසය අලුත්වැඩියාව***

## 13. වයඹ පළාත

2016 වර්ෂයේ ආරම්භ කරන ලද ක්‍රියාකාරකම්වල විස්තර පහත සදහන් ආකාර වේ.

1. ප්‍රජාමූල සංවිධානය (ජාතික සංවර්ධන ව්‍යාපෘති ආධාර යටතේ) සහ පුත්තලම, ආනමඩුව, පල්ලම, මුන්දලම, දංකොටුව, ආරච්චිකට්ටුව, මාදම්පෙ සහ නවගත්තේගම ප්‍රාදේශිය ලේකම් කොට්ටාශවල ඇති කුඩා පරිමාණ ජල සැපයුම් ව්‍යාපෘති මගින් සවිස්ථරාත්මක භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ, නල ළිං විදීම හා ජලයේ ගුණාත්මක භාවය විශ්ලේෂණය කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

   තවද කපු සංස්ථාව, සිවිල් ආරක්ෂක දෙපාර්ථමේන්තුව හා **CRI** වැනි රජයේ ආයතන ඉහත සදහන් ක්‍රියාකාරකම් පුත්තලම හා කුරුනැගල දිස්ත්‍රික්කවල සිදු කරන ලදි. ආදායම. (**Rs. 3,218,264.82**)

2. විරාපල් - පොන්නවේලි ප්‍රදේශයේ යෝජිත සිමෙන්ති නිෂ්පාදනාගාරය, ටෝකියෝ සිමෙන්ති (ලංකා) සමාගම විසින් සවිස්ථරාත්මක භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ (1D, 2D) හා නල ළිං 6 ක් සාර්ථකව ඉදිකර නිම කරන ලදි . ආදායම: (**Rs. 2,133,406.75**)





**3** පුත්තලම හා කුරුනෑගල දිස්ත්‍රික්කවල පෞද්ගලික අංශය සදහා විස්තරාත්මක භූ ජල විද්‍යා සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, ළිං පිරිසිදු කිරීම, පොම්ප පරීක්ෂණ හා ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය සිදු කරන ලදි. ආදායම **:** (**Rs. 3,263,659.38**)

4 වර්ල් විෂන් පෞද්ගලික සමාගම විසින් රිදීගම හා මුන්දලම ප්‍රාදේශීය ලෙකම් කොට්ටාශවල ජනතාවගේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සදහා භූ ජල සමීක්ෂණ , නළ ළිං ඉදි කිරීම, පොම්ප පරීක්ෂණ හා ජලයේ ගුණාත්මක බව විශ්ලේෂණ සිදු කරන ලදි.






5 2015 වර්ෂයේ වර්ල්ඩ් විෂන් සමාගමේ ආධාර යටතේ නවගත්තේගම ප්‍රදේශයේ සිදු කළ භූගත ජල අධ්‍යනයේදී ජලයේ ගුණාත්මකතාවය විශ්ලේෂණය මගින් භූගත ජලයේ ගැටළු හඳුනා ගැනීම හා භූගත ජල ගුණාත්මක භාවය පෙන්නුම්කරන සිතියම් හා වාර්ථා සකස් කරන ලදි. ආදායම: (**Rs. 963,070.50**)

6 භූගත ජලයේ ගුණාත්මකභාවය දැක්වෙන සිතියම් පිලියෙල කිරීමට මුන්දලම ප්‍රාදේශිය ලෙකම් බල ප්‍රදේශයේ භූගත ජලය සම්බන්ද ගැටළු සොයා බැලීමට භූගත ජල නියාමනය (Ground water monitoring) සහ ජල සාම්පල එකතුකිරීමේ වැඩසටහනක් GA ආධාර යටතේ සිදු කෙරිණි . එහිදී වල ළිං හා නල ළිං වලින් ජල සාම්පල 215 ක් රැස්කරගත් අතර ඒවායේ ගුණාත්මකභාවය මෙම වැඩසටහන අතර තුර ජංගම විද්‍යාගාර තුලදී සිදු කෙරිනි.
**මුළු ආදායම**: (**Rs. 1,099,066.50**)

7 පුත්තලම හා කුරුනෑගල දිස්ත්‍රික්කවල ග්‍රීන්සැන්ඩ් පුද් සමාගම, ෆෝචූන් කෘෂිකර්මාන්ත සමාගම වැනි සමාගම් සඳහා සවිස්ථරාත්මක භූජල විද්‍යාත්මක සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, පොම්ප පරීක්ෂණ හා ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂණය සිදු කෙරිනි. එමෙන්ම චුන්නාකම් ප්‍රදේශයේ භූ විද්‍යාත්මක පසුබිම හා තෙල් මගින් ජලය දූෂණය විය හැකි ආකාර හඳුනා ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සඳහා 2D භූ භෞතික සමීක්ෂණ සිදු කරන ලදි. **ආදායම:** (**Rs. 2,472,235.50**)



**8.** වැලි හා පස් කැණිම, ගල් කැණීම නිසා සිදුවිය හැකි පරිසර හානි තක්සේරු කිරීම සඳහා එම ඉඩම් වල භූ ජල විද්‍යාත්මක හා භූ භෞතික සමීක්ෂණ හා පොම්ප පරීක්ෂණ සිදු කල අතර මෙම ක්‍රියාකාරකම් නිසා සිදුවිය හැකි හානි අවම කිරීමට අවශ්‍ය තාක්ෂනික උපදෙස් හා නිර්දේෂ ලබා දීම සිදු කෙරිනි. මේ සඳහා අදාළ වාර්ථා මධ්‍යම හා කාලාපීය පරිසර අධිකාරිය, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශිය ලෙකම්, බූ විද්‍යා හා පතල් කාර්යංශය සහ අදාල අනෙකුත් කාර්යාල සඳහා යොමුකර ඇත. **ආදායම:**
**(Rs. 3,290,647.00)**

**9.** සාලාව යුධ හමුදා කඳවුරේ ඇති වූ සිදුවීමත් සමග හංවැල්ල, කඩුවෙල, කොළොන්නාව හා කොස්ගම ප්‍රදේශවල වල ළිං 950 ක් නල ළිං 350 ක් පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර කැලණි ගඟ ආශ්‍රිතව ගංවතුරෙන් හානි වූ ප්‍රදේශ වල වල ළිං 839 ක්, නල ළිං 20 ක් හා නිවාස 07 ක් පිරිසිදු කිරීම සිදු කෙරිනි.



**10.** භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මන්නාරම හුණුගල් ආශ්‍රිත ජලධර සඳහා භූ ජල සමීක්ෂණ 15, පරීක්ෂණ ළිං ඉසීම් 15 ක් හා පොම්ප පරීක්ෂණ 20ක් සිදු කෙරිනි. රැස්කල ජල සාම්පල 200ක් අතරින් ජල සාම්පල 164 ක් පූර්ණ රසායනික විෂ්ලේශණය කල අතර 127ක් අර්ධ වශයේන් රසායනික විෂ්ලේශණය සිදු කරන ලදි. 2016 වර්ෂය තුලදී නොගැඹුරු භූ ගත ජල ජාලය 5 වාරයක් නියාමනය කරන ලදි.
**වියදම් එකතුව : (Rs 4,000,000.00)**

11 භාන්ඩාගාර ප්‍රතිපාදන යටතේ මුන්දලම, පුත්තලම සහ කල්පිටිය ප්‍රාදේශිය ලෙකම් කොට්ඨාශවලින් භූ ගත ජල පොෂක කලාප හදුනාගැනීමට රැස්කරගත් ජල සාම්පල 112 න් 56 ක් රසායනික විශ්ලේෂණය කරන ලදි. 2016 වර්ෂය තුලදී වාර 4ක් භූගත ජල ජාලය නියාමන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.



**වියදම් එකතුව : (Rs 220,352.30)**

**12** ජලයේ ගුණාත්මකභාවය අධ්‍යනය හා වකුගඩු නිවාරණ ව්‍යාපෘතිය භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව, අඹන්පොල, ඇහැටුවැව, සහ මහව ප්‍රාදේශිය ලෙකම් කොට්ඨාශ 2016 වර්ෂයේ අධ්‍යනයන් සදහා තෝරා ගැණුනි. ගල්ගමුව ප්‍රාදේශිය ලේකම් කලාපය තුළ වල ළිං හා නල ළිං 120 කින් ජල සාම්පල් 120ක්ද මහව ප්‍රාදේශිය සභා කලාපයෙන් ජල සාම්පල් 120ක්ද රැස්කල අතර ජල සාම්පල 100ක් පූර්ණ රසායනික විශ්ලේෂණයක් කරන ලදි. එමෙන්ම ගලිගමුව, ඇහැටුවැව, මහව, සහ අඹන්පොළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල 100 දෙනෙකුට වැඩි සහභාගීත්වයක් සහිතව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 4 ක් ක්‍රියාත්මක කරන ලදි.



13. කලාප කාර්යාලයේ සියළුම නිලධාරීන්ගේ හා කාර්ය මණ්ඩලයේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව කාර්යාල පරිශ්‍රයේ ශ්‍රමදාන ව්‍යාපාරයක් පැවැත්විනි.
2016 වර්ෂය තුල (ජනවාරි සිට දෙසැම්බර් දක්වා) රජයේ හා පෞද්ගලික අංශ විසින් සිදුකල භූ ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් වන්නේ භූ ගත ජල පරීක්ෂණ 79 ක්, නල ළිං විදීම් 79ක්, පොම්ප පරීක්ෂණ 17ක්, ළිං පිරිසිදු කිරීම් 8ක්, ජල සාම්පල විශ්ලේෂණ 379 ක් සහ භූ ගත ජල අධ්‍යනයන් වේ.
පුත්තලම පළාත් කාර්යාලයේ 2016 වර්ෂයේ ජනවාර් සිට දෙසැම්බර් දක්වා මුළු ආදායම (රු. **16,440,349.95**) (භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති ඇතුලත් නොවේ).

## 14. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග සුලභ ප්‍රදේශ සදහා ජලයේ ගුණාත්මක භාවය අධ්‍යනය.

**14.1** පසුබිම

වකුගඩු රෝග පළමුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කීපයක හා අම්පාර, කුරුනෑගල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පොළොන්නරුව, බදුල්ල දිස්ත්‍රික්ක වලින් වාර්ථා විය. **මේ සදහා** කෘෂිරසායනික තේල් සහ පොහොර වැඩි වශයෙන් භාවාතය හේතුවිය හැකි බව සලකනු ලැබේ. එමෙන්ම hardness හ ජලයේ ඇති ෆ්ලෝරයිඩ් ද හේතුවිය හැක. එම නිසා වකුගඩු රෝග සුලභ ප්‍රදේශවල ජලයේ ගුණාත්මක නියාමනය ඉතා වැදගත් වේ.
මෙම අධ්‍යනය 2014 වර්ෂයේ ආරම්භ වූ අතර 2015 වර්ෂය වන විට මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක විය.

### 14.2 අධ්‍යයන කලාප




ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මුලු භූමි ප්‍රමාණය වර්ග කිලොමීටර් 5959 වන අතර මුලු ජනගහනය 448,210 වේ. මෙම දිස්ත්‍රික්කය ඊෂාන දිසාවෙන් අම්පාර දිස්ත්‍රික්කයෙන්ද දකුණින් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන්ද බටහිර දිශාවෙන් රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක වලින්ද මායිම් වේ. ප්‍රධාන වශයෙන් කෘෂි කර්මාන්තය හා පසු සම්පත් මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික ක්‍රමය වේ. මොණරාගල දිස්ත්‍රික්කය අතරමැදි හා වියළි කාලගුණික තත්ත්වයක් පවතී. වාර්ෂික මධ්‍යම වර්ෂාපතනය මිලි මීටර් 1250 ක් වේ. මිලි මීටර් 2622 දක්වා විචලනය වේ. බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 ක් ඇති අතර ග්‍රාම නිලධාරී කොට්ඨාශ 319 කට බෙදේ.

### 14.3 ක්‍රියාපිළිවෙල

අධ්‍යයනයේ අරමුණු වලට ළගා වීමට පහත ක්‍රියා පිළිවෙල අනුගමනය කරදී දත්ත රැස් කිරීම.

මූලික දත්ත හා විවිධ සංවිධාන වලින් රැස් කරගත් දත්ත අනුව තෝරාගත් ස්තාන අධ්‍යයන කරන ලදී. ලබාගත් ජල සාම්පල මගින් ජලයේ රසායන කලාපය වශයෙන් හා කාලීන වශයෙන් විශ්ලේෂණය කරන ලදි. භූමි පරිභෝජනය භූ දිශාව හා DEM මූලික සිතියම් Arc GIS 10 මාපකයෙන් සකස් කර ගන්නා ලදී.

#### 14.4 Desk Study

භූ ලක්ෂණ සිතියම්, භූ විද්‍යාත්මක සිතියම්, ව්‍යුහාත්මක සිතියම්, ගුවන් හා චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් ප්‍රදේශයේ භූ විද්‍යාව, භූ රූප රටා, පාංශු වර්ගය, භූමි පරිභෝජනය සහ ජල ද්‍රෝනි පිළිබද අධ්‍යයන කරන ලදී. ජනතාව දැනුවත් කිරීම සදහා පවතින වර්ෂාපතන සහ උෂ්ණත්ව දත්ත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලදී.

## 14.5 ක්ෂේත්‍ර අධ්‍යයනය

විවිධ ජල ප්‍රභව වන නල ළිං , වල ලිං, ගංගා , වැව් සහ වාරිමාර්ග හදුනාගත් අතර ඒවායේ පාෂාණ වර්ගය, භූ රූප රටා හා පාංශු වර්ගය යන තාක්ෂණික දත්ත සහ ජල දූෂක පිළිබද තොරතුරු එක් රැස් කර ගන්නා ලදී. රැස් කරගත් ජල සාම්පල සදහා රසායනික විශ්ලේෂණය හා බැර ලෝහ විශ්ලේෂණය සිදු කරන ලදී. එක් කලාපයක් තුල ඇති සියලු ගැඹුරු හා නොගැඹුරු ජල ප්‍රභව වලින් වියළි කාලයේදී ජල සාම්පල රැස් කරන ලදී.

## 14.6 රසායනික විශ්ලේෂණය

මිලි ලීටර් 500 ප්ලාස්ටික් බෝතල් වලට , නිර්දේශ වලට අනුකූලව ජල සාම්පල රැස් කර ගන්නා අතර ඒවා කැල්සියම් , සින්ක්, ආසනික්, ප්‍රධාන ආනයන හා කැටයම් සහ බැර ලෝහ සදහා විශ්ලේෂණය කිරීමට විද්‍යාගාරයට යොමු කරන ලදී.

## 14.7 භූ භෞතික සමීක්ෂණ

මොණරාගල දිස්ත්‍රික්කයේ ස්ථාන කීපයක , පැලුම් සහිත කලාප, පැලුම් තීව්‍රතාවය හා පාෂාණ වර්ග සහ භූ විද්‍යාත්මක තොරතුරු හදුනාගැනීම භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ සිදු කරන ලදී. උප පෘෂ්ඨීය තත්ත්වයන් හදුනා ගැනීම සදහා භූගත ජල සංවර්දන ක්‍රියාවලියේදී ප්‍රධාන වශයෙන් ප්‍රතිරෝධකතා පරීක්ෂණ හා භූ භෞතික ක්‍රමෝපාය යොදා ගනී. සාපේක්ෂ ප්‍රතිරෝධකතා අගයන් ලබා ගැනීමට ABEMSAS 1000 Terrameter උපකරණය Slumberger ක්‍රමවේදය අනුගමනය කරමින් සකස් කරන ලද අතර එම දත්ත උප පෘෂ්ඨයේ ස්ථර හදුනාගැනීමට Mannual විශ්ලේෂණය කරන ලදී.

## 14.8 පරීක්ෂණ මිහි විදම්

මොණරාගල දිස්ත්‍රික්කයේ පවතින නල ළිං දත්තවල ඇති අඩු පාඩු සකස් කරගත හැකි වන සේ පරීක්ෂණ මිහි විදුම් සදහා ස්ථාන තෝරා ගන්නා ලදී. සමීක්ෂණ ප්‍රතිඵල අනුව පරීක්ෂණ මිහි විදීම සිදුකල අතර මතුපිට පස් තට්වුවෙන් හා ගැඹුරු පාෂාණයෙන් ලබාගත් ජල සාම්පල වල රසායනික හා භෞතික පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී.

## ප්‍රතිඵල

මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිරෝධකතා දත්ත අනුව නල ළිං 11 ක් ඉදි කිරීඹ හා අත් පොම්ප සවි කිරීම සිදු කරන ලදී.

| | Job order number | Coordinate | | DS | Village | Yield(LPM) |
|---|---|---|---|---|---|---|
| 1 | PM/MON/CKD/06 | 80.8798 | 6.3552 | සෙවනගල | මුතුමිනිගම | 80 |
| 2 | PM/MON/CKD/08 | 81.3111 | 6.9187 | මෝණරාගල | කොටිගල්හල | 20 |
| 3 | PM/MON/CKD/12 | 81.3495 | 6.88 | මෝණරාගල | සිරිගල | 80 |
| 4 | PM/MON/CKD/14 | 81.2829 | 6.9941 | මැදගම | බකිනිගහවෙල , තිබියාගසර | 5 |
| 5 | PM/MON/CKD/16 | 80.7129 | 7.2171 | මැදගම | 11කණුව, මැදගම | 4 |
| 6 | PM/MON/CKD/15 | 81.3092 | 6.8848 | මෝණරාගල | හින්දිකිවුල, නක්කල | dry |
| 7 | PM/MON/CKD/17 | 81.3666 | 6.7867 | මෝණරාගල | තිසාපුර - හුලංදාව | 150 |
| 8 | PM/MON/CKD/18 | 81.3794 | 6.8119 | මෝණරාගල | මාරාව | 3 |
| 9 | PM/MON/CKD/19 | 81.0939 | 6.7287 | මෝණරාගල | වැල්ලවාය | 0 |
| 10 | PM/MON/CKD/09 | 81.7105 | 7.138 | මන්තොට්ටම | මන්තෝට්ටම | 5 |
| 11 | PM/MON/CKD/20 | 81.4936 | 6.9126 | මෝණරාගල | ගුරුගම්මානය | 70 |
| 12 | PM/MON/CKD/21 | 81.2877 | 6.7668 | බුත්තල | ගගේයාය | 70 |

පින්තූරය 5: නල ලිං ඉදිකරන ලද ප්‍රදේශ



නිර්දේශ හා අනාගත සැලසුම්

2016 වර්ෂයේ මොණරාගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝග පැතිරී ඇති ප්‍රදේශ වල භූ ජල විද්‍යා සමීක්ෂණ හා නල ළිං විදීම සිදු කිරීමට නියමිතය.

**15.** කිරිදි ඔය ද්‍රෝණිය සංවර්ධනය කිරීම

අදියර 01 - තිස්සමහාරාමය, තණමල්විල, ලුණුගම්වෙහෙර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ)

**(a)** හැදින්වීම

2015 වර්ෂයේදී කිරිදිඔය ද්‍රෝණියේ තිස්සමහාරාමය, තණමල්විල හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල භූගත ජලය සංවර්ධනය සදහා සවිස්තරාත්මක භූ ජල විද්‍යා සමීක්ෂණ ආරම්භ කරන ලදී. කිරිදි ඔය භූගත ජල සංවර්ධන හා තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ භූගත ජල ස්වභාවයේ වෙනස් වීම් හා භූගත ජල මට්ටමේ වෙනස් වීම් කාලයත් සමග විචලනය අධ්‍යයනයට පරීක්ෂණ ළිං ස්ථාපිත කිරීමයි. ශ්‍රී ලංකාවේ කිරිදි ඔය ගංගා නිම්න ද්‍රෝණිය අවට ජනතාව ප්‍රධාන වශයෙන් අත් පොම්ප නල ළිං හා නිෂ්පාදන නල ළිං වලින් කෘෂිකර්මාන්තයට හා බීමට අවශ්‍ය ජලය සපුරා ගනී. කෘෂිකාර්මික අවශයතාවයන් වලට අධික ලෙස ජලය භාවිතයෙන් සිදුව ඇති ජල හිගය නිර්ණය කර ගැනීමට නිසි සැලැස්මක් නොමැතිවීම හේතුවෙන් ජනතාවට අපේක්ෂිත ප්‍රතිඵලයක් නොලැබේ. එම නිසා ඉහත ප්‍රදේශ වලට භූගත ජලය නිමානය කිරීමේ වැඩසටහනකට අරමුදල් වෙන්කල යුතුය.

**01.** පෙර අධ්‍යයනයේදි අනිවාර්යයෙන් පවතින භූ ජල විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම

**02.** ප්‍රධාන ක්ෂේත්‍ර අධ්‍යයනයට ළිං නියාමනය, අහමු ජල විද්‍යාත්මක එක්රැස් කිරීම, ජලයේ ගුණාත්මකභාවය විශ්ලේෂනය හා ජලයේ ගුණාත්මකබාවයේ පැතිරීම දැක්වෙන සිතියම් පිළියෙල කිරීම.

**03.** විද්‍යුත් ප්‍රතිරෝධකතා අධ්‍යයනය හා පරීක්ෂණ ළිං වල පිහිටීම තෝරා ගැනීම.

**04.** මහජනයාට හා පාරගශවකරුවන්ට අධ්‍යයනයන්ගේ වැදගත්කම පැහැදිලි කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**05.** අවශය පරීක්ෂණ ළිං වල පිහිටීම තෝරා ගැනීම, පරීක්ෂණ නල ලිං ඉදි කිරීම, ළිං වල දත්ත වාර්තා පිළියෙල කිරීම.

**06.** මුහුදු මට්ටමේ සිට උස නිර්ණය කිරීම, ස්ථානීය සිතියම් සැකසීම, භූගත ජල මට්ටමේ සමෝච්ච රේඛා සිතියම්, ජල ධරයන්ගේ ජ්‍යාමිතිය දැක්වෙන සිතියම් පිළියෙල කිරීම.

**07.** පොම්ප පරීක්ෂණ හා භූගත ජල විභව තක්සෙරු කිරීම.

**08.** භූගත ජල සාම්පල රැස් කිරීම හා ජල රසායනික විශ්ලේෂණය

**09.** අවසාන වශයෙන් භූගත ජලය දත්ත පද්ධතියක් ස්ථාපිත කල අතර එය කාලීනව යාවත්කාලීන කරමින් හා භූගත ජල සම්පත් කළමනාකරණ අවශ්‍යතා සදහා ඕනෑම අවස්ථාවකදී ප්‍රයෝජනයට ගතහැකි අයුරින් සකස් කරන ලදී.

වාර්ෂික වැඩ සැලැස්ම අනුව ඉහත සදහන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කළ අතර සියලුම සොයාගැනීම් ප්‍රතිඵල හා 2015 වර්ෂයේ සියලු වැඩ කටයුත= සදහා නිර්දේශ වාර්තාවේ සදහන් වේ.

**(b)** ව්‍යාපෘතියේ අරමුණු

ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ නොගැඹුරු වැලි සහිත ජලධර හදුනා ගැනීම, සංවර්ධනය සහ කළමනාකරණය කිරීමෙන් පරිසරයට හානි නොවන සේ උපරිම ප්‍රතිලාභ ළගා කර දීමයි.

විශේෂිත අරමුණු

**01.** ජලධරයේ ආකෘතිය, භූගත ජල විභවය හා ජලයේ ගුණාත්මකභාවය හදුනා ගැනීම.

**02.** අධ්‍යයන ප්‍රදේශවල ජලධරය පෝෂණය වීම ප්‍රමාණය සහ ජලය භාවිතයට ගැනීම සීමා කිරීම.

**03.** භූගත ජල නියාමන වැඩ සටහන තක්සේරු කිරීමේ සැලසුම

**(a)** භූගත ජලය භාවිතයෙන් සිදුවන පරිසර හානිය

**(b)** ජලයේ ගුණාත්මකභාවය හා නියමිත අවශ්‍යතාවයට සුදුසු ගුණාත්මකභාවයට පත්විය හැකි ක්‍රියාකාරකම්**.**

**04.** වඩා ප්‍රයෝජනවත් ලෙස භූගත ජල භාවිතයට අවශ්‍ය ක්‍රමවත් යාන්ත්‍රණයක් වෙනත් උපකරණ භාවිතයෙන් පරීක්ෂාව

**05.** භූගත ජල සැකසුම පිළිබද මාර්ගෝපදේශ, න්‍යායන්, නිර්ණායක මත පදනම්ව දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම.

**06.** භූගත ජල පද්ධතිය කෘතිමව පෝෂණය කිරීමට සුදුසු ස්ථාන හදුනා ගැනීම.

**(c)** ක්‍රමවේදය

ව්‍යාපෘතියේ අරමුණු හා ප්‍රතිඵල වෙත ළගා වීමට පහත සදහන් ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

**(a)** අධ්‍යයන කලාපයේ භූගත ජල සම්පත් වලට අදාල සියලුම දත්ත හා තොරතුරු භූගත ජල විභවය තක්සේරු කර ගැනීඹ සදහා හදුනා ගැනීම.

**(b)** ගැඹුරු හා නොගැඹුරු භූගත ජලයේ උපයෝගීතාවය හා විභවය තක්සේරු කරන ලදී.

**(c)** ලවණ ජලය කාන්දු වීම සහ අධික ලෙස භූගත ජලය භාවිතයට ගැනීමෙන් බලපෑමට ලක් වීමට වැඩි ප්‍රවණතාවයක් ඇති කලාප හදුනා ගැනීම.

**(d)** ජලධර පෝෂණය වීමට බලපාන ක්‍රියාකාරකම් හදුනාගැනීම හා ජල පෝෂණ යාන්ත්‍රණය දියුණු කිරීමට ක්‍රම යෝජනා කිරීම.

## 15.3 අධ්‍යයන ප්‍රදේශ




ව්‍යාපෘති ප්‍රදේශය අංක 2.1 රූපය මගින් දැක්වේ. ව්‍යාපෘති ප්‍රදේශය තෝරා ගැනීමේදී එම ප්‍රදේශයේ ඉඩම් පරිහරණ සිතියම් හා භූජල සිතියම් සහ ප්‍රදේශයේ ජල සම්පත් මණ්ඩලය භූජල විද්‍යාත්මකව ලබා ඇති අත්දැකීම්ද උපයෝගී කර ගන්නා ලදී. විශේෂයෙන් කිරිදි ඔය නිම්නයේ පහළ ජලධර ප්‍රදේශයේ පවතින වැලි ජලධර ප්‍රදේශය පිළිබඳව සැලකිලමත් වනු ලැබේ.

### 15.2 ඉඩම් පරිහරණය

මෙම ව්‍යාපෘති ප්‍රදේශය ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ ප්‍රදේශය ආශ්‍රිත වන අතර බොහෝ ප්‍රදේශ වගුරු බිම් සහ කුඹුරු යායවල් වලින් සමන්විතය. ලුණුගම් වෙහෙර හා තිස්සමහාරාම ප්‍රදේශ ආශ්‍රිතව කෘෂි කාර්මික කටයුතු ලෙස වී වගාව, එළවළු, කෙසෙල්, රතු ළූණු සහ පැපොල් වගා කෙරෙන අතර බොහෝ ගොවි බිම් ලුණුගම්වෙහෙර ජලාශ ව්‍යාපෘතියද, තිස්සමහාරාම පැරණි වැව් පද්ධතිය ආශ්‍රිතව පවතී.

### 15.3 භූ විද්‍යාව

භූ විද්‍යාත්මකව ප්‍රදේශයේ පවතින ප්‍රධාන පාෂාණ වන්නේ හෝන්බ්ලෙන්ඩ්, බයෝටයිට් නයිසර්, චානුකනයිට්, මිග්මනයිට්, ග්‍රැනටික් නයිසර්, ග්‍රානට් සිලිමනයිට් නයිසර්, ක්වාට් සයිටර් සහ මිශ්‍ර විපරිත අවසාධිත වේ. මෙම ප්‍රාග් බේන්ද්‍රීය යුගයේ පාෂාණ වලට අමතරව මෑත කාලීන තැන්පතු ලෙස දියළු පස්, සිලිකා වැලි, මැටි මිශ්‍ර පාංශු කලාප පවතී.

15.4 දියළු නිධි

මෑත කාලීන දියළු නිධි, කිරිදි ගංගා ධාරයේ පිටාර කලාප වල පවතී. මෙම කලාපයන්හි මීට අමතරව වැලි තට්ටු සහ වැලි මිශ්‍ර මැටි තට්ටු පවතී. ගංගාවේ අතු ගංගා ආශ්‍රිතවද මෙම දියළු තැන්පතු හඳුනාගත හැක. ඉතා ඉහළ කෘෂි කාර්මික විභවයක් ඇති මෙම නොගැඹුරු නිධි පොළව මතු පිට සිට මීටර් 6-8 පමණ ගැඹුරට දළ වශයෙන් පවතින අතර නොගැඹුරු භූගත ජල විභවය සාපේක්ෂව ඉහළ අගයක් ගනී.

15.5 වැලි නිධි

සණීභවනය නොවූ වැලි නිධි ව්‍යාපෘති ප්‍රදේශයේ වෙරළ කලාප ආශ්‍රිතව පවතී. තවද හොඳින් වර්ධනය වූ මධ්‍ය මට්ටමේ ගැඹුරකින් යුත් වැලි නිධි තණමල්විල ප්‍රදේශයෙන්ද හඳුනාගත හැකිය. මෙම නිධි පිරිසිදු භූගත ජලය සහිත කුඩා පොකට් ලෙස පවතින අතර පානීය ජලය ලබා ගැනීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

15.6. විපරිත අවසාධිත

ප්‍රදේශයේ පවතින ක්වාට් සයිට, සිලිකා ෂිස්ට්, ග්‍රානට් සිලිමනයිට් නයිසර් සහ ක්වාට් පෙල්ස්ෆා, ග්‍රැනුලයට් වැනි පාෂාණ ස්ථර විපරිත අවසාධිත ලෙස හඳුනාගත හැක. මෙම තද පාෂාණ ස්ථාන සහිත ප්‍රදේශයේ භූගත ජල සහිත පැලුම් කලාප වර්ධනය විය හැක.

15.7 ලැටරයිට

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලැටරයිට හෙවත් කබොක් තට්ටු පවතින අතර ව්‍යාපෘති ප්‍රදේශයේද උස්බිම් ආශ්‍රිතව මෙම ලැටරයිට නිධි හඳුනාගත හැකිය. මෙම නිධි වල භූගත ජලය රඳා පැවතීමේ හැකියාව ඇත.

15.8 සණීභවනය නොවූ වැලි නිධි

මෑත කාලීන යුගයේ තැන්පත් වූ මෙම වැලි නිධි බොහෝදුරට වෙරළාශ්‍රිතව පවතී. මෙම නිධි වල විශේෂත්වය නම් ඒවා සුළගේ ක්‍රියාකාරීත්වය මගින් වෙරළතීරුවට සාමාන්තරව තැන්පත් වී පැවතීමයි. මෙම වැලි නිධි ආර්ථික වශයෙන් ඉහළ ඛණිජමය වටිනාකමකින් යුක්තය.

## 15.2.1 භූ ජල විද්‍යාත්මක තත්වය

a) කිරිදි ඔය ද්‍රෝණියේ පවතින ප්‍රධාන ජලධර

මෙම ප්‍රදේශයේ ප්‍රධාන ජලධර පහත සඳහන් පරිදි වේ.

1. දියළු නිධි
2. වෙරළාශ්‍රිත වැලි නිධි
3. ලැටරයිට නිධි
4. පැලුම් කලාප සහිත තද මව් පාෂාණ තට්ටු

b) කාලගුණික හා දේශගුණික තත්වය

මෙම නියමු ප්‍රදේශය පහත රට වියළි කලාපයට අයත් වන අතර, රූපය 2 මගින් එහි වර්ෂාපථන රටාව දක්වා ඇත. ඒ අනුව එහි වාර්ෂික දළ වර්ෂාපථනය මිලි මීටර් 1100 සිට මිලි මීටර් 1600 අතර පවතී. තවද මින් වැඩි වර්ෂාපථනයක් ඔක්තෝම්බර් සිට ජනවාරි දක්වා ලැබෙන අතර, ජුනි සිට සැප්තැම්බර් දක්වා දැඩි වියළි කාලගුණික තත්වයක් පවතී. මෙම ප්‍රදේශයෙහි නිරත දිග හා ඊෂාන දිග මෝසම් දෙක මගින් වර්ෂාව පවතී. වාර්ෂික උෂ්ණත්වය 29°C හා 35°C අතර පවතී. එසේම ප්‍රදේශයේ අර්ද්‍රතාවද දිවා කාලයේ 76% ක් පමණ සහ රාත්‍රී කාලයේ 89% පමණ ඉහළ අගයකින් පවතී.

Figure 2.2: 75% of monthly rainfall probability of the study area




### 15.2.2 භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ සහ පරීක්ෂණ නල ළිං ඉදි කිරීම

a) භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ

ප්‍රදේශයේ පවතින භූ විද්‍යාත්මක තත්වයන් සලකා පර්යේෂණ නල ළිං ඉදි කොට ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මකතාවය ඉදිරිපත් කිරීමට කටයුතු යොදන ලදී. ළිං ඉදි කිරීමට ප්‍රථම භූ ජල විද්‍යාත්මක හා භූ භෞතික ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදුකොට ළිං ඉදි කිරීමට වඩාත් සුදුසුම ස්ථාන සහ ඉදිකල යුතු ගැඹුර ආදිය නිර්ණය කරනු ලැබේ. රූපය අංක 1 මගින් භූ භෞතික විද්‍යා සමීක්ෂණ සිදු කිරීම දැක්වේ.

භූ සමීක්ෂණයට පෙර නල ළිං ඉදිකිරීමට නියමිත ප්‍රදේශයේ සාමාන්‍ය ළිං වලින් ජල සාම්පල එක්රැස් කොට ඒවා රසායනිකව විශලේෂණය කරනු ලැබේ. එමගින් භූගත ජලයේ ඇති නයිට්‍රේට්, බැරලෝහ, පොස්පේට වැනි රසායනික පරාමිති නිර්ණය කරන ලදී.





b) පර්යේෂණ නල ළිං ඉදි කිරීම

ඉහත සිදු කරන ලද සමීක්ෂණ වලට අනුකූලව අදාල ස්ථානයන්හි පරීක්ෂණ නල ළිං ඉදිකරනු ලැබේ. මෙම ළිං මව් පාෂාණ තට්ටුව දක්වා අගල් 6 ½ විෂ්කම්භය දක්වා ඉදිකොට පරීක්ෂණ නල ළිං සහිත නාම පුවරු සවිකොට ප්‍රදේශයේ ජනතාව දැනුවත් කරන ලදී. මෙම ළිං වලින් ජල සාම්පල එක්රැස් කිරීම, ජල මිණුම් එක්රැස් කිරීම හා පොම්ප පරීක්ෂණ සිදු කර ජලයේ ප්‍රමාණාත්මකතාව පිළිබද දත්ත එක්රැස් කිරීම සිදු කෙරේ. තවද විදුම් එක්රැස් කිරීමේදී එකතු කල පස් සාම්පල් විශ්ලේෂණය මගින් ජල ධරයන්හි ස්වභාවය හදුනා ගැනීමට උපයෝගී කර ගන්නා ලදී.



## 15.2.3 ජල සාම්පල රසායනික විශ්ලේෂණ සහ ජල මට්ටම් මිනුම් ලබා ගැනීම

a) ජල සාම්පල් එක්රැස් කිරීම

තෙත් සහ වියළි කාල වලදී රසායනික විශ්ලේෂණය සදහා ජල සාම්පල් එක්රැස් කරන ලදී. විද්‍යුත් සන්නායකතාවය, TDS , ලවණතාවය , ආම්ලිකතාවය, නයිට්‍රේට් ප්‍රමාණය, පොස්පේට් ප්‍රමාණය, සහ ජලයේ පවතින යකඩ ප්‍රමාණය ක්ෂේත්‍රයේදී පරීක්ෂා කරන ලද අතර අනෙකුත් පරාමිතීන් විද්‍යාගාර පරීක්ෂණ සදහා විද්‍යාගාර වෙත ලබාදෙන ලදී. මෙහිදී එක්රැස් කරන ලද ජල සාම්පල වල ප්‍රමාණය සහ පරීක්ෂණ ක්‍රියා මාර්ග පහත වගුවේ දැක්වේ.





| Sample | Amount (ml) | Acidified by, | Amount (ml) | Parametrs |
|---|---|---|---|---|
| 1 | 100 | - | - | Appearance, Colour, Turbidity, pH ,EC ,Total hardness, TDS, Total Iron, Ca, Mg, Total Alkalinity, Cl, SO4, Anion Cation, Charge balance, F, Salinity |
| 2 | 100 | Concentrated Nitric | 2 | Heavy metals, Na, K |
| 3 | 100 | Concentrated Sulfuric | 2 | Nitrate and phosphate |

**Table 4.2 In-situ testing methods**

| No. | Parameter | Method | Instrument |
|---|---|---|---|
| 01 | Nitrate, Phosphate and Total Iron | Colorimetry method | Colori meter |
| 02 | pH | | pH meter or multi meter |
| 03 | EC, TDS, Salinity | | EC meter or multi meter |

## 15.2.4 ජල ධාරිතා පරීක්ෂණ

a) හැදින්වීම

ජල ධාරිතා පරීක්ෂණයක් යනු ළිදෙහි ශබ්‍යතාවය පිළිබඳව පරීක්ෂා කර බැලීමේ පරීක්ෂණයක් වේ. එහි ආරක්ෂිත ධාරිතාවය, ළිදෙහි ජල ප්‍රමාණයට බලපෑම් ඇති කරන කාලය , අදාල ජල ධරයේ රදාපවතින ජල ප්‍රමාණය ජල ධරය තුල අඩංගු සම්ප්‍රේෂණය වීමේ සීඝ්‍රතාවය මතුපිට ජලය හා ජල ධරයේ ඇති අහිතකර සම්බන්ධතාවය ආදී පරාමිතීන් මෙහිදී නිරීක්ෂණය කෙරේ. මෙම නිරීක්ෂණයේදී ළිදෙහි ජල මට්ටමෙහි විචලනය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

b)

2015 වර්ෂයේදී ඉදි කරන ලද පරීක්ෂණ නල ළිං ආශ්‍රිතව සවිස්තරාත්මක පොම්ප පරීක්ෂණ සිදු කරන ලදී. මෙහිදී පොම්ප පරීක්ෂණ සදහා නියමිත ක්‍රමවේද භාවිතා කොට අදාල ජල ධරයන්හි ජලයේ ප්‍රමාණාත්මක මිනුම් ලබා ගැනීමට අවශ්‍ය දත්ත එක්රැස් කරන ලදී.

ඒ අනුව එම ප්‍රදේශය ඉහළ භූගත ජල විභවයකින් යුක්ත බවද ගුණාත්මකභාවය බොහෝ සෙයින් පානීය ජලය ලෙස භාවිතා කිරීමට සුදුසු බවද සොයා ගන්නා ලදී.

c) නිගමන හා නිර්දේශ

මෙම අධ්‍යයන ප්‍රදේශය සාමාන්‍ය ජනගහණ තත්වයකින් යුක්ත නාගරික ප්‍රදේශයක් ඇතුලත් කෘෂිකාර්මික ප්‍රදේශයකි. කුඩා හා මධ්‍ය ප්‍රමාණයේ කර්මාන්ත, සංචාරක කර්මාන්තද පවතින අතර ජල අවශ්‍යතාවය සපුරාලීමේදී භූගත ජලය ප්‍රධාන තැනක් ගනී. කිරිදි ඔය ගංගා නිම්නයේ පහත කොටසෙහි ඇති වැලි ජල ධර මේ සඳහා බොහෝ ප්‍රෙයා්ජනවත් වන බව අධ්‍යයන දත්ත වලින් සනාථ වේ. කෙසේ වුවද , භූගත ජලය ලබා ගැනීම මනා පාලනයකින් යුක්තව දිගින් දිගටම ජල මට්ටම් මිනුම් කිරීම, ජලයේ ගුණාත්මකභාවය වරින් වර විශ්ලේෂණය කිරීම ආදී විමර්ෂණ කටයුතු වලින් යුතුව කාර්යභාවයකින් යුතුව පවත්වා ගත යුතුය.තවද අධි විභවයකින් යුත් මෙම ජල නිධිවල නියම ස්වභාවය මැනීමට කැණීම් සුදුසු ඉහල සීඝ්‍රතාවයකින් ජලය පොම්ප කලහැකි ජල පොම්ප මණ්ඩලය සතු නොමැති බැවින් ඉතා ඉහළ දත්ත ලබා ගැනීමට සුදුසු ජල පොම්ප ජල සම්පත් මණ්ඩලයට ලබාදීම වැදගත් වේ.

d) නිර්දේශ

1 පරීක්ෂණ මගින් මෙම ප්‍රෙද්ශයේ භූගත ජලය කර්මාන්ත අපද්‍රව්‍ය මගින් දූෂණය වීම සිදුවී නොමැති බව හෙලිවේ.

එසේ වුවද වී වගාව වැනි කෘෂි කාර්මික කටයුතු පවතින බැවින් එමගින් කෘෂි කාර්මික පොහොර හා කෘෂි රසායන මගින් සිදුවිය හැකි බලපෑම් පිළිබඳව තව දුරටත් පරීක්ෂණ සිදු කල යුතුය.

2. මෙම ප්‍රෙද්ශයේ භූගත ජලය නැවත ආරෝපණය වීම (Groundwater Recharge)වර්ෂාපතනය සිදුවන අතර ප්‍රෙද්ශයේ පවතින වැව් සහ වාරි පද්ධති මේ සඳහා බෙහෙවින් උපකාරී වේ. එබැවින් එම කුඩා වැව් සහ අනෙකුත් මතුපිට ජල ප්‍රභව පුනරුත්ථාපනය කිරීම සඳහා ජල ධාරිතාවය වැඩි කිරීම ඉතා ප්‍රයෝජනවත් වේ.

3. තව දුරටත් වඩාත් නිවැරදිව භූගත ජලයේ ප්‍රමාණාත්මකතාවය නිරීක්ෂණ කිරීම අධි සීඝ්‍රතාවයකින් යුත් ජල පොම්ප භාවිතා කර වියළි කාලයේදී ජල ධාරිතා පරීක්ෂණ සිදු කිරීම සුදුසු වේ.

4. දැනට බොහෝ රටවල ව්‍යාපාර වන භූගත ජල මොඩල වැනි නවීන ක්‍රමවේද හඳුන්වාදීම ඉදිරියේදී මෙම වටිනා භූගත ජලධර තිරසරව සංවර්ධනය කිරීමට ඉවහල් කරගත යුතු වේ.

## 16. විද්‍යාගාරය

ජල සම්පත් මණ්ඩලයේ රසායනාගාරය මගින් විවිධ ව්‍යාපෘති යටතේ එක්රැස් කරනු ලබන ජල නියැදීන් මෙන්ම වාණිජමය කාර්යයන් යටතේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන මෙන්ම පුද්ගලයින් මගින් කරනු ලබන ඉල්ලීම මත ජල නියැදීන් 1787ක් රසායනිකව විශ්ලේෂණය කරන ලද අතර ජල නියැදීන් 856ක් සම්පූර්ණ රසායනික පරීක්ෂාව ද සිදු කරන ලදි.

## 17. විදුම් අංශය

| | |
|---|---|
| නල ළිං ඉදිකිරීම | 762 |
| කොන්ක්‍රීට් බේසින්ස් | 08 |
| නල ළිං අළුත්වැඩියා කිරීම | 129 |
| පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 08 |
| අත් පොම්ප සවි කිරීම | 253 |
| නල ළිං පිරිසිදු කිරීම | 63 |
| නල ළිං පුනරුත්තාපනය කිරීම | 06 |

# 18. රත්මලාන වැඩබිම

## 18.1 සාමාන්‍ය වැඩබිම

* අංක GL – 1833 දරණ ලොරි රථයේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.
* ජල ධාරිතා පරීක්ෂණ වාහන 2ක් සඳහා ආයුධ පෙට්ටි 6ක් සහ පයිප්ප වැද්දුම් සාදා නිම කිරිම.
* භූගත ජලය පිළිබඳ දත්ත සැකසුම් 10ක් සඳහා ලිං ආවරන සෑදීම.
* විදුම් යන්ත්‍ර අංක 15 සඳහා රොඩ් රඳවා ගැනීමේ සැකසුමක් සාදා නිම කිරීම.
* ජල ටැංකි සඳහා ජල ටැංකි අට්ටාල 20ක් සාදා ගැනීම.
* මොණරාගල රෝහලෙහි ජල පිරිපහදු යන්ත්‍රයේ (ජල සම්පත් මණ්ඩලය විසින් සාදන ලද) අලුත්වැඩියා කටයුතු හා සේවා කටයුතු සිදුකර අවසන් කිරීම.
* විදුම් යන්ත්‍ර 14හි හයිඩ්‍රොලික් පද්දතියෙහි අළුත් වැඩියා කටයුතු කිරීම.
* අඩි 35ක් උස ජල කුළුනු 5ක් සාදා සවිකර (ගෝනගංආර, බිබිල,බුද්ධම, පොළොන්නරුව හා මන්නාරම යන ප්‍රදේශ වල) අවසන් කිරීම.
* ජලයේ ගිල්වන ලද වතුර පොම්පයක් හා පෙරනයක් ගෝණගංආර ප්‍රදේශයේ සවිකර නිම කිරීම.
* වාහන අංක 40 ශ්‍රී 1851 හි රියදුරු කුටියෙහි තහඩු වැඩ හා පින්තාරු කිරීම අවසන් කිරීම.
* වාහන අංක 40 ශ්‍රී 4243 හි රියදුරු කුටියෙහි තහඩු වැඩ හා පින්තාරු කිරීම, තිරිංග සහ විදුලි පද්දතියෙහි අළුත්වැඩියා නිම කිරීම.
* රත්මලාන ගොඩනැගිල්ලෙහි අළුත්වැඩියා කටයුතු අධීක්ෂනය කිරීම (කොන්ත්‍රාත් කරු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව.

- සියළුම නඩත්තු කටයුතු (විදුම් යන්ත්‍ර, වාහන සහ අනෙකුත් යන්ත්‍රවල) සිදු කිරීම.

## 18.2 වාහන අලුත්වැඩියා කිරීමේ ඒකකය.

* මේ යටතේ අලුත්වැඩියා කටයුතු 60ක් පමන සිදු කරන ලදි.

## 18.3 වාහන සේවා ඒකකය.

* මණ්ඩලයේ වාහන 103ක සම්පූර්ණ සේවා කටයුතු වර්ෂය තුලදී සිදු කරන ලදි.

## 18.4 බර වාහන අළුත්වැඩියා කිරීමේ ඒකකය.

පහත සදහන් බර වාහන අළුත්වැඩියා කටයුතු සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලදි.

* විදුම් යන්ත්‍ර අංක 14 සහ 15
* වායු පීඩන යන්ත්‍ර - 22
* වේලි ආරක්ෂන ව්‍යාපෘතිය යටතේ ලබා දුන් විදුම් යන්ත්‍ර සහ වායු පීඩන යන්ත්‍ර වල ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.

## 19. අභ්‍යන්තර විගණක අංශය

2016 වර්ෂය තුල විගණන විමසුම් 17ක් ඉදිරිපත් කරන ලද අතර විගණකාධිපති දෙපාර්තමෙන්තුව විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 15කට පිළිතුරු සපයන ලදි.

## 20. ගිනුම් අංශය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ආදායම රු. මිලියන 136.0 ක් විය. 2016 වර්ෂය සදහා පුනරාවර්ථන වියදම් ලෙස රු. මිලියන 155.0 ක් ද ප්‍රාග්ධන ලෙස රු. මිලියන 34.0 ක් ද මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදි. වර්ෂය තුල වාර්ථාගත අතිරික්තය රු. මිලියන 27.0 ක් විය.

## 21. පාලන අංශය

2016 වර්ෂයේ දී ජල සම්පත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 329ක් විය. කොන්ත්‍රාත් පදනමේ සේවකයින් 04ක් ද අන්යම් පදනමේ සේවකයින් 56ක් ද මීට ඇතුලත්ය. සමාලොචිත වර්ෂය තුල සේවකයින් 05 දෙනෙකුගේ සේවය ස්ථිර කරන ලදි. මෙම වර්ෂයේදී සේවකයින් 06 දෙනෙකු ජල සම්පත් මණ්ඩලයේ සේවයෙන් ඉල්ලා අස්වු අතර 15 දෙනෙකු සේවයෙන් විශ්‍රාම ලබා ගන්නා ලදි.

## 22. මානව සම්පත් සංවර්ධනය

මණ්ඩලයේ ඵලදායීතාවය ඉහල නංවාලීමේ අරමුණ පෙරදැරිව සේවකයින් පුහුණු වැඩසටහන් සදහා යොමු කරවන ලදි. මේ යටතේ විධායක නිලධාරීන් ද ඇතුලුව සේවකයින් 29 දෙනෙකු කෙටි පාඨමාලා සදහා යොමු කරවන ලදි. වැඩමුළු සහ සම්මන්ත්‍රණ සදහා සේවකයින් 10 දෙනෙකු සහභාගී කරවන ලද අතර විදේශ වැඩමුළු සදහා එක් අයෙක් යොමු කරවන ලදි.

## 23. සුභ සාධක පහසුකම්

සමාලෝචිත වර්ෂය තුල සුභ සාධක හා මරණාධාර ක්‍රමය යටතේ අවමංගල්‍යක් සදහා ප්‍රවාහන වියදම් සහ සුභ සාධක වියදම් ලෙස රු. මිලියන 0.104 ක මුදලක් ජල සම්පත් මණ්ඩලයේ සුභ සාධක සංගමය වෙත ලබා දෙන ලදි. එසේම මණ්ඩලයේ සේවක සේවිකාවන් හට ලබා දුන් වෛද්‍යාධාර මුදල් ප්‍රතිපූර්ණය කිරීම සදහා රු. මිලියන 0.772ක මුදලක් ලබා දෙන ලදි.

## 24. ප්‍රවාහන අංශය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලය සතුව වාහන 69 ක් පැවත් අතර ඉන් 63ක් ධාවන තත්වයේ පැවතුණි. මෙම වාහන ප්‍රමාණයට කැබ් රථ, කාර්, ජීප්, ලොරි, ට්‍රැක්ටර් සහ ක්‍රේන් යන්ත්‍ර ඇතුලත් විය.

## 25. අනුරාධපුර සංචාරක බන්ගලාව

ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන්ට සහ වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යංශයේ නිලධාරීන් වෙත සිය රාජකාරීමය සහ පුද්ගලික චාරිකා වලදී නවාතැන් පහසුකම් මෙම සංචාරක බංගලාව මගින් සපයන ලදි. ඊට අමතරව රාජ්‍ය නිලධාරීන්ට සහමහජනතාවට ද නවාතැන් පහසුකම් සපයන ලදි.

## 26. බෞද්ධ සංගමය

ජල සම්පත් මණ්ඩලයේ බෞද්ධ සංගමය 1999 මැයි මස 05වන දින ආරම්භ කරන ලදි. 2016 වසරේ දී පොසොන් පොහෝ දිනය නිමිති කර ගනිමින් ප්‍රධාන කාර්යාල පරිශ්‍රය අලංකාරවත් ලෙස සරසා මණ්ඩලයේ සේවය කොට මිය ගිය සියළු දෙනා සිහිපත් කර ඔවුන්ට පින් පතා ධර්ම දේශනාවක් හා දන්සලක් පවත්වන ලදි. ඊට අමතරව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යංශය මගින් පවත්වන ලද වෙසක් බැති ගී සරණියට ද මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් පිරිසක් සහභාගී කරවන ලදි.

## 27. ස්තුතිය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය තුමාටත්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය තුමාටත්, එම අමාත්‍යංශවල ලේකම් තුමන්ලාටත්, නිලධාරී හා සේවක මහත්ම මහත්මීන්ටත්, අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තුවල, සංස්ථා සහ මණ්ඩල වල, විදේශ සහ පුද්ගලික ආයතන වල නිලධාරීන්ට සහ උපදේශකවරුන්ටත් මණ්ඩලයේ ස්තුතිය පිරිනමමි. ජල සම්පත් මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් විසින් ලබාදෙන ලද ක්‍රියාශීලී දායකත්වය සහ උදාර සේවයද ඉතා ඉහලින් අගය කරමි.

ඉංජි. **ඒ.සී.එම්. සුල්ෆිකාර්**
**සභාපති**
**ජල සම්පත් මණ්ඩලය**
**2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,**
**කොලඹ 07**

**එම්.ඒ. ජ්ෂ්පකුමාර**
**සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)**
**ජල සම්පත් මණ්ඩලය**

28.02. 2017

**ජල සම්පත් මණ්ඩලය**

**නො . 2 ඒ හෙක්ටර් කොබ්බෑකඩුව මාවත**

## ජල සම්පත් මණ්ඩලය

### මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා<br>ඇස්තමේන්තුගත | සටහන් | සත්‍ය<br>2016<br>රු.000' | සත්‍ය<br>2015<br>රු.000' | 2016<br>රු.000' |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදාය | 01 | 133,573 | 84,164 | 148,800 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - පුනරාවර්ථන | | 155,000 | 141,000 | 155,000 |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන (මෙහෙයුම්) | 02 | 34,003 | 27,896 | 33,150 |
| වෙනත් ආදායම් | 03 | 2,850 | 6,82 | 8,500 |
| **මුළු ආදායම** | | **325,426** | **259,884** | **345,450** |
| | | | | |
| පරිපාලන වියදම් | 4.1 | (172,763) | (188,944) | (170,190) |
| සැපයුම් සහ අවශ්‍යතා | 4.2 | (28,456) | (34,983) | (26,000) |
| කොන්ත්‍රාත් ගත සේවා හා නඩත්තු | 4.3 | (22,728) | (17,031) | (17,220) |
| වෙනත් මෙහෙයම් වියදම් | 4.4 | (10,323) | (1,485) | (3,980) |
| වෙනත් ව්‍යාපෘති වියදම් | 4.5 | (26,533) | (20,319) | (28,300) |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - (ප්‍රාග්ධන පර්යේෂණ අධ්‍යනයන්) | 4.6 | (34,003) | (27,896) | (33,150) |
| ක්ෂයවීම් | | (3,526) | (68,626) | (66,000) |
| **මුළු වියදම** | | **(298,332)** | **(359,284)** | **(344,840)** |

| | | | |
|---|---|---|---|
| **මෙහෙයුම් වලින් ලාභ /පාඩු** | **27,094** | **(99,400)** | **610** |
| බදු | (2) | (10) | - |
| **කාල පරිච්ඡේදය සඳහා ලාභ / (පාඩු)** | **27,092** | **(99,410)** | **610** |

**ජල සම්පත් මණ්ඩලය**

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

| **දෙසැම්බර් 31 දිනට** | **සටහන්** | 2016 | 2015 |
|---|---|---|---|
| | අංකය | රු.000' | රු.000' |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 05 | 7,981 | 11,024 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 06 | 29,575 | 16,341 |
| තොග | 07 | 149,225 | 153,956 |
| කලට පෙර ගෙවීම් | 08 | 223 | 112 |
| | | **187,004** | **181,433** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත හා උපකරණ | 09 | 377,626 | 548,867 |
| | | 377,626 | 548,867 |
| **මුළු වත්කම්** | | **564,630** | **730,300** |

## වගකීම්

## ජංගම වගකීම්

| | | | |
|---|---|---|---|
| **වෙළඳ ණය හිමියෝ** | 10 | 422 | 2,283 |
| වෙනත් වෙන්කිරීම් හා ගෙවිය යුතු දෑ | 11 | 51,849 | 23,683 |
| විලම්භිත ආදායම (සේවා අත්තිකාරම්) | 12 | 21,413 | 11,370 |
| | | **73,684** | **37,336** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත වගකීම් - පාරිතෝෂික | 13 | 64,994 | 90,855 |
| ආරක්ෂක තැන්පතු | 14 | 2 | 14 |
| විලම්භිත ආදායම (රජයේ ප්‍රදාන සඳහා) | 15 | 310,900 | - |
| | | **375,896** | **90,869** |
| **මුළු වගකීම්** | | **449,580** | **128,205** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | | **115,050** | **602,095** |
| | | | |
| **ශුද්ධ වත්කම් /ස්කන්ධය හා සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 16 | 272,725 | 329,505 |
| විදේශාධාර | 16 | 233,273 | 802,079 |
| සමුච්චිත ලාභ/(අලාභ) | 16 | (392,120) | (532,052) |
| ප්‍රත්‍යාගණන සංචිතය | 16 | 1,172 | 2,563 |
| **මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය** | | **115,050** | **602,095** |

මෙම ගිණුම් ප්‍රකාශන සමස්ත පරිපූර්ණය සඳහා අවශ්‍යය වන ගණකාධිකරණ ප්‍රමිතීන් හා සටහන් පිටු අංක 06 සිට 22 තෙක් මණ්ඩලයේ පවත්නා වාර්තාවලට අනුව ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා නිවැරිදිබවට මා විසින් සහතික කරමි.

අත්. කලේ. ඒ. බී. එම්. චන්ද්‍රසිරි

සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමතකර අත්සන් කලෙමි.

අත්. කලේ. ඒ. සී. එම්. සුල්ෆිකාර්
සභාපති,
ජල සම්පත් මණ්ඩලය.

අත්. කලේ. එම්.එස්.සතිස් කුමාර
අධ්‍යක්ෂ

**2016.07.26**

## ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය

### දෙසැම්ර් 31 දිනට

**සටහන: 15**

| | **සමුච්චිත අරමුදල රු.'000** | **විදේශා ධාර රු.'000** | **ප්‍රත්‍යාගනන අතිරික්තය රු.'000** | **සමුච්චිත ලාභ/අලාභ රු.'000** | **එකතුව රු.'000** |
|---|---|---|---|---|---|
| **2014 දෙසැම්බර් 31 දිනට ඉ/ගෙ ශේෂය** | **212,621** | **228,322** | **2,563** | **(368,631)** | **74,875** |
| පසුගිය කාලපරිච්ඡේද වල සිදුවීම්සඳහා කරන ලද ගැලපීම් | - | - | - | (64,011) | (64,011) |
| ප්‍රති ප්‍රකාශිත ශේෂය | 212,621 | 228,322 | 2,563 | (432,642) | 10,864 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | - | - | - | (99,410) | (99,410) |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | - | - | - | - | - |
| වසර සඳහා දායකය/එකතුකිරීම් | 704 | - | | - | 704 |
| වෙනත් ප්‍රදාන/දායක | 116,180 | 573,757 | - | - | 689,937 |
| **2015 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **329,505** | **802,079** | **2,563** | **(532,052)** | **602,095** |
| **2015 දෙසැම්බර් 31 දිනට පහලට ගෙනා ශේෂය** | **329,505** | **802,079** | **2,563** | **(532,052)** | **602,095** |
| පසුගිය කාලපරිච්ඡේද වල සිදුවීම්සඳහා කරන ලද ගැලපීම් | - | - | - | (112,840) | 112,840 |
| ප්‍රති ප්‍රකාශිත ශේෂය | **329,505** | **802,079** | 2,563 | (419,212) | 714,935 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2016 වසර සඳහා ශුද්ධ වත්කම් /** | | | | | |
| **ස්කන්ධය වෙනස්වීම්** | **2,563** | **-** | **(2,563)** | **-** | **-** |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | - | - | - | 27,092 | 27, 092 |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | (66,943) | (568,806) | - | - | (635,749) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | 1,172 | - | 1,172 |
| **අමාත්‍යංශ අරමුදලින් මිලදීගත් වත්කම්** | 7,600 | - | - | - | 7,600 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **272,725** | **233,273** | **1,172** | **(392,120)** | **115,050** |

**සටහන :-** වෙනත් ප්‍රදාන පිළිබඳ විස්තර පහත දැක්වේ. **2016.12.31 දිනට ශේෂය**

| **වෙනත් ප්‍රදාන** | **රු.'000** |
|---|---|
| ජයිකා | 11,973 |
| ජාතික ජල සම්පත් අධිකාරිය ඒ.ඩී.බී. | 1,025 |
| වෙනත් | 24,624 |
| ජපන් 2 කේ.ආර්. ව්‍යාපෘතිය | 81,476 |
| ඇමරිකානු සමාගමේ ආධාර | 1,771 |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය | 112,404 |
| **එකතුව** | **233,273** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | **2016** | **2015** |
|---|---|---|
| | **රු.'000** | **රු.'000** |
| **මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ප්‍රතිපාදන - (පුනරාවර්ථන) පෙර වර්ෂයේ ලාභය/(අලාභය) | **(127,908)** | **(240,410)** |
| **එකතුකලා:** භාණ්ඩාගාර ප්‍රතිපාදන - (පුනරාවර්ථන) ලැබීම් | **155,000** | **141,000** |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | **27,092** | **(99,410)** |
| **එකතුකලා:**ව්‍යාපෘතිවල අරමුදල් ගැළපීම | 5,949 | - |
| **එකතුකලා:**පසුගිය වසර ගැළපීම් | (475) | - |
| | 32,566 | (99,410) |

| | | | | |
|---|---|---|---|---|
| **මූල්‍ය නොවන සංචලනයන්** | | | | |
| ක්ෂයවීම් | 3,526 | | 68,626 | |
| වත්කම් හා තොග සඳහා ගැලපීම් | - | | 25,991 | |
| පාරිතෝෂික වෙන්කිරීම් වැඩිකිරීම | (16,180) | | 20,377 | |
| ගෙවිය යුතු දෑ වැඩිවීම | (1,435) | | 1,918 | |
| වෙනත් ජංගම වත්කම් වැඩිවීම | 4,620 | | (9,197) | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් [ලාභය] / පාඩුව | (241) | | (4,945) | |
| ලැබිය යුතු දෑ වැඩිවීම | (13,234) | | 4,286 | |
| පාරිතෝෂික ඉතිරිකිරීම්වලින් ලද පොලී ලැබීම් | (116) | (23,060) | (235) | 106,821 |
| **මෙහෙයුම් කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **9,506** | | **7,411** |
| **ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | | |
| දේපල,පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල | 275 | | 5,036 | |
| දේපල,පිරියත හා උපකරණ මිලදීගැනීම | ( 10,847) | | (2,975) | |
| ආරක්ෂක තැන්පත් වලින් ලද පොලී ආදායම | 1 | | 1 | |
| පාරිතෝෂික ඉතිරිකිරීම්වලින් ලද පොලී ලැබීම් | 116 | | 235 | |
| ආරක්ෂක තැන්පතු ගෙවීම | (13) | | (5) | |
| පාරිතෝෂික ගෙවීම | (9,681) | | (9,228) | |
| **ආයෝජන කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(20,149)** | | **(6,936)** |
| **මූල්‍ය කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය** | | | | |
| රජයේ ප්‍රදාන (දේපල,පිරියත හා උපකරණ සඳහා ප්‍රාග්ධනය) | - | | 704 | |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන | 7,600 | | - | |
| **මූල්‍ය කටයුතු වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **7,600** | | **704** |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /[අඩුවීම** | | **(3,043)** | | **1,179** |
| **වර්ෂයේ මුල මුදල් හා මුදල් සමාන දෑ** | | 11,024 | | 9,845 |
| **වර්ෂයේ අග මුදල් හා මුදල් සමාන දෑ** | | **7,981** | | **11,024** |

- **මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්**

01. මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අතැති මුදල් හා බැංකුවල පවත්නා ශේෂයන්ගෙනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි අඩංගුවන මුදල් හා මුදල් සමාන දෑ සඳහා ඇතුලත් ඇති මූල්‍ය තත්ව ප්‍රමාණ ප්‍රකාශනය පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| | රු.'000 | රු.'000 |
| අතැති මුදල් හා බැංකු ශේෂයන් | 5,850 | 3,047 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ඉතිරි කිරීම් | 2,131 | 7,977 |
| | **7,981** | **11,024** |

02. මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන(ප්‍රාග්ධන) වලින් වූ මුදල් ප්‍රවාහය අන්තර්ගත වී ඇත්තේ මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය තුලය.

## මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අදාලව සටහන්

### 01) සංස්ථාපිත තොරතුරු

- **සාමාන්‍ය**

ජල සම්පත් මණ්ඩලය 1964 අංක 29 දරන පනතේ විධිවිධාන යටතේ 1966 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

- **ප්‍රධාන ක්‍රියාකාරකම් හා එහි ස්වභාවය**

වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් ජල පර්යේෂණ සිදු කිරීම, නළ ලිං ඉදිකිරීම, ජල නියැදි වල රසායනික විශ්ලේෂණය, තැනූ වළ ළිං පිරිසිදු කිරීම සහ භූගත ජල සිතියම් සැකසීම ආදිය ඇතුළත් විය.

- **අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

- **මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යාලයේ ලිපිනය**

අංක 2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07

### 02 වැදගත්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2'1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටුව හා මුදල් අමාත්‍යාංශයේද එකඟතාවය මත නිකුත් කරන ලද රාජ්‍ය අංශ

ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ජල සම්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. (යොමුව : 2013.10.02 දිනැති අංක PED/03/2013 දරණ චක්‍රලේඛය)

ණය ගැනුම් පිරිවැය (අංක : 04) සහ විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් වල බලපෑම (අංක : 05) යන ගිණුම්කරණ ප්‍රමිත වර්තමානයේදී මණ්ඩලයට අදාල නොවේ.

**2.2 සකස් කිරීමේ පදනම**

ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර අතර එය මණ්ඩලයේ කටයුතු කරන මුදල් වර්ගය වන අතර සියලු මූල්‍ය තොරතුරු විශේෂයෙන් සඳහන් කර නොමැති නම් හැරෙන්නට ආසන්න දහස් ගණනට ඉදිරිපත් කර ඇත.

**03 වත්කම් හා ඒවා ඇගයීමේ පදනම**

**3.1 දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ මුල් වරට පිරිවැයට ගණන් ගෙන ඇති අතර සමුච්චිත ක්ෂය අඩුකල අගය වාර්තා කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීම්/ප්‍රත්‍යාගණන අගය හෝ ඉදිකිරීම සඳහා වැය වන වියදම හා බැඳුණු මූලික වියදම් ද සමග වේ.

ප්‍රත්‍යාගණන කරන ලද වත්කම් ප්‍රත්‍යාගණන අගය අනුව ඉදිරියට ගෙනයනු ලබන අතර පසුකාලීන ක්ෂයවීම් අඩුකරනු ලැබේ.

**3.2 ක්ෂයවීම්**

වත්කම් භාවිතයට ගැනීම සූදානම් වන අවස්ථාවේදී ක්ෂය කරනු ලබන අතර භාවිතයෙන් ඉවත් කරන වත්කම් එසේ හඳුනාගන්නා දිනයේදී ක්ෂයවීම් නතර කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ඒවායේ පිරිවැය/ප්‍රත්‍ය ගණන අගය ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමයටයි. මෙම අරමුණ ඇතිව යොදා ගනු ලබන ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාත මෙසේය.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | - | 5% |
| මෝටර් වාහන | - | 25% |
| යන්ත්‍රෝපකරණ | - | 20% |
| රසායනාගාර උපකරණ | - | 20% |
| විද්‍යාත්මක උපකරණ | - | 20% |
| පරිගණක සහ උපාංග | - | 20% |
| ගෘහභාණ්ඩ සවිකිරීම් | | |

හා කාර්යාල උපකරණ - 10%

**3.3 රජයේ ප්‍රධාන**

භාණ්ඩාගාරයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් අදාල රාජ්‍ය ව්‍යාපෘති වලින් ලබා ගන්නා ලද වත්කම් විලම්බිත ආදායම් ප්‍රවේශය යටතේ හඳුනාගනු ලැබේ. වත්කම් වල ජීවිත කාලය අනුව ක්‍රමානුකූල පදනමක් මත මූල්‍ය කාර්‍යසාධනය පිළිබඳ ප්‍රකාශය තුල ක්ෂය කිරීමේ ගිණුමට හිලව් වන පරිදි විලම්බිත ආදායම (රජයේ ප්‍රධාන වලට සම්බන්ධ) කපාහැරේ.

**3.4 ඉතිරි තොග**

වාහන අමතර කොටස්, ගබඩා ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ අමතර කොටස්, ඉන්ධන සහ අනෙකුත් පාරිභෝජන ද්‍රව්‍ය යනාදියෙන් ඉතිරි තොග සමන්විත වේ. තොග පිරිවැය සමන්විත වන්නේ පළමුව ලබාගත් තොග පළමුව නිකුත්කිරීමේ (FIFO) පදනම මතය.

**3.5 ලැබිය යුතු දෑ**

3.5.1 උපලබ්ධි විය හැකි බවට ඇස්තමේන්තුගත කරන ලද ප්‍රමාණයන්ගෙන් ලැබිය යුතු දෑ ප්‍රකාශ වේ.

3.5.2 බොල්ණය හා අඩමාණ ණය

මෙම ණය සඳහා ඇස්තමේන්තු කල අලාභ පදනම් වී ඇත්තේ සියලු ඉන්වොයිසිවල සහ ගෙවීම් පිළිබඳ සිදුකල අඛණ්ඩ ඇගයීම් ක්‍රමය පදනම් කරගෙනය.

**4.1 ගෙවිය යුතු දෑ සහ උපචිත වියදම්**

වෙළද හා අනෙකුත් ගෙවිය යුතු දෑ පිරිවැයට ඉදිරිපත් කෙරේ.

**විලම්බිත ආදායම**

සේවා ලබා ගැනීම සඳහා ලද අත්තිකාරම්, ආදායම්, ලෙස හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ කලින් ලද ආදායම් ලෙස දැක්වේ.

**4.2 වෙන්කිරීම්**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ පවත්නා බැඳීම් (නෛතික හෝ සම්මුතික) වෙනුවෙන් විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු කල හැකි වීම ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. වියදම් සම්බන්ධයෙන් කරන ලද ප්‍රතිපාදනයන් ප්‍රතිපූර්ණය කිරීම මූල්‍ය කාර්ය සාධනයෙන් ඉදිරිපත් කෙරේ.

**05 ආදායම් හඳුනාගැනීම**

ආදායම් හඳුනාගනු ලබන්නේ ආර්ථික ප්‍රතිලාභ ජල සම්පත් මණ්ඩලයට ගලා එනු ලැබීමේ හැකියාව ඇති වීම සහ ඒවා විශ්වසනීය ලෙස මැනිය හැකි විට මිස ගෙවීම් සිදුකල විට නොවේ.

**ප්‍රධාන ආදායම් මාර්ග**

භූ විද්‍යාත්මක සමීක්ෂණ, නල ළිං ඉදිකිරීම, අත් පොම්ප සවිකිරීම, පොම්ප පරීක්ෂණ, නල ළිං පිරිසිදු කිරීම, ජල සාම්පල විශ්ලේෂණය සහ ජලයේ අඩංගු යකඩ නිශ්සාරණ පෙරණ සවිකිරීම ආදියෙන් වන අතර අදාල කාර්යයන් ඉටුකිරීමෙන් පසු ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**වෙනත් ආදායම්**

සංචාරක බංගලා වෙන්කිරීම්, දඩ, අධිභාර හා විවිධ ආදායම් වලින් වෙනත් ආදායම් සමන්විත වන අතර ඒවා උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

**පොලී ආදායම්**

පොලී ආදායම් මූලික වශයෙන් ආපදා ණය, පාපැදි ණය සහ පාරිතෝෂික ගෙවීම් සඳහා ඉතිරි කිරීම් බැංකුවේ තැන්පතු සඳහා පොලිය යනාදියෙන් සමන්විත වේ.

**06 විශ්‍රාමික පාරිතෝෂික බැඳීම**

**6.1 පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම**

1983 අංක 12 දරණ පාරිතෝෂික මුදල් ගෙවීම සඳහා ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිකය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රතිපාදන වෙන්කර ඇත. සෑම වර්ෂයකම මූල්‍ය වර්ෂය අවසාන මාසය සඳහා වන මූලික වැටුප හා ව්‍යවස්ථාපිත දීමනා වලින් අඩක් වශයෙන් අඛණ්ඩ සේවා කාලයක් සඳහා ප්‍රතිපාදන සලසා ඇත. මෙම අයිතමය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස දැක්වේ.

**6.2 සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් දායක සැලසුම**

සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදලේ දායක මුදල් අදාල ප්‍රඥප්ති සහ රෙගුලාසි වලට අනුකූල වන සේවකයන් සුදුසුකම් ලබයි. සේ.අ.අරමුදල් හා සේ.නි.භා අරමුදල් සඳහා මණ්ඩලයේ දායකත්වය පිළිවෙලින් 12% ක සහ 3% ක් වේ.

**07 බදුකරණය**

බදු වියදම, ප්‍රවර්තන සහ පෙර වර්ෂ සඳහා වන ගැලපීම් වෙනුවෙන් ගෙවිය යුතු බදු මුදල් වලින් සමන්විත වේ.

**08 පර්යේෂණ අධ්‍යයන වියදම**

භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රාග්ධන වැය ශීර්ෂ යටතේ පර්යේෂණ අධ්‍යයන සඳහා සෘජුව හඳුනාගෙන ඇති මෙහෙයුම් පිරිවැය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් ඉදිරිපත් කෙරේ.

**09 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ට අනුව වක්‍ර ක්‍රමය උපයෝගී කරගෙන

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. මෙහෙයුම් කටයුතු වලින්, ආයෝජන කටයුතු වලින් හා මූල්‍යන කටයුතු වලින් ලද දළ මුදල් ගලාඒම් සහ භාවිතයන් එහි හඳුනාගෙන ඇති අතර මුදල් හා මුදල් සමාන දෑ ප්‍රධාන වශයෙන් අතැති මුදල් හා බැංකුවේ පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ.

## 10 වාර්තාකරන දිනෙන් පසු සිදුවීම්

වාර්තා කරන දිනෙන් පසු හඳුනාගනු ලබන සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් අදාල පරිදි මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කිරීමත් අනාවරණය කිරීමත් කරනු ලැබේ

**ජල සම්පත් මණ්ඩලය**

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| **මෙහෙයුම් කටයුතු වලින් ලද ආදායම** | **සත්‍ය 2016** | **සත්‍ය 2015** | **අයවැය 2016** |
|---|---|---|---|
| **සටහන් අංක: 01** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| **භූ ජල සමීක්ෂණ/භූගත ජල ගවේෂණය** | | | |
| භූ ජල සමීක්ෂණ | 23,583 | 10,225 | 18,000 |
| නල ලිං ඉදිකිරීම | 62,650 | 35,495 | 72,000 |
| අත් පොම්ප සවිකිරීම | 3,689 | 5,156 | 9,600 |
| ජල ධාරිතා පරීක්ෂණ | 11,981 | 9,175 | 14,400 |
| නල ලිං පිරිසිදු කිරීම | 1,555 | 1,332 | 1,000 |
| ජල නියැදි විශ්ලේෂණය | 1,682 | 2,162 | 4,500 |
| යකඩ ඉවත්කිරීමේ පිරියත සවිකිරීම | 1,900 | 300 | 1,000 |
| | 107,040 | 63,845 | 120,500 |
| **භූගත ජල අධීක්ෂණය** | | | |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය | 6,698 | 5,001 | 9,000 |
| *උප එකතුව* | **6,698** | **5,001** | **9,000** |
| **භූගත ජල සංවර්ධනය** | | | |
| දින 100 ව්‍යාපෘතිය | - | 11,593 | - |

| | | | |
|---|---|---|---|
| ගෝණගංආර හා රතුපස්කැටිය ව්‍යාපෘතිය | 2,387 | 1,925 | 1,700 |
| චුන්නාකම් ව්‍යාපෘතිය | 2,627 | 1,800 | 2,600 |
| කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා ලිං පිරිසිදුකිරීම | 3,401 | - | 3,400 |
| වියලි කළාපය සඳහා නිෂ්පාදන නලලිං ඉදිකිරීම | 9,851 | - | - |
| සාළාව සිට කොළඹ දක්වා ලිං පිරිසිදුකිරීම | 1,569 | - | 1,600 |
| සුලු පරිමාණ ජල සැපයුම් ව්‍යාපෘති | - | - | 10,000 |
| . *උප එකතුව* | **19,835** | **15,318** | **19,300** |
| **මුළු එකතුව** | **133,573** | **84,164** | **148,800** |

**සටහන් අංක: 02**

**භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන**

**(පර්යේෂණ අධ්‍යනයන් - මෙහෙයුම්)**

| | | | |
|---|---|---|---|
| කොළඹ සිට මීගමුව දක්වා ඇති වෙරළබඩ ජල ධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය | 210 | 230 | 250 |
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ස්ථරවල ජලයේ ගුණත්වය වෙනස්වීම් අධ්‍යනය | 238 | 280 | 250 |
| පුනරුත්ථාපන හා වැඩි දියුණු ආදායම | 3, 700 | 2,908 | 3,700 |
| මන්නාරම හුණුගල ආශ්‍රිත ජලධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය | 4,000 | 4,500 | 4,000 |
| යාපනයේ භූගත ජලය අධීක්ෂණය | 5,000 | 2,468 | 4,400 |
| වවුනියා සිට කිලිනොච්චියේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය | 168 | 3,019 | 250 |
| කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳව අධ්‍යනය | 1,665 | 2,254 | 1,550 |
| කෘතිමව නැවත ආරෝපනය කිරීමේ ව්‍යාපෘතිය (පියවර 1 පුත්තලම) | 220 | 2,503 | 250 |
| දිගුකාලීන වකුගඩු රෝගය සම්බන්ධව ජලයේ ගුණත්ව අධ්‍යන ව්‍යාපෘතිය | 4,826 | 4,365 | 5,000 |
| හම්බන්තොට බදුල්ල හා මොණරාගල අත් පොම්ප නලලිං පුනරුත්ථාපනය | 5,000 | 2,872 | 5,000 |
| කිරිදිඔය ද්‍රෝණියේ භූජල අධ්‍යනය (අදියර I) | 1,676 | 1,522 | 2,000 |
| කැළණි ගඟ ද්‍රෝණියේ භූජල අධ්‍යනය (අදියර I) | 2,000 | 783 | 2,000 |
| කාර්‍ය මණ්ඩලය පුහුණුව | 300 | 192 | 300 |
| Emuse Project | 5,000 | - | 4,200 |
| *මුළු එකතුව* | **34,003** | **27,896** | **33,150** |

**සටහන් අංක: 03**

**වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| සංචාරක නිවාස ආදායම | 131 | 191 | 200 |
| දඩ මුදල් හා අධිභාර | 55 | 51 | 100 |
| විවිධ ආදායම් | 743 | 764 | 600 |
| වත්කම් ඉවත්කිරීමේ ආදායම | 241 | 4,945 | 7,000 |
| ණය පොලී සහ බැංකු පොළී | 723 | 873 | 600 |
| ජලය පිරිපහදුකිරීකේරීමේ යන්ත්‍ර සවිකිරීමේ ආදායම | 820 | - | - |
| සේවක නේවාසික කුලී | 137 | - | - |
| ***එකතුව*** | **2,850** | **6,824** | **8,500** |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

**සටහන් අංක 4 : 1 පරිපාලන වියදම**
**අයවැය**

| | **සත්‍ය** | **සත්‍ය** | |
|---|---|---|---|
| | **2016** | **2015** | **2016** |
| | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| වැටුප් හා වේතන | 154,556 | 138,642 | 151,000 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 8,304 | 5,711 | 6,000 |
| සේවක අර්ථ සාධක අරමුදලට ගෙවීම - 12% | 14,215 | 14,434 | 14,000 |
| සේවක නියුක්ති භාර අරමුදලට ගෙවීම - 3% | 3,554 | 3,609 | 3,600 |
| අධ්‍යක්ෂවරන්ගේ ගාස්තු | 1,041 | 705 | 750 |
| වෙනත් දීමනා | 106 | 23 | 50 |
| පාරිතෝෂික | (16,179) | 20,377 | (11,500) |
| ගමන් වියදම් - දේශීය | 6,009 | 4,310 | 5,000 |
| ගමන් වියදම් - විදේශීය (දීමනා) | 44 | 95 | 150 |
| සුභසාධක වියදම් හා ක්‍රීඩා පහසුකම් | 105 | 140 | 100 |
| වෛද්‍ය වැඩසටහන් | 772 | 760 | 840 |
| සංග්‍රහ කිරීම් | 181 | 89 | 150 |
| ඉතිරි විවේක නිවාඩු සඳහා ගෙවීම | 55 | 49 | 50 |
| ***එකතුව*** | **172,763** | 188,944 | **170,190** |

**සටහන් අංක: 4 . 2 සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය**

| | | | |
|---|---|---|---|
| ඉන්ධන හා ලිහිසි තෙල් | 18,656 | 12,940 | 16,000 |
| විද්‍යුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | 7,706 | 18,090 | 9,000 |
| රසායනාගාර පාරිභෝජන ද්‍රව්‍ය | 1,611 | 3,640 | 500 |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 483 | 313 | 500 |
| ***එකතුව*** | ***28,456*** | **34,983** | **26,000** |

**සටහන් අංක: 4.3 ගිවිසුම්ගත සේවාවන් හා නඩත්තු වියදම්**

| | | | |
|---|---|---|---|
| තැපැල් හා දුරකතන | 1,369 | 1,188 | 1,400 |
| විදුලිය ගාස්තු | 2,789 | 1,902 | 3,000 |
| කුලී, වරිපනම් හා බදු | 849 | 695 | 800 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 10 | 11 | 10 |
| විගණන ගාස්තු | 157 | 200 | 200 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 830 | 103 | 150 |
| වැඩ මුළු හා සම්මන්ත්‍රණ | 64 | 54 | 70 |
| ජල බිල්පත් | 111 | 141 | 120 |
| උපදේශක ගාස්තු | 67 | 67 | 70 |
| විවිධ වියදම් | 905 | 249 | 800 |
| මෝටර් වාහන නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය | 6,520 | 3,881 | 4,500 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය | 6,952 | 6,733 | 4,500 |
| කාර්යාල උපකරණ, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය | 1,816 | 1,365 | 1,200 |
| ගොඩනැගිලි, අළුත්වැඩියාව හා සේවාකිරීම් යනාදිය | 289 | 442 | 400 |
| ***මුළු එකතුව*** | ***22,728*** | **17,031** | **17,220** |

**සටහන් අංක: 4.4 වෙනත් මෙහෙයුම් වියදම්**

| | | | |
|---|---|---|---|
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 514 | 381 | 500 |
| නිල ඇඳුම් | 639 | 116 | 500 |
| වාර සඟරා හා පුවත්පත් | 206 | 97 | 200 |
| වාර සඟරා හා පුවත්පත් | 681 | 304 | 450 |
| බැංකු ගාස්තු | 165 | 142 | 150 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 70 | - | 80 |
| නීති වියදම් | 4 | - | 10 |
| මුද්දර බදු | 11 | 6 | 10 |
| වාහන සේවා කිරීම - රත්මලාන | 459 | 259 | 700 |
| කුලී ගාස්තු | 11 | 54 | 20 |
| පුහුණු මධ්‍යස්ථාන වියදම් (අනුරාධපුර) | - | 95 | - |
| ජල දිනයේ වියදම් | 1,410 | - | 1,360 |
| දඩ හා අධිභාර | 15 | - | - |
| බොල්ණය | 190 | 31 | - |
| ප්‍රත්‍යාගණන අලාභය | 5,984 | - | - |
| ***මුළු එකතුව*** | **10,323** | **1,,485** | **3,980** |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| | සත්‍ය | සත්‍ය | අයවැය |
|---|---|---|---|
| | **2016** | **2015** | **2016** |
| | **රු'000** | **රු'000** | **රු'000** |

**සටහන් අංක: 4.5 වෙනත් ව්‍යාපෘති වියදම්**

## වේලි සංරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කිරීමේ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 779 | 357 | - |
| ගමන් වියදම් | 855 | 533 | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 15 | 79 | - |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 2,812 | 2,034 | - |
| ගොඩනැගිලි, අළුත්වැඩියාව හා නඩත්තුව | 95 | 999 | - |
| විදුලි සඳහා පාරිභෝජන ද්‍රව්‍ය | 132 | 458 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 131 | 44 | - |
| කුලී, වරිපනම් හා බදු | 22 | 180 | - |
| සංග්‍රහ කිරීම් | 55 | 12 | - |
| වැටුප් හා වේතන | 55 | 43 | - |
| මුද්‍රණ හා ප්‍රකාශන | 1 | 3 | - |
| විවිධ වියදම් | 5 | 9 | - |
| මෝටර් වාහන නඩත්තුව | 104 | 87 | - |
| උපදේශක ගාස්තු | - | 125 | - |
| ප්‍රචාරණය | - | 14 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 515 | 7 | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | - | 17 | - |
| ජල දිනයේ වියදම් | 1121 | - | - |
| තැපැල් හා දූරකතන | 1 | - | - |
| *උප එකතුව* | 6698 | 5001 | 9000 |

***දින 100 ව්‍යාපෘතිය***

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | - | 1,225 | - |
| ගමන් වියදම් | - | 1,106 | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | - | 3 | - |
| ඉන්ධන හා ලිහිසි තෙල් | - | 4,038 | - |
| ගොඩනැගිලි, නඩත්තුව | - | 188 | - |
| විදුලි වැඩ සඳහා පාරිභෝජන ද්‍රව්‍ය | - | 4,500 | - |
| මෝටර් වාහන නඩත්තුව | - | 37 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | - | 7 | - |
| විවිධ වියදම් | - | 18 | - |
| මුද්‍රණ හා ප්‍රකාශන | - | 6 | - |
| ප්‍රචාරණය | - | 87 | - |
| කුලී, වරිපනම් හා බදු | - | 133 | - |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | - | 83 | - |
| සංග්‍රහ වියදම් | - | 162 | - |
| ***උප එකතුව*** | - | *11,593* | - |

**සටහන් අංක: 4.5 වෙනත ව්‍යාපෘති වියදම්**

**ගෝණගන් ආර හා රතුපස්කැටිය ව්‍යාපෘතිය**

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | - | 82 | - |
| ගමන් වියදම් | - | 55 | - |
| වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | - | 10 | |
| ඉන්ධන හා ලිහිසි තෙල් | - | 2 | - |
| ගොඩනැගිලි, නඩත්තුව | - | 46 | - |
| විදුලි වැඩ සඳහා පාරිභෝජන ද්‍රව්‍ය | - | 1,691 | - |
| විදුලිය ගාස්තු | - | 21 | - |
| කුලී ගාස්තු | - | 18 | - |
| ***උප එකතුව*** | *2387* | ***1,925*** | *1700* |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| | සත්‍ය 2016 රු'000 | සත්‍ය 2015 රු'000 | අයවැය 2016 රු'000 |
|---|---|---|---|
| **චුන්කාමම් ව්‍යාපෘතිය** | | | |
| විදුම් වැඩ සඳහා පාරිභෝජන | - | 1,800 | - |
| | 2627 | 1800 | 2600 |
| අවිස්සාවේල්ල සිට කොලඹ දක්වා නල ලිං පිරිසිදු කිරීමේ ව්‍යාපෘතිය | 3401 | - | 3400 |
| සාලාව හා කොස්ගම වල ලිං පිරිසිදු කිරීම හා ජල නියැදි පරීක්ෂාව | 1569 | - | 1600 |
| නිෂ්පාදන නල ලිං ඉදි කිරීම - වියලි කලාපය | 9851 | - | |
| **කුඩා ප්‍රමාණයේ ජල සැපයුම් යෝජනා ක්‍රම** | | | **10,000** |
| ***මුළු එකතුව*** | ***26,533*** | ***20,319*** | ***28300*** |
| **කොළඹ සිට මීගමුව දක්වා ඇති වෙරළබඩ ජල ධරයේ භූ ජල විද්‍යාත්මක අධ්‍යනය** | | | |
| වැටුප් හා වේතන | 11 | 7 | 16 |
| ගමන් වියදම් | 14 | 15 | 20 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3 | - | 30 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 28 | 30 | 24 |
| භූ ජල වෙනත් වියදම් | 2 | 1 | 160 |
| විදුම් වැඩ සඳහා පාරිභෝජන | 17 | - | - |
| මෝටර් වාහන නඩත්තුව | 32 | - | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 103 | 177 | - |
| *උප එකතුව* | **210** | **230** | **250** |

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජල ස්ථරවල ජලයේ ගුණත්වය වෙනස්වීම් අධ්‍යනය

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 17 | 17 | 28 |
| ගමන් වියදම් | 22 | 36 | 32 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 42 | 107 | 60 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 124 | 120 | - |
| විදුලි වැඩ සඳහා පාරිභෝජන | 10 | - | - |
| භූ ජල වෙනත් වියදම් | - | - | 100 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 22 | - | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 1 | - | 30 |
| ***උප එකතුව*** | ***238*** | **280** | **250** |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| | සත්‍ය | සත්‍ය | අයවැය |
|---|---|---|---|
| | **2016** | **2015** | **2016** |
| | **රු'000** | **රු'000** | **රු'000** |

**සටහන් අංක: 4.6 භාණ්ඩාගාර ප්‍රතිපාදන - ප්‍රාග්ධන (පර්යේෂණ අධ්‍යයන)**

**මන්නාරම් වෙරළබඩ හුණුගල් ජල ධරයේ අධ්‍යනය**

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | 310 | 471 | 385 |
| ගමන් වියදම් | 263 | 388 | 500 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2 | 3 | 30 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,290 | 1527 | 1,300 |
| නල ලිං විදුලි පාරිභෝජන | 1,904 | 1,323 | 1,540 |
| භූ ජල වෙනත් වියදම් | 6 | 38 | 60 |
| කුලී, වරිපනම් හා බදු | 72 | 105 | 45 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 90 | 120 | - |
| මෝටර් වාහන නඩත්තුව | 52 | 96 | 50 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 1 | 410 | 50 |
| ශිෂ්‍යත්ව සහ සම්මන්ත්‍රන | - | - | |

| | | | |
|---|---|---|---|
| විවිධ වියදම් | 8 | 9 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 1 | 9 | - |
| සංග්‍රහ වියදම් | 1 | 1 | - |
| *උප එකතුව* | 4,000 | 4,500 | **4,000** |

**යාපනයේ භූ ජල අධීක්ෂණය**

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 285 | 220 | 260 |
| ගමන් වියදම් | 265 | 228 | 360 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | - | 2 | 50 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,872 | 1020 | 1000 |
| නල ලිං විදුම් පාරිභෝජන | 2,367 | 643 | 2005 |
| භූ ජල වෙනත් වියදම් | 18 | 9 | 300 |
| කුලී, වරිපනම් හා බදු | 24 | 52 | 60 |
| වැටුප් හා වේතන | - | - | 60 |
| මෝටර් වාහන නඩත්තුව | 54 | 56 | 100 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 7 | 9 | 100 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 106 | 224 | 50 |
| තැපැල් හා දුරකතන | - | - | 5 |
| සංග්‍රහ වියදම් | 1 | - | - |
| **ශිෂ්‍යත්ව සහ සම්මන්ත්‍රන** | **-** | **-** | **50** |
| විවිධ වියදම් | 1 | 5 | - |
| *උප එකතුව* | **5,000** | **2,468** | **4,400** |

| වව්නියා හා කිළිනොච්චි දිස්ත්‍රික් භූ ජල අධ්‍යනය | සත්‍ය | සත්‍ය | අයවැය |
|---|---|---|---|
| | **2016** | **2015** | **2016** |
| | **රු'000** | **රු'000** | **රු'000** |
| වැටුප් හා වේතන | - | 14 | - |
| නල ලිං විදුම් පාරිභෝජන | 10 | 936 | - |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 2 | 256 | 16 |
| ගමන් වියදම් | 11 | 281 | 30 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 80 | 1,225 | 54 |
| භූ ජල වෙනත් වියදම් | - | 5 | 80 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 62 | 109 | - |
| මෝටර් වාහන නඩත්තුව | - | 102 | - |
| කුලී, වරිපනම් හා බදු | - | 78 | 40 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | - | 8 | - |
| විවිධ වියදම් | - | 4 | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 3 | 1 | 30 |
| *උප එකතුව* | **168** | **3,019** | **250** |
| | | | |
| කාර්‍යය මණ්ඩල පුහුණුව | **300** | **192** | **300** |
| ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම් | **3,700** | **2,908** | **3,700** |
| *උප එකතුව* | **4,000** | **3,100** | **4,000** |

**කාලගුණ විපර්යාසයේ සෘජු හා වක්‍ර බලපෑම පිළිබඳව අධ්‍යනය**

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | - | 9 | - |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 162 | 99 | 120 |
| ගමන් වියදම් | 147 | 171 | 120 |

| | | | |
|---|---|---|---|
| ඉන්ධන හා ලිහිසි තෙල් | 586 | 694 | 470 |
| භූ ජල වෙනත් වියදම් | 441 | 942 | 385 |
| මෝටර් වාහන නඩත්තුව | 1 | 12 | 100 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 6 | 1 | 50 |
| භූ ජල වෙනත් වියදම් | 3 | 109 | 100 |
| කුලී, වරිපනම් හා බදු | 23 | 49 | 50 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 1 | 1 | 100 |
| තැපැල් හා දුරකතන | - | - | 5 |
| විවිධ වියදම් | 1 | 5 | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 281 | 158 | - |
| කාර්යාල උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 13 | 4 | 50 |
| *උප එකතුව* | **1,665** | **2,254** | **1,550** |

**කෘතිමව ජලය නැවත ආරෝපණය කිරීමේ ව්‍යාපෘතිය(පියවර 1 පුත්තලම)**

| | | | |
|---|---|---|---|
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 17 | 79 | 32 |
| ගමන් වියදම් | 22 | 97 | 40 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 4 | - | 30 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 43 | 492 | 72 |
| නල ලිං විදුම් පාරිභෝජන | 10 | 1,670 | - |
| භූ ජල වෙනත් වියදම් | - | 6 | 76 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 124 | 120 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | - | 20 | - |
| මෝටර් වාහන නඩත්තුව | - | 17 | - |
| විවිධ වියදම් | - | 2 | - |
| *උප එකතුව* | **220** | **2,503** | **250** |

**දිගුකාලීන වකුගඩු රෝගය (CKDU) සම්බන්ධව ජලයේ ගුණත්ව අධ්‍යන ව්‍යාපෘතිය**

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | - | - | 100 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 331 | 168 | 620 |
| මෝටර් වාහන නඩත්තුව | - | 56 | 100 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | - | 2 | 100 |
| කුලී, වරිපනම් හා බදු | - | 83 | 100 |
| ගමන් වියදම් | 330 | 220 | 460 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 17 | 10 | 40 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,679 | 995 | 1,650 |
| නල ලිං විදුම් පාරිභෝජන | 1,885 | 2,420 | 1,580 |
| භූ ජල වෙනත් වියදම් | - | 8 | 150 |
| විවිධ වියදම් | - | 18 | - |
| ගොඩනැගිලි නඩත්තුව | - | - | 50 |
| වැඩ මුළු හා සම්මන්ත්‍රණ | - | - | 50 |
| මුද්‍රණ හා ප්‍රකාශන | - | 2 | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 155 | 81 | - |
| සංග්‍රහ කිරීම් | 143 | 251 | - |
| ප්‍රචාරණය | 48 | 51 | - |
| ජල දින වියදම් | 235 | - | - |
| *උප එකතුව* | **4,826** | **4,365** | **5,000** |

**ශම්බන්තොට හා මොනරාගල අත් පොම්ප නලලිං ප්‍රතිසංස්කරණය**

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | - | - | 50 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 249 | 185 | 250 |
| මෝටර් වාහන නඩත්තුව | 8 | - | 100 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 8 | - | - |

| | | | |
|---|---|---|---|
| කුලී, වරිපනම් හා බදු | - | 16 | 100 |
| ගමන් වියදම් | 230 | 151 | 250 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,414 | 478 | 1,000 |
| නල ලිං විදුම් පාරිභෝජන | 3,083 | 2,024 | 3,120 |
| භූ ජල වෙනත් වියදම් | 4 | 13 | - |
| තැපැල් හා දුරකතන | - | - | 30 |
| විවිධ වියදම් | 2 | 3 | 40 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2 | 2 | 10 |
| *උප එකතුව* | **5,000** | **2,872** | **5,000** |

***කිරිදිඔය ද්‍රෝණියේ භූ ගත ජලය අධ්‍යනය කිරීම (පියවර - 1)***

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | - | - | 50 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 164 | 107 | 200 |
| මෝටර් වාහන නඩත්තුව | 3 | 82 | - |
| කුලී, වරිපනම් හා බදු | 18 | 7 | 50 |
| ගමන් වියදම් | 120 | 128 | 200 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 752 | 740 | 1,000 |
| නල ලිං විදුම් පාරිභෝජන | 430 | 377 | 420 |
| භූ ජල වෙනත් වියදම් | - | - | 60 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | - | - | 20 |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 192 | 81 | - |
| *උප එකතුව* | ***1,676*** | ***1,522*** | ***2,000*** |

***කැළණි ගඟ ද්‍රෝණියේ භූ ගත ජලය අධ්‍යනය කිරීම (පියවර - 1)***

| | | | |
|---|---|---|---|
| වැටුප් හා වේතන | - | - | 50 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 184 | 10 | 200 |
| මෝටර් වාහන නඩත්තුව | 3 | 21 | - |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 6 | - | 50 |

| | | | |
|---|---|---|---|
| කුලී, වරිපනම් හා බදු | 60 | - | 50 |
| ගමන් වියදම් | 304 | 14 | 200 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 593 | 6 | 1,000 |
| නල ලිං විදුම් පාරිභෝජන | 726 | 651 | 420 |
| භූ ජල වෙනත් වියදම් | 2 | - | 60 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 22 | - | 20 |
| විවිධ වියදම් | 3 | - | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 95 | 81 | - |
| සංග්‍රහ වියදම් | 2 | - | - |
| *උප එකතුව* | ***2,000*** | ***783*** | ***2,000*** |
| වැටුප් හා වේතන | - | - | 50 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 243 | - | 630 |
| මෝටර් වාහන නඩත්තුව | 3 | - | 100 |
| යන්ත්‍රෝපකරණ නඩත්තුව | 8 | - | 100 |
| කුලී, වරිපනම් හා බදු | - | - | 100 |
| ගමන් වියදම් | 224 | - | 460 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,448 | - | 1,600 |
| නල ලිං විදුම් පාරිභෝජන | 3,055 | - | 1,145 |
| භූ ජල වෙනත් වියදම් | 4 | - | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | - | - | 15 |
| ප්‍රචාරනය | 6 | - | - |
| විවිධ වියදම් - | 5 | | - |
| රසායනාගාර උපකරණ නඩත්තුව | 4 | - | - |
| *උප එකතුව* | ***5,000*** | *-* | ***4,200*** |
| ***මුළු එකතුව*** | **34,003** | **27,896** | **33,150** |

**සටහන් අංක: 5**

මුදල් හා මුදල් සමානදෑ

| | | | |
|---|---|---|---|
| (1) | ලංකා බැංකුව යෝක් වීදිය ශාඛාව (0002026295) | 86 | 982 |
| (2) | ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002322267) | 5,237 | 1,288 |
| (3) | ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0002322268) | 28 | 36 |
| (4) | ලංකා බැංකුව ටොරින්ටන් චතුරශ්‍ර ශාඛාව (0005342839) | 497 | 727 |
| (5) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, බම්බලපිටිය ශාඛාව (100230211818) | 2,131 | 7,977 |
| (6) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, බොරැල්ල ශාඛාව (1-0061-03-31236) | - | 12 |
| (7) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, බොරැල්ල ශාඛාව (1-0061-03-31287) | 2 | 2 |
| | ***එකතුව*** | **7,981** | **11,024** |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| | | | |
|---|---|---|---|
| | | **සත්‍ය** | **සත්‍ය** |
| **සටහන් අංක: 6** | | **2016** | **2015** |
| **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | **රු.'000** | **රු.'000** |
| **සේවක** | | | |
| (1) අපදා ණයා | | 11,715 | 12,375 |
| (2) උත්සව අත්තිකාරම් | | 10 | 28 |
| (3) පාපැදි ණය | | 14 | 25 |
| (4) සේවක ණයගැතියෝ | | - | 247 |
| | ***උප එකතුව*** | **11,739** | **12,675** |
| ***වෙනත්*** | | | |
| (5) වෙළඳ ණයගැතියෝ | | 19,790 | *3*,836 |
| (6) තැන්පත | | 56 | 56 |
| (7) සැපයුම් අත්තිකාරම් | | 243 | 163 |
| ***(8)*** ලැබිය යුතු රඳවා ගැනීම් | | 149 | **-** |
| | *උප එකතුව* | **20,238** | **4,055** |
| **ලැබිය යුතු දෑ මුළු එකතුව** | | **31,977** | **16,730** |
| (9) අඩුකලා : ගෙවිය යුතු එ.අ.මත බදු | | (2,402) | (389) |
| | **එකතුව** | **29,575** | **16,341** |

**සටහන් අංක: 7**

**තොග**

**ද්‍රව්‍ය හා අමතර කොටස්**

| | | |
|---|---|---|
| වාහන අමතර කොටස් | 1,370 | 1,149 |
| වාහන අමතර කොටස් (වේලි ආරක්ෂණ ව්‍යාපෘතය) | 2,295 | 1,361 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,973 | 923 |
| ගබඩා ද්‍රව්‍ය | 24,949 | 19,430 |
| ගොඩනැගිලි නඩත්තු ද්‍රව්‍ය | 144 | 38 |
| ලිපිද්‍රව්‍ය | 237 | 318 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් (2 කේ. ආර් අමතර කොටස් | 58,316 | 66,714 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් ( වේලි ආරක්ෂණ ව්‍යාපෘතය) | 50,932 | 55,755 |
| යන්ත්‍රෝපකරණ අමතර කොටස් (අමාත්‍යංශය) | 4,154 | 5,010 |
| රසායනාගාර නඩත්තු අමතර ද්‍රව්‍ය | 4,855 | 3,258 |
| ***එකතුව*** | **149,225** | **153,956** |

**සටහන් අංක: 8**

**කලට පෙර ගෙවීම්**

| | | |
|---|---|---|
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 9 | 8 |
| පුවත්පත් හා වාර ප්‍රකාශන | 13 | 9 |
| මෝටර් වාහන නඩත්තු | 139 | 95 |
| ප්‍රචාරන | 62 | - |
| ***එකතුව*** | *223* | *112* |

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

**දේපල,පිරියත හා උපකරණ**

| **සටහන් අංක: 09**<br>**පිරිවැය / ආගණනය** | **2016.01.01 ශේෂය**<br>**රු'000** | **දිනට වසර තුල එකතු කිරීම්**<br>**රු'000** | **ඉවත්කිරීම්/ ගැලපීම්**<br>**රු'000** | **2016.12.31 දිනට ශේෂය**<br>**රු'000** |
|---|---|---|---|---|
| ඉඩම් | 1,897 | - | - | 1,897 |
| ගොඩනැගිලි | - | 6,258 | | 6,258 |
| මෝටර් වාහන | 136,802 | 121,662 | (160,859) | 97,605 |
| යන්ත්‍රෝපකරණ, මෙවලම් හා උපකරණ | 698,681 | 204,490 | (706,281) | 196,890 |
| රසායනාගාර උපකරණ | 85,700 | 17,676 | (85,700) | 17,676 |
| ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 17,157 | 3,035 | - | 20,192 |
| පරිගණක හා උපාංග | 11,201 | 760 | (8,716) | 3,245 |
| විද්‍යාත්මක උපකරණ | 95,457 | 412 | - | 95,869 |
| භූවිද්‍යාත්මක සිතියම් | 2,274 | - | (2,274) | - |
| රසායනාගාර ගොඩනැගිලි (වැඩ ප්‍රගතිය) | 300 | - | - | 300 |
| එකතුව | **1,049,469** | **354,293** | **(963,830)** | **439,932** |

| **ක්ෂයකිරීම** | **2016.01.01 දිනට ශේෂය**<br>**රු'000** | **වසර තුල එකතු කිරීම්**<br>**රු'000** | **ඉවත්කිරීම්/ ගැලපීම්**<br>**රු'000** | **2016.12.31 දිනට ශේෂය**<br>**රු'000** |
|---|---|---|---|---|
| මෝටර් වාහන | 108,201 | 17,307 | (125,508) | - |
| යන්ත්‍රෝපකරණ, මෙවලම් හා උපකරණ | 284,554 | 93,658 | (378,212) | - |
| රසායනාගාර උපකරණ | 59,072 | 3,532 | (59,072) | 3,532 |
| ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 10,952 | 1,205 | - | 12,157 |
| පරිගණක හා උපාංග | 8,715 | 586 | (8,715) | 586 |
| විද්‍යාත්මක උපකරණ | 27,421 | 18,610 | - | 46,031 |
| භූවිද්‍යාත්මක සිතියම් | 1,687 | 587 | (2,274) | - |
| ***එකතුව*** | **500,602** | **135,485** | **(573,781)** | **62,306** |
| ශුද්ධ පොත් අගය | **548,867** | | | **377,626** |

**මුළු ක්ෂය කිරීම් පහත සඳහන් පරිදි සිදුකර ඇත.**

| | Rs.'000 |
|---|---|
| සමුච්චිත ක්ෂය | 67,540 |
| වැඩිදියුණු කිරීම් | 1,086 |
| | **68,626** |

**දේපළ,පිරියත හා උපකරණ සඳහා සටයන්**

**සටහන් අංක: 09**

01. ක්ෂය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් පරිදි සිදුකර ඇත.

| ක්ෂය කිරීම් | 2016.01.01 දිනට ශේෂය රු'000 | විලම්භිත ආදායම් රු'000 | ඉවත්කිරීම්/ ගැලපීම් රු'000 |
|---|---|---|---|
| මෝටර් වාහන | 17,307 | (17,290) | 17 |
| යන්ත්‍රෝපකරණ, මෙවලම් හා උපකරණ | 93,658 | (93,625) | 33 |
| රසායනාගාර උපකරණ | 3,532 | (2,434) | 1,098 |
| ලී බඩු, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 1,205 | | 1,205 |
| පරිගණක හා උපාංග | 586 | - | 586 |
| විද්‍යාත්මක උපකරණ | 18,610 | (18,610) | - |
| භූවිද්‍යාත්මක සිතියම් | 587 | - | 587 |
| ***එකතුව*** | **135,485** | **(131,959)** | **3,526** |

02. වාර්ෂික බදු කුලී ගෙවීමේ පදනම මත බදු ගිවිසුමක් කොරකහවැව පුහුණු මධ්‍යස්ථානයේ ඉඩමට ඇත (හෙක්ටයාර්. 2.166)

03. 2015.12.31 දිනට නීතිමය හිමිකමක් නොමැතිව මණ්ඩලය විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් හා ගොඩනැගිලිවල විස්තර පහත පරිදි වේ./

| ඉඩම | ගොඩනැගිලි (දළ වශයෙන්) | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | වර්ග අඩි | 8477 |
| රත්මලාන යාන්ත්‍රික වැඩපල | වර්ග අඩි | 32960 |
| අනුරාධපුර සංචාරක නිවාසය | වර්ග අඩි | 3038 |
| වවුනියා වැඩබිම | වර්ග අඩි | 1082 |

04. භාණ්ඩාගාර ප්‍රදාන වශයෙන් 2012 වසරේ ලැබුණ මෝටර් වාහන (ඩබල් කැබ්) හතරක් අගය කර නොමැත.(වාහන අංක:. PE-0623, PE-3448, PD-5851, PD-5856)

05. මෝටර් වාහන දහයක් 2015 වසර අවසන් වන විටත් මණ්ඩලයට පවරා නොතිබුණි.

06. දේපල පිරියත වර්ෂය තුලදී මිලදී ගත් වත්කම්/ ප්‍රදානය කරන ලද වත්කම්/ හඳුනාගත් උපකරණ ප්‍රත්‍යාගනනය කරන ලද වටිනාකම්/ ගැළපීම් තුල සාධාරණ අගයන් එකතු කිරීම් යටතේ සටහන් අංක 09 හි දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්.

| | | සත්‍ය | සත්‍ය |
|---|---|---|---|
| | | **2016** | **2015** |
| | | **රු'000** | **රු'000** |
| **සටහන් අංක: 10** | | | |
| **වෙළඳ ණයහිමියෝ** | | | |
| 01. | ප්‍රාදේශීය ලේකම් නුවරගම් පළාත | 422 | 422 |
| 02. | ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | - | 1,125 |
| 03. | නූෂා මැරයින් ලංකා (පුද්.) සමාගම | - | 626 |
| 04. | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | - | 110 |
| | ***එකතුව*** | **422** | **2,283** |

**සටහන් අංක: 11**

වෙනත් වෙන්කිරීම් හා ගෙවියයුතුදෑ

| | | 2016 | 2015 |
|---|---|---|---|
| (1) | සේවක | | |
| | 1:1 සේවක ණයහිමියෝ | - | 20 |
| | ***උප එකතුව(1:1 – 1:2)*** | **-** | **20** |
| (2) | විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් | 535 | 557 |
| (3) | සේ.අ.අරමුදල 10% | (91) | (84) |
| (4) | ගෙවිය යුතු වියදම් | 13,256 | 18,443 |
| (5) | ටෙන්ඩර් සුරැකුම් හා ආපසු ගෙවන තැන්පත් | 639 | 420 |
| (6) | ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල | 431 | 5,169 |
| (7) | ගෙවිය යුතු සේවක අරථසාධක අරමුදල | 37,534 | - |
| (8) | ගෙවිය යුතු රඳවාගන්නා ලද එකතුකල අගය මත බදු | 14 | - |
| | ***උප එකතුව (2-8)*** | ***52,318*** | ***24,505*** |
| | අඩුකලා: එ.අ.බදු මුදල් | | |
| (9) | අඩුකලා: ලැබිය යුතු එ.අ.බදු මුදල | (469) | (651) |
| (10) | අඩු කලා : එකතු කල අගය මත බදු මුදල් | - | (191) |
| | | ***51,849*** | ***23,683*** |

**සටහන් අංක: 12**

**විලම්භිත ආදායම්**

| | | |
|---|---|---|
| සේවා අත්තිකාරම්(විස්තර සඳහා පිටු අංක 29 හා 30 බලන්න) | **21,413** | **11,370** |

**සටහන් අංක: 13**

**විශ්‍රාම ප්‍රතිලාභ වගකීම**

මූල්‍ය තත්ව ප්‍රකාශන වලින් හඳුනාගත් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| වසර මුලදී | 90,855 | 79,706 |
| වසර තුල වෙන්කිරීම් | (16,180) | 20,377 |
| දායකත්ව ගෙවීම් | (9,681) | (9,228) |
| වසර අග ශේෂය | **64,994** | **90,855** |

**සටහන් අංක: 14**

| **ආරක්ෂක තැන්පතු** | | **මූලික තැන්පතුව** | | |
|---|---|---|---|---|
| | | රු. | | |
| (1) ඩබ්ලිව්.පී.එස්.ගුණතිලක මහතා -අයකැමි | | **3,500** | | 12 |
| (2) කේ.ඒ. විමල් මහතා | - ගබඩා භාරකරු | **500** | 2 | 2 |
| | ***එකතුව*** | **4,000** | **2** | **14** |

**සටහන් අංක: *15***

***විලම්භිත ආදායම් සඳහා කරුණාකර පිටු අංක 22 බලන්න.***

ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සඳහා පිටු අංක 03 බලන්න

**සටහන් අංක: *16***

සටහන් අංක 16 සඳහා කරුණාකර පිටු අංක 3 හි ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය බලන්න.

**සටහන් අංක: *17***

***වාර්තාකල කාලයෙන් පසු සිදුවීම්***

බොල්ණය වෙන් කිරීම් වෙනුවෙන් රු. 124,320/- ක් ගිණුම් ගත කිරීමට 2017.02.22 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති ලැබී ඇත.

ගිණුම් සඳහා වූ සටහන්

| විලම්බිත ආදායම් | ශේෂය 2016.01.01 | වසරතුල එකතු කිරීම් | වසරතුල ගෙවීම් | | ශේෂය 2016.12.31 |
|---|---|---|---|---|---|
| | | | ක්ෂය | විලම්බිත ගැලපීම් | |
| | රු. 000 | රු. 000 | රු.000 | රු.000 | රු.000 |
| ඉඩම් | - | - | - | - | - |
| ගොඩනැගිලි | - | - | - | - | - |
| මෝටර් වාහන | - | 123,920 | (17,290) | (27,105) | 79,525 |
| යන්ත්‍රෝපකරණ | - | 588,167 | (93,625) | (322,752) | 171,790 |
| රසායනාගාර උපකරණ | - | 12,183 | (2,434) | - | 9,749 |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | - | - | - | - | - |
| පරිගණ හා උපාංග | - | - | - | - | - |
| විද්‍යාත්මක උපකරණ | - | 64,445 | (18,609) | - | 49,836 |
| එකතුව | | **792,715** | **(131,958)** | **(349,857)** | **310,900** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. : අයිඩීඑන්/ඒ/ජසමඅංගි/1/17/1  
ඔබේ අංකය / உமது இல. / Your No. :  
දිනය / திகதி / Date : 2017 සැප්තැම්බර් 30 දින

සභාපති,  
ජල සම්පත් මණ්ඩලය,

10 OCT 2017  
WRB

CHAIRMAN  
10 OCT 2017  
WATER RESOURCES BOARD

**ජල සම්පත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ජල සම්පත් මණ්ඩලය  
11 OCT 2017  
පාලන අංශය

GM / AGM (F) / IA

එච්.එම්. ගාමිණී විජේසිංහ  
විගණකාධිපති.

පිටපත්:-
1. ලේකම් - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

WATER RESOURCES BOARD  
22 JUN 2018  
SUPPLIES DIVISION


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka  
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } අයිඩීටන්/ඊ/ජසම්පා/1/17/11    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 30 දින

සභාපති,

ජල සම්පත් මණ්ඩලය.

**ජල සම්පත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජල සම්පත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 42 දරන පනතින් සංශෝධිත 1964 අංක 29 දරන ජල සම්පත් පනතේ 17(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2017 අගෝස්තු 31 දින මණ්ඩලයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මා අනුකූලවන ලෙස සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන ලෙස මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට පළා සභපත් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

යුද්ධ හමුදාව විසින් මණ්ඩලය වෙත ලබා දී තිබුණු ජීප් රථය විධිමත් පරිදි පවරාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.28,168,520 ක් වූ ණයගැතියන් සහ සේවා අත්තිකාරම් වලට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| | | |
|---|---|---|
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විද්‍යුත්මය උපකරණ ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2013 ජූනි 02 දිනැති අංක පීඩීඩී/12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.7 ඡේදය | යාන්ත්‍රික නිලධාරීන් 28 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වැටුපට අතිරේකව රු.2,519,200 ක විශේෂ දීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,094,000 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.99,400,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.126,494,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.60,952,000 කින් අඩුවීම සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ආදායම රු.49,409,000 කින් වැඩිවීම ඉහත අතිරික්තය වැඩි වීමට ප්‍රධාන වශයෙන් තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයක් දක්නට ලැබුණද සමාලෝචිත වර්ෂයේ අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී මණ්ඩලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට ධනාත්මකව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.203,383,000 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1999 අංක 42 දරන ජල සම්පත් මණ්ඩලය (සංශෝධිත) පනතේ අංක 12 වගන්තියේ දක්වා ඇති පරිදි මණ්ඩලයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

(i) රටේ ජල සම්පත් සංරක්ෂණය සහ උපයෝගීකරණය කිරීම ඇතුළත්ව ඒවා පාලනය කිරීම, විධිමත් කිරීම, සංවර්ධනය කිරීම හා ජල මාර්ග අපවිත්‍රවීම වැලැක්වීම.

(ii) ජල සම්පත් ආගුකාර්ය ලෙස සංවර්ධනය හා පරිහරණය කිරීම, ගෘහ කටයුතු හා කාර්මික කටයුතු සඳහා කෙටිකාලීනව හා දිගුකාලීනව ජල සම්පත් ලබා දීම, ලවණතාවය පාලනය කිරීම, සහ සමාන අරමුණුවලින් රටේ ජල සම්පත් පාලනය හා පරිහරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම.

(iii) රටේ භූගත ජල සම්පත් සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන මඟින් සිදු කරනු ලබන පර්යේෂණ, සංඛ්‍යාත්මක සමීක්ෂණ, සැලසුම් සහ යෝජනා මත පදනම් වූ වාර්තා විශ්ලේෂණය කිරීම.

(iv) භූගත ජලය නිසි ලෙස පාලනය හා ආර්ථිකමය පරිහරණය සඳහා රජය විසින් ගතයුතු වන වෙනත් ඕනෑම සුදුසු ක්‍රියාමාර්ග ගැනීම

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුව මඟින් විෂයයන් 13 ක් යටතේ පර්යේෂණ ඒකක 3,692 ක් ඉටු කිරීමට සැලසුම් කර තිබුණ ද ප්‍රගති වාර්තා අනුව මණ්ඩලය විසින් පර්යේෂණ ඒකක 2,357ක් පමණක් ඉටුකර තිබූ අතර ඉටු නොකළ ප්‍රමාණය 1335 ක් විය. සමහර කාර්යයන් ඉටු නොකළ ප්‍රමාණය සියයට 13 සිට සියයට 100 ක් අතර පරාසයක විය.

(ආ) පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ජලය පිළිබඳ තත්ත්වය සහ එයින් පොදු ජනතාවට වන බලපෑම පරීක්ෂා කිරීම සඳහා රු.587,531,400 ක ඇස්තමේන්තු පිරිවැයට පර්යේෂණ අධ්‍යයන ව්‍යාපෘති 11 ක් ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දිනට එම මුදලින් රු.104,952,529 ක් වැය කර තිබුණි. එම අධ්‍යයන ව්‍යාපෘති අතුරින් 08 ක් 2016 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණ ද එම ව්‍යාපෘති 08 ම අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුවී නොතිබුණි.

(ii) පර්යේෂණ අධ්‍යයන සඳහා වගකීම දරන නිලධාරීන්ගේ පූර්ව පර්යේෂණ පළපුරුද්ද ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් අධ්‍යයන යෝජනාවට ඇතුළත්ව නොතිබුණු අතර කිසිදු පර්යේෂණ අධ්‍යයනයක් එම පර්යේෂණ කටයුත්ත සම්බන්ධයෙන් ප්‍රවීන හා පළපුරුදු පර්යේෂකයෙකුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

(iii) පර්යේෂණ අධ්‍යයනයන් සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා පූර්ණ කාලීනව පර්යේෂණ නිලධාරියෙකු පත්කළ යුතු වුවත් මණ්ඩලය විසින් සියලුම පර්යේෂණ අධ්‍යයනයන් සඳහා පර්යේෂණ නිලධාරී ලෙස මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී පත්කර තිබුණි. ඔහුගේ සාමාන්‍ය රාජකාරීවලට අමතරව පර්යේෂණ අධ්‍යයන සඳහා යොමුවීමට සිදුවී ඇති බැවින් සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළදී පර්යේෂණ අධ්‍යයනයන් නිම කිරීමට නොහැකිවී තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසානයට පර්යේෂණ අධ්‍යයනවල ඇස්තමේන්තුගත මුදලින් ලබා කර ගත් මූල්‍ය ප්‍රගතිය සියයට 15 සිට සියයට 65 දක්වා පරාසයක වූ අතර එම ව්‍යාපෘතිවල කාල ප්‍රමාදය වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා විය. තවද පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේ දී එයට හේතුව සහ ඇස්තමේන්තුව දක්වා නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහනයකට භාවිතා කරන ලද ටයර් සවි කිරීමෙන් පසු එම කාර්යය නියමිත පරිදි ඉටු කළ බවට අදාළ නිලධාරීන් විසින් සහතික කර නොතිබියදී රු. 290,000 ක් ගෙවා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වෙනත් ආයතන සතු වාහන 16 ක් මණ්ඩලය භාවිතා කළද එම වාහන පවරා ගැනීමට 2017 ජූනි දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, රත්මලාන හා වවුනියාව වැඩපලවල් සහ අනුරාධපුර සංචාරක බංගලාව පිහිටි ඉඩම් සහ ගොඩනැගිලි මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එම ඉඩම්වල රු.6,258,000 ක මුදලක් වැය කර ගොඩනැගිලි ඉදිකිරීම හා පැවති ගොඩනැගිලි නවීකරණය කිරීම ද මණ්ඩලය විසින් සිදු කර තිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අවසන් තොගය තුළ වටිනාකම රු.231,071 ක චලනය නොවන තොග ද රු.3,265,967 ක යල් පැනගිය තොග ද පවතින බව 2013 සිට 2016 දක්වා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් හඳුනාගෙන තිබුණ ද ඒවා සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනියම් සහ කොන්ත්‍රාත් පදනම් මත සේවකයින් 66 දෙනෙකු බඳවාගෙන තිබුණ ද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) සේවකයින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය ප්‍රකාරව එක් එක් තනතුර වෙනුවෙන් වෙන් වෙන් වූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්විය යුතු වුව ද නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමකින් තොරව වැටුප් වර්ධක ලබා දී තිබුණු අතර ඉහළ තනතුරු සඳහා උසස්වීම ද ලබා දී තිබුණි.

### 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයේ කාර්යයභාරය ඉටු කර ගැනීම සඳහා බඳවා ගත් සේවකයන් 05 දෙනෙකු වෙනත් රාජ්‍ය ආයතනවල රාජකාරි සඳහා 2015 වර්ෂයේ සිට මුදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එම සේවකයින්ට රු.1,354,613ක් සහ ඉකුත් වර්ෂයේදී රු.816,897 ක් වැටුප් හා දීමනා ලෙස මණ්ඩලය විසින් දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර තිබුණ ද තාක්ෂණ හා ඉංජිනේරු ශිල්පක්‍රම භාවිතා කරන මණ්ඩලයේ කාර්යයන් විගණනය කිරීමට සුදුසුකම්ලත් නිලධාරීන් ප්‍රමාණාත්මක සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් සහ වියදම් සත්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේ දී අයිතම 98 ක සියයට 20 සිට සියයට 453 ක් වූ පරාසයක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

මණ්ඩලය විසින් 2016 වර්ෂයේදී ඉටු කළ යුතු සමස්ත කාර්යය ඉටු කර ගැනීමට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එය අනුකූලව සැසඳිය හැකි ආකාරයට අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

අවුරුදු 06 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.1,308,699 ක ඇප බැඳුම්කරයකට යටත්ව 2005 වර්ෂයේදී ශිෂ්‍යත්වයකට විදේශගත වූ භූ විද්‍යාඥවරියක ශිෂ්‍යත්වයෙන් පසුව ගිවිසුම්ගත සේවා කාලය සම්පූර්ණ කිරීමට පෙර වෙනත් ආයතනයකට මුදාහැර තිබුණි. එම මුදාහැරීම සඳහා වර්ෂ 04 ක අනිවාර්ය සේවා කාලයකට සහ රු.435,600 ක ඇප බැඳුම්කරයකට අත්සන් කර තිබුණි. නිලධාරිනිය බැඳී තිබුණු ගිවිසුම 02 ට අනුකූලව කටයුතු කර නොතිබියදී 2011 වර්ෂයේ සිට මණ්ඩලයේ සේවයෙන් ස්ථිරවම මුදාහැර තිබුණද ගිවිසුම් ප්‍රකාරව මණ්ඩලයට අයවිය යුතු රු.1,744,299 ක ඇප මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | වත්කම් පවරා ගැනීමට කටයුතු නොකිරීම හා ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් | නිරවුල් කිරීමට ඵලදායී ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඇ) | පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම | සැලසුම්කළ පරිදි පර්යේෂණ අධ්‍යයන සිදු කිරීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | වත්කම් පාලනය | ජංගම නොවන වත්කම් ලේඛනගත කිරීමට කටයුතු නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

WRB/FD/AUD/2016 2017.08.08

විගණකාධිපතිතුමා
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක.306/92,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ජල සම්පත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක අයිර්එන්/ඒ/ඩබ්ආර්බී/1/17/11 හා 2017.08.03 දිනැති විගණන වාර්තාව හා බැඳේ.

එහි සඳහන් විගණන නිරීක්ෂණයන් සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් පහතින් ඉදිරිපත් කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.2 ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ශ්‍රී ලංකා යුධ හමුදාව නමින් පවතින ජීප් රථය මණ්ඩලයේ නමට පවරා ගැනීමට උත්සාහ කරමින් පවතී.

(ආ) මිලදී ගත් මුද්‍රණ යන්ත්‍ර දෙක පරිගණක උපාංග ගිණුමට ඇතුලත් කර 2017 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන අතර ක්ෂයවීම් ඌණතාවය වන්නේ රු.4,265.00 ක අගයකි. එම අගයද නිවැරදි කිරීමට කටයුතු කරමි.

2.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

(අ) ණයගැති ශේෂ ඉක්මනින් නිරවුල් කිරීමට අවධානය යොමු කර ඇත. නාගරික සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ ව්‍යාපෘති ගණුදෙනු තුලින් කරන ලද කාර්යයන් සඳහා ඉන්වොයිස් කරන ලද වටිනාකම් නිවැරදිව ගිණුම් පොත් වලට ගෙන ඇත.

(ආ) ප්‍රමාද වී ඇති සේවා කටයුතු ඉක්මනින් නිරවුල් කිරීමට අවධානය යොමු කර ඇත.

(ඇ) සේවා අත්තිකාරම් ශේෂ අදාල ගණුදෙනුකාර ආයතන වෙත යැවීමට කටයුතු කර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

ණයගැති සහ සේවා අත්තිකාරම් ශේෂ තහවුරු කිරීමේ ලිපි අදාල ගණුදෙනුකාර ආයතන වෙත යැවීමට කටයුතු කර තිබුණි.

2.2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

| | | |
|---|---|---|
| (අ) | 1964 අංක 29 දරණ ජල සම්පත් මණ්ඩල පනත | ජල සම්පත් මණ්ඩලයේ 1964 අංක 29 දරණ පනතේ 14.1 වගන්තිය යටතේ සඳහන් අන්තර් දෙපාර්තමේන්තු උපදේශක කමිටුව පිහිටුවීමට කටයුතු කල අතර, කමිටු සාමාජිකයින්ගේ ප්‍රථම රැස්වීම 2017.06.29 දින ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුනි. |
| (ආ) | 1978.12.19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | විද්‍යාත්මක උපකරණ ලේඛන විධිමත් කිරීමේ කටයුතු කර ගෙන යමින් පවතී. |
| (ඇ) | 2013 ජුනි 02 දිනැති අංක 12 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය | මේ සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, තොරතුරු විමසීම සඳහා එම දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇත. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යය සාධනය

(අ) අරමුණු ඉටුකර ගැනීම

පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහා 2017 මාර්තු මස 16 දිනැති අංක 2010/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින්ද ජල සම්පත් මණ්ඩලය වෙත බලය

පවරා ඇති අතර, අදාල සැලසුම් කිරීමේ කටයුතු මේ වන විට සිදු කර ගෙන යමින් පවතී.

(ඇ) භෞතික කාර්යය සාධනය

මෙහි දක්වා ඇති පර්යේෂණ අධ්‍යයනයන්ට අදාල සිතියම් සකස් කිරීමට අවශ්‍ය භූගත ජලයේ ගුණාත්මකතාවය පිළිබඳ රසායනික දත්ත විශ්ලේෂණය වර්ෂය අවසානයේදී සිදු කල යුතු වූ අතර මණ්ඩලයේ අත්‍යාවශය අනෙකුත් කාර්යයන් සඳහා දැනට සිටින සීමිත භූජල විද්‍යාඥ මහත්ම මහත්මීන් නිරත වූ බැවින්ද රසායනාගාර මඟින් සිදු කල යුතු වූ ජල සාම්පල විශ්ලේෂණ කටයුතු අධික වීම හේතු කොට ගෙන ද දක්වා ඇති භෞතික කාර්යය සාධනයෙහි විචලනයන් සිදුවිය. කෙසේ වුවද, අතපසු වූ දත්ත විශ්ලේෂණ කටයුතු අවසන් කොට එක් එක් පර්යේෂණ අධ්‍යනයන්හි අවසන් වාර්තා, එක්රැස් කරන ලද සියළුම භූජල විද්‍යාත්මක දත්තයන්, දත්ත විශ්ලේෂණ ප්‍රතිඵල සහ භූගත ජලය සංවර්ධනයන්ට අදාල නිර්දේශ සහිතව 2017 වර්ෂයේදී සකස් කොට ඉදිරිපත් කිරීමට කටයුතු යොදනු ලැබේ.

## 4.2 පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු

(අ) 2010 වසරේ සිට ආරම්භ කරන ලද ව්‍යාපෘති වලින් 05ක් 2016 වන දෙසැම්බර් 31 වන විට අවසන් කරන ලදී. අනෙකුත් ව්‍යාපෘති කටයුතු නියමිත පරිදි අවසන් කිරීමට නොහැකි වූයේ මණ්ඩලය වෙත පැවරුණු හදිසි ආපදා තත්වයන් යටතේ සිදු කලයුතු වූ අත්‍යාවශ්‍ය කාර්යයන් අධික වූ බැවිනි. අවසන් කරන ලද ව්‍යාපෘති වල දීර්ඝ කාලීන නිමාන කටයුතු 2017 වසරේ සිට ක්‍රියාත්මක කර ඇත.

(ආ) ඉදිරි ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ දී අදාල පර්යේෂණ අධ්‍යයනය සහා වගකීම දරණ නිලධාරීන්ගේ පූර්ව පර්යේෂණ පලපුරුද්ද, ඔවුන්ගේ අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් අධ්‍යයන යෝජනාවට ඇතුලත් කිරීමට ද පර්යේෂණ අධ්‍යයනයන් පර්යේෂණ කටයුත්ත හා සම්බන්ධ ප්‍රවීන හා පලපුරුදු පර්යේෂකයෙකුගේ අධීක්ෂණයකට ලක් කිරීමට කටයුතු යොදනු ලැබේ. කෙසේ වුවද, 2017 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී එක් එක් ව්‍යාපෘතිය පිළිබඳ වගකීම දරණ නිලධාරීන් පිළිබඳව සටහන් කිරීමට කටයුතු යොදන ලදී.

(ඇ) ජල සම්පත් මණ්ඩලයේ පර්යේෂණ අධ්‍යයනයන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පර්යේෂණ හා සංවර්ධන) සහ සහකාර සාමාන්‍යාධිකාරි (භූජල) යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබේ.

(ඈ) ඉදිරියේදී පර්යේෂණ අධ්‍යයන වල මූල්‍ය ප්‍රගතිය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය සියලු කටයුතු යොදන අතර එම අධ්‍යයනවල කාල ප්‍රමාදය අවම

කර ගැනිමට කටයුතු යොදනු ලැබේ. එමෙන්ම පර්යේෂණ අධ්‍යයන දීර්ඝ කිරීමේදී එයට හේතුව සහ ඇස්තමේන්තුවක් ඇතුලත් කිරීමට ද කටයුතු යොදනු ලැබේ.

4.3 <u>කලමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) පවතින අඩුපාඩු ඉදිරියේදී මඟ හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මණ්ඩලයේ නමට වාහන පවරා ගැනීම සඳහා අවධානය යොමු කර ඇත.

4.4 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

වාහන හා යන්ත්‍ර සඳහා යොදා ගැනෙන අමතර කොටස් හා උපාංග මෙම තොග අයිතම තුල ප්‍රමාණාත්මකව පවතින අතර, එම යන්ත්‍ර ඉතා පැරණි ඒවා වන හෙයින්ද වෙළඳපලේ නොමැතිකම යන කාරණාවන්ද සැලකිල්ලට ගෙන සෙමින් නිකුත් වන ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කල නොහැකි තත්වයක පවතී.

4.5 <u>විධිමත්ව පවරා නොගත් වත්කම්</u>

මෙම ඉඩම් මණ්ඩලයේ නමට පවරා ගැනීමට උත්සහ ගනිමින් පවතී. තවද දෛනික කටයුතු පවත්වා ගෙන යාම සඳහා එහි පවතින ගොඩනැගිලි වැඩිදියුණු කිරීමේ කටයුතු කිරීමට සිදුව තිබේ.

4.6 <u>විශ්‍රාම ප්‍රතිලාභ සඳහා අරමුදලක් ගොඩනැගීම</u>.

2016.12.31 දිනට පාරිතෝෂිත සඳහා වූ ඉතිරි කිරීම් රු. මිලි. 2.1 ක් වුවද 2017 වර්ෂයේ ඉවත්වන සේවකයන් වෙනුවෙන්ද මුදල් තැන්පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

දැනටමත් 2017 වර්ෂයේ ජුනි වන විට රු. මිලි. 10.7 ක මුදල් තැන්පත් කර ඇති අතර 2017.06.30 දින වන විට රු. මිලි. 5.6 ක ශේෂයක් පවත්වා ගෙන යනු ලැබේ.

4.7 <u>කාර්යය මණ්ඩල පරිපාලනය</u>

(අ) මේ සම්බන්ධයෙන් DMS/17/13/V/II හා 2015.11.15 දිනැති ලිපියෙන් අදාල සේවක මහතුන් 15 දෙනා පෞද්ගලික වන සේ තනතුරු අනුමත කර ඇත.

(ආ) මේ වන විට කම්කරු ශ්‍රේණි සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා ඇති අතර ඉදිරියේදී අනෙකුත් කාර්යක්ෂමතා කඩඉම් විභාගද පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

මේ වන විට මෙම තත්වය නිරාකරණය වී ඇති අතර ආයතනයේ කිසිවකුත් වෙනත් රාජ්‍ය ආයතන වල රාජකාරි කටයුතු කිරීම සඳහා යොදවා නැත.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

දැනට අනුමත කර ඇති කාර්යය මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා වෙනම කාර්යය මණ්ඩලයක් අනුමත කර නොමැති අතර, ඒ සඳහා ඉදිරියේදී අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

5.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

වාර්ෂික අයවැය හා ප්‍රසම්පාදනයන්හි ඇතිවන විචලනයන් හැකි තරම් දුරට අවම කර ගැනීමට ඉදිරියේදී අවධානය යොමු කරනු ලැබේ.

5.3 අයවැය ලේඛනමය පාලනය

(අ) 2016 වර්ෂයේදී දිවයිනේ නොයෙකුත් ප්‍රදේශ වල භූගත ජල අධ්‍යයන සිදු කිරීමට සැලසුම් කොට අයවැය ඇස්තමේන්තු සකස් කරන ලද අතර සමස්තයක් ලෙස සියළුම කාර්යයන් සඳහා රු. මිලියන 35.0 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී. මේ අනුව එක් එක් ව්‍යාපෘති සඳහා සකස් කල සැලසුම් වලට අනුකූලවම අදාල ක්‍රියාකාරකම් සිදු කිරීම අපහසු විය. තවද, මණ්ඩලය වෙත පැවරුණු හදිසි ආපදා තත්වයන් යටතේ සිදු කලයුතු වූ අත්‍යාවශ්‍ය කාර්යයන් අධික වූ බැවින් ද පර්යේෂණ අධ්‍යයනයන්හි ප්‍රගතියෙහි විචලනයන් ඇති විය. කෙසේ වුවද, මීට පෙර වර්ෂයන්හිදී පර්යේෂණ අධ්‍යනයන්හි සිදු වූ විගණනය විසින් පෙන්වා දෙන ලද බොහෝ අඩුපාඩු මඟ හරවා 2016 වර්ෂය තුලදී ඇස්තමේන්තු සහ සත්‍ය වියදම් අතර විචලනයන් හැකිතාක් දුරට අවම තත්වයක පවත්වා ගන්නා ලදි. ඉදිරි වර්ෂ වල සැලසුම් සකස් කිරීමේදී මේ පිළිබඳව තව දුරටත් සැලකිලිමත්ව අයවැය ලේඛනය වඩාත් ඵලදායී ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු යොදනු ලැබේ.

(ආ) වර්ෂය තුලදී වියළි කලාපය තුල වගා ළිං ඉදි කිරීමේ කටයුතු වෙනුවට මණ්ඩලය විසින් කුඩා ප්‍රමාණයේ ජල සම්පාදන ක්‍රම සහ නිෂ්පාදන නල ළිං ඉදි කිරීම සිදු කරන ලදී. ඒවාද වියළි කළාපයේ වගා ළිං ඉදි කිරීමේ කාර්යය හා බැඳී පවතින අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම වන රුපියල් මිලියන 10.0 යටතේ නිෂ්පාදිත නල ළිං ඉදිකිරීමට රු. මිලියන 9.851 ක මුදල වැය කරන ලදී.

5.4 <u>අයවැය ඇස්තමේන්තුව සහ ප්‍රසම්පාදන සැලැස්ම</u>

ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික අයවැය ඇස්තමේන්තු අතර පවත්නා විචලනයන් අවම කිරීමට අවධානය යොමු කර ඇත.

5.5 <u>නොවිසඳී ඇති විගණන ජේද</u>

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි අදාල හු විද්‍යාඥවරියගෙන් මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

## 6. <u>පද්ධති හා පාලන</u>

**7.** මේ යටතේ දක්වා ඇති අංශ කෙරෙහි වැඩියෙන් අවධානය යොමු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

**ඉංජි.ඒ.සී.එම්.සුල්ෆිකාර්**
සභාපති
ජල සම්පත් මණ්ඩලය

පිටපත : ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

# 2016 වර්ෂය තුල ජල සම්පත් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතියෙහි සාරාංශය

## 2016 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාවලිය

**මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය**



උතුර, උතුරු මැද, නැගෙනහිර, බටහිර පළාත් වල පවතින ජලය හිඟ භූමි (හෙක්ටයාර් 82000) සඳහා මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ජලය බෙදා හරින තෙක් භූගත ජලය ලබාදීම සඳහා නල ළිං ඉදි කිරීම මෙහි මූලික අරමුණ විය. ඉදි කිරීම් 13 ක්ද අත් පොම්ප ළිං වැඩසටහන් යටතේ,

| | | |
|---|---|---|
| භූ භෞතික සමීක්ෂණ | - | 26 |
| නල ළිං ඉදි කිරම් | - | 26 |
| අත් පොම්ප ඉදි කිරීම් | - | 30 |
| ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍ර සවි කරීම් (යකඩ ඉවත් කිරීමේ) | - | 11 සිදු කෙරිනි. |

ඒ අනුව 2016 වර්ෂයේ මොරගහකන්ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු. 13,735,077.19 විය.

## බස්නාහිර පළාත තුල වාණිජ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

| ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|
| භූ ජල විද්‍යාත්මක සමීක්ෂණ | 72 |
| නල ළිං ඉදිකිරීම | 8 |
| ජල ධාරිතා පරීක්ෂණ | 23 |
| නල ළිං සුද්ද කිරීම | 18 |
| ජල රසායණික විශ්ලේෂණය | 77 |
| ජලයේ ක්ෂුද්‍රජීවී පරීක්ෂාව | 19 |

**උතුරු පළාත තුල වාණිජ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය**

- භාන්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති

  1.යාපනය ළිං නිමානය කිරීමේ ව්‍යාපෘතිය

  2.ජල සම්පත් මණ්ඩලයේ උතුරු පලාත් කාර්යාලය හා විද්‍යාගාරය අලුත්වැඩියා කිරීම





*යාපනය කාර්යාලය විවෘත කිරීම ව්‍යාපෘති ප්‍රගතිය*

## (a) වේළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් නියමු කලාප 7 සඳහා බලපා ඇති තර්ජනයන් හා භූගත ජල සම්පත් වලට සිදුවී ඇති බලපෑම් හඳුනාගැනීමට සවිස්තරාත්මක අධ්‍යනයක් හා භූගත ජල නියාමන ජාලය ස්ථාපිත කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරුණි. ඒ අනුව 2016 සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකරකම් | ප්‍රගතිය | විශේෂ කරුණු |
|---|---|---|---|
| 1 | යාපනය අර්ධද්විපයේ පිහිටුවන ලද භූගත ජල පරීක්ෂණ | 102 | වියලි කාලය - කාලය සමග ජලයේ ගුනාත්මක විචලනය වන ආකාරය හදුනා ගැනීම සඳහා සිතියම් පිලියෙල කාරීම. |
| 2 | | 102 | තෙත් කාලය - කාලය සමග ජලයේ ගුනාත්මක විචලනය වන ආකාරය හදුනා ගැනීම සඳහා සිතියම් පිලියෙල කාරීම. |
| 3 | ජල ධාරිතා පරීක්ෂණ | 05 | ජලධර ලක්ෂණ හදුනා ගැනීමේ පරීක්ෂණ. |
| 4 | මුහුදු මට්ටමේ සිට උස නිර්ණය කිරීම | 32 | භූගත ජල ගැලීම් රටාව නිරීක්ෂනය කිරීම. |

## (b) භාණ්ඩාගාර හා අමාත්‍යාංශ ප්‍රතිපාදන ව්‍යාපෘති

01. යාපනය ළිං නියාමනය කිරීමේ ව්‍යාපෘතිය
02. වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි සිදු කරන ලද භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය
03.

| SN | ක්‍රියාකාරකම් | ප්‍රගතිය | විශේෂ කරුණු |
|---|---|---|---|
| 1 | ජලයේ ගුණාත්මකභාවය නිමානය සඳහා යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත කරන ලද ස්ථාන | 162 | පෙර මෝසම් |
| 2 | | 162 | පසු මෝසම් |
| 3 | | 162 | ජූනි |
| 4 | | 162 | මාර්තු |
| 5 | භූ භෞතික සමීක්ෂණ | 20 | ජලධර සඳහා භූජල විද්‍යාත්මක නිර්නය |
| 6 | පරීක්ෂන නල ළිං විදීම | 16 | ජලධර සඳහා භූජල විද්‍යාත්මක නිර්නය |
| 7 | ජල ධාරිතා පරීක්ෂන | 15 | ජලධරවල තත්වය පරීක්ෂාව |
| 8 | ළිං වල මුහුදු මට්ටමේ සිට ජල මට්ටම පරීක්ෂාව. | 12 | ජල ගැලීම් රටාව නිරීක්ෂණය. |

**කිලිනොච්චි දිස්ත්‍රික්කයේ භූජල විද්‍යාත්මක අධ්‍යයනය**

රසායනික විශ්ලේෂණය සඳහා 2016 වියළි කාලයේදී සාම්පල් 25 බැගින් එකතු කරන ලදී.

**චුන්නාකම් ප්‍රදේශයේ භූ ගත ජල දූෂණය නිර්ණය**

චුන්නාකම් ජල ධරයට සිදුවී තෙල් කාන්දුවීම හේතුවෙන් මුසු වූ ජල අපවිත්‍රකාරක මූලාශ්‍ර හා අපවිත්‍රක වර්ග හඳුනා ගැනීම හා ජල දූෂක අවම කිරීමට ගතහැක ක්‍රියමාර්ග හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.




*The constructed tube well and dug well locations utilized for the water quality assessment*

**a.) වාණිජමය ක්‍රියාකාරකම්**

**1.) යාපනය නගරයේ පොකුනු පුනරුත්තාපනය සඳහා උපදේශනය සේවාව.**

මෙම අධ්‍යනය යාපනය නගර සභා සීමාව තුළ ඇති පොකුණු 43 ක් සඳහා සිදු කළ අතර එහි ප්‍රධානම අරමුණ වූයේ තැන්පත් වූ රොන් මඩ ස්ථරයේ ඝනකම පරීක්ෂා කිරීම හා අභ්‍යන්තර පාංශු ස්ථර පරීක්ෂා කර තැන්පත් වූ ස්ථරය ඉවත් කිරීම හා ඉවත්කල යුතු ආරක්ෂිත ගැඹුර නිර්නය කිරීම වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ යාපනය කලාප කාර්යාලයේ පහත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක විය.

| | ක්‍රියාකාරකම | ප්‍රගතිය | විශේෂ කරුනු |
|---|---|---|---|
| 1 | ඉදිකරන ලද නළ ළිං සඳහා ජලයේ ගුණාත්මකභාවය නිර්ණය කිරීම. | 35 | රසායනික පරාමිතීන් විශ්ලේෂණය |
| 2 | භූ භෞතික සමීක්ෂණය (1D & 2D) | 35 | නියාමන මිනිවිදුම් ඉදිකිරීමට ස්ථාන හඳුනා ගැනීම සඳහා ජලධර පරීක්ෂාව |
| 3 | පොම්ප පරීක්ෂණය | 10 | ජලධරවල ලක්ෂණ පරීක්ෂාව |
| 4 | ළිංවල මුහුදු මට්ටමේ සිට ඇති ජල මට්ටම මැනීම | 26 | මුහුදුමට්ටමේ සිට ඇති උස හා භූගත ජල රටාව පරීක්ෂාව |
| 5 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනාවැකි අනුව භූ තාක්ෂනික සමීක්ෂනය | 40 | රොන් මඩ ස්ථරයේ ගැඹුර නිර්ණය කිරීම හා රොන්මඩ ඉවත් කිරීමෙ මට්ටම නිර්දේශ කිරීම |
| 6 | වාර්ථා පිළියෙල කිරීම | | රොන්මඩ ස්ථරයේ ඝණකම සම්බන්ධවවාර්ථාවට ඇතුළත් කිරීම සඳහා |








උතුරු මැද පළාත

(a) **භාණ්ඩාගාර ප්‍රතිපාදන ව්‍යාපෘති**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ දීර්ඝ කාලීන භූගත ජල නිමානය කිරීම හා ජලය නිසා ඇතවන සෞඛ්‍ය ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජල සායන පැවැත්වීමේ ව්‍යාපෘතය යටතේ සිදුකල ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම්/විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ගත ජල නිමානය හා ජල සාම්පල් එකතු කිරීම | 200 |
| 02 | ජල රසායනික විශ්ලේෂණය | 200 |
| 03 | ජල සායන හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 7 |
| 04 | දත්ත විශ්ලේෂණය හා සටහන් කිරීම | |

**(b) වව්නියා - කිලිනොච්චි ව්‍යාපෘතිය**

මෙම ප්‍රදේශය කෘෂිකර්මාන්ත කටයුතු සඳහා භූගත ජල විභව සහිත ප්‍රදේශ හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකෙරිණි.

| අංකය | ක්‍රියාකාරකම/විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ජල විද්‍යාත්මක සමීක්ෂණය | 20 |
| 02 | පරීක්ෂණ මිහිවිදුම් | 20 |
| 03 | පොම්ප පරීක්ෂණ සිදු කිරීම | 10 |
| 04 | ළිං වල මුහුදු මට්ටමේ සිට ජල මට්ටම පරීක්ෂාව | 16 |
| 05 | ජල සාම්පල එකතු කිරීම හා ළිං නියාමනය | 122 |
| 06 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 122 |
| 07 | දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම | |

**පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල වකුගඩු රෝග සුලභ ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අධ්‍යනය.**

පොළොන්නරුව, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල වකුගඩු රෝග සුලභ ප්‍රදේශ වල ජලයේ ගුණාත්මකභාවයේ පැතිරීම හඳුනා ගැනීම වන අතර, එහිදී සිදුකල ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම/විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | භූ ජල සමීක්ෂණ | 06 |
| 02 | පරීක්ෂන නල ළිං ඉදි කිරීම | 05 |
| 03 | අත් පොම්ප සවි කිරීම | 03 |
| 04 | ජල සායන හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 04 |
| 05 | දත්ත විශ්ලේෂණය හා වාර්ථා තැබීම | |



**වයඹ පලාත**

2016 වර්ෂය තුල රජයේ හා පෞද්ගලික අංශ විසින් සිදුකල භූ ජල විද්‍යාත්මක ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| | |
|---|---|
| භූගත ජල පරීක්ෂණ | 79 |
| නල ළිං විදීම් | 79 |
| පොම්ප පරීක්ෂණ | 17 |
| ළිං පිරිසිදු කිරීම් | 08 |
| ජල සාම්පල විශ්ලේෂණය | 379 |



භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ හුණුගල් ආශ්‍රිත ජලධර සඳහා භූජල සමීක්ෂණ 15, පරීක්ෂණ ළිං ඉසීම් 15 ක් හා පොම්ප පරීක්ෂණ 20 සිදු කෙරිණි. රැස්කල ජල සාම්පල 200ක් අතරින් 164 ක් පූර්ණ රසායනික විශ්ලේශණය කල

අතර 127ක් අර්ධ වශයෙන් රසායනික විෂ්ලේශණය  සිදු කරන ලදි. මුන්දලම, පුත්තලම හා කල්පිටිය ප්‍රාදේශිය ලේඛම් කොට්ඨාශවලින් රැස්කරගත් ජල සාම්පල 112 න් 56 ක් රසායනික විශ්ලේෂණය කරන ලදී. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කලාපය තුල රැස්කරගත් ජල සාම්පල 120 ක්ද මහව ප්‍රාදේශීය ලේකම් කලාපයෙන් ජල සාම්පල 120 ක් රැස්කල අතර එයින් 100 ක් පූර්ණ රසායනික වශ්ලේෂණය කරන ලදී. තවද එම ප්‍රදේශ වල ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**මොණරාගල දිස්ත්‍රික්කය**

නල ළිං ඉදිකිරීම් 11 ක් හා අත් පොම්ප සවි කිරිම් සිදු කරන ලදී. ලබාගත් ජල සාම්පල රසායනික හා භෞතික පරාමිතීන් විශ්ලේෂණය කරන ලදී. තවද පැරණි නල ළිං පිරිසිදු කිරීම් සහ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.

විගණකාධිපතිවරයාගේ විගණන විමසුම හා විගණන වාර්ථාවල පෙන්වා දී ඇති ගිණුම්කරණ හා කළමනාකරණ දුර්වලතා නිවැරදි කිරීම පිණිස ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග.

i. පර්යේෂන අධ්‍යානයන්හි පවතින අඩුපාඩු ක්‍රමිකව අඩුකර ගැනීමට කටයුතු සලස්වා ඇත.

ii. කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි අනුමත වෘතීය දීමනාව 2017 වර්ෂයේ වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

iii. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර නිසි පරිදි ක්ෂය කිරීමට කටයුතු කර ඇත.

iv. උපදේශක කමිටුව සඳහා අදාල ආයතන වල නියෝජිතයින් සමග 2018 වර්ෂය වන විට රැස්වීම් වාර දෙකක් පවත්වන්නට යෙදුනි.

v. භාන්ඩ සමීක්ෂන වාර්තා මගින් අනවශ්‍ය තොග හඳුනාගැනීම සිදුකර ඇති අතර ඒවා අපහරනය කිරීමේ කටයුතු ක්‍රියාවලිය ආරම්භ කර තිබේ.

vi. විගණනයෙන් පෙන්වා ඇති ගිණුම්කරණ වෙනස්කම් ජනල් සටහන් මාර්ගයෙන් නිවැරදි කරීමට කටයුතු කර ඇත.

vii. වාහන වල අයිතිය මණ්ඩලයේ නමට පවරා ගැනීමේ කටයුතු සිදුකර ඇත.

# ජල සම්පත් මණ්ඩලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග

ජල සම්පත් මණ්ඩලය දැනට ශ්‍රී ලංකාවේ ජල සම්පත් සම්බන්ධයෙන් අධ්‍යයන කටයුතුවල නිරත වේ. 2016 වසර සඳහා ප්‍රධාන වශයෙන් අධ්‍යයන ව්‍යාපෘති 14ක් ක්‍රියාත්මක කරන ලද අතර මණ්ඩලයේ කටයුතු වල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියා මාර්ග ගෙන ඇත.

01. අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය (ප්‍රධාන වශයෙන් භූජල විද්‍යාඥයින්, රසඥවරුන් සහ තාක්ෂණික නිලධාරින්) බඳවා ගැනීම.

02. කාර්ය මණ්ඩලයට අවශ්‍ය කළමනාකරණ සහ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා පුහුණුවීම් ලබා දීම.

03. මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය සම්පාදනය කිරීම

04. මණ්ඩලයේ සියලුම අංශ වල ප්‍රගතිය සති පතා පරීක්ෂා කිරීම.

05. ස්ථාවර වත්කම් කළමනාකරණය සහ පාලනය වඩාත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මෘදුකාංග යොදා ගැනීම තව දුරටත් ක්‍රියාත්මක කිරීම.

06. භූගත ජල සම්පත් කළමනාකරණය කිරිම සහා අදාල රෙගුලාසි පැනවීමට පියවර ගැනීම.

07. ජල සම්පත් මණ්ඩලය සඳහා නීති අංශයක් ඇති කිරීම තුලින් භූගත ජලයට අදාල රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී පැන නගින නීතිමය ගැටළු සම්බන්ධව කටයුතු කිරීමට හැකි වාතාවරණයක් ඇති කිරීම

08. මණ්ඩලයේ සියලු කටයුතු පිළිබඳව පසු විපරම් කිරීම.



**2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.**
2A, ஹெக்டர் கொப்பேகடுவ அவென்யூ,  கொழும்பு 07.
2A, Hector Kobbakaduwa Avenue, Colombo 07.